# නව පිවිසුම

BY NC ND

ව්‍යවහාරික ශාස්ත්‍රීය සංග්‍රහය

ISSN 2961-5003 (Print) | ISSN 3121-3472 (e-Version)
3 වෙළුම, ii වන නිකුතුව - 2025 ජූලි-දෙසැම්බර්










ප්‍රකාශනය

ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

**ව්‍යවහාරික ශාස්ත්‍රීය සංග්‍රහය**
ISSN 2961-5003 (Print) | ISSN 3121-3472 (e-Version)

**3 වෙළුම, ii වන නිකුතුව - 2025 ජූලි-දෙසැම්බර්**

---

**ප්‍රකාශනය**

ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල, මහනුවර
+94 81 249 8679
+94 81 249 8680
+94 81 250 0378
Fax: +94 81 249 9741
nicd@sltnet.lk

**Technical Specifications**

Fonts:
Abhaya Libre (Unicode)
Noto Serif Sinhala (Unicode)
Page Size: A4 - 8.27 x 11.67 inches
Format: Portable Document Format (PDF)
Full Journal access https://www.nicd.edu.lk/

***Submit your papers to*** prabath.nicdstaff@gmail.com

මෙම ප්‍රකාශනයේ ඇතුළත් අන්තර්ගතයන් තුළ එන අදහස්, දත්ත හා අනෙකුත් සියලුම දෑ ඔස්සේ පිළිබිඹු වන්නේ එම කතුවරුන්ගේ අදහස් මිස ආයතනයේ අදහස් නොවන බව කාරුණිකව සලකන්න.

**ව්‍යවහාරික ශාස්ත්‍රීය සංග්‍රහය**

ISSN 2961-5003 (Print) | ISSN 3121-3472 (e-ISSN)

ISSN 2961-5003 ISSN 3121-3472

**3 වෙළුම, ii වන නිකුතුව - 2025 ජූලි-දෙසැම්බර්**

---

## සම-විධායක සංස්කරකවරු (Co-executive editors)

වී.පී.කේ. පිලපිටිය (අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

පී. සක්තියවේලු (අධ්‍යක්ෂ - අධ්‍යයන හා සංවර්ධන, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

## සම-ප්‍රධාන සංස්කාරකවරු (Co-editors-in-chief)

ධම්මික වීරකෝන් (ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපති, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

ප්‍රභාත් ගලගමගේ (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

## සංස්කාරක මණ්ඩලය (Editorial board)

නන්දන බණ්ඩාර හපුආරච්චි (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - වැ.බ)

එච්.වී.අයි.එන් නානායක්කාර (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - වැ.බ)

කුමුදු කුසුම් පී.ආර්. රත්නසිරි (සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

ආර්.සී.පී. රණසිංහ (සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

ඩබ්ලිව්.ඩී.සී.පී. අමසේකර (සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

එස්.කේ. වෙදගෙදර (සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

ආර්.එම්.එන්.එස්. දිසානායක (සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

ආර්.කේ.ආර්.එන්. මදුෂානි (සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

## සම්බන්ධීකරණ සංස්කාරක (Coordinating Editor)

ඒ.එම්.එල්. අත්තනායක (පුස්තකාලයාධිපති, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය)

## භාෂා සංස්කරණය

නාලක ජයසේන (බාහිර කථිකාචාර්ය, වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය)

**කවරයේ ඡායාරූප**

**කළු-සුදු ඡායාරූපය:** ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ටී.බී. ඉලංගරත්න පුස්තකාලය සතු ඡායාරූප එකතුවෙනි

**වර්ණ ඡායාරූප:** සීමාසහිත පොල් ත්‍රිකෝණයේ කිරි නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති සංගමයේ කර්මාන්තශාලා පරිශ්‍රයෙනි

# පටුන


**ප්‍රජාව සවිබල ගැන්වීම: නාගරික නිවාස අර්බුද තුළ නිවාස සමුපකාරයේ කාර්යභාරය ........................................................................ 7**

**ලංකාවේ වර්තමාන ආර්ථික අර්බුදය, සමුපකාරය හා සහයෝගිතා අර්ථ ක්‍රමය.... 23**

**ඉන්දියාවේ පූනේ හි ස්වාච් (SWaCH) කසළ එක්රැස්කිරීමේ සමුපකාර සමිතිය: ප්‍රජා සවිබලගැන්වීම පිළිබඳ ප්‍රබල අත්දැකීමක් ලෙස හා එකී අත්දැකීම් ශ්‍රී ලාංකේය සංදර්භයට ගලපා ගැනීම ........................................................ 28**

**ත්‍රෛස්ථර ආකෘතියක කෘෂි සමුපකාර ව්‍යාපාරයක් පිළිබඳ සංකල්ප පත්‍රිකාව...... 38**

**මොන්ඩ්‍රැගොන් හා එමිලියා රොමාග්නා: සාර්ථක සමුපකාර මාදිලි ද්විත්වයක් ලෙස ...................................................... 44**

**තරඟකාරීත්වය හා සමුපකාරය ........................................................................ 52**

**සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියේ ආයතනික අරමුණු (objectives) සාක්ෂාත්කරණයේදී මුහුණ දෙන බාහිර පාරිසරික ව්‍යාපාර අභියෝග හා එකී අභියෝග සමඟ කටයුතු කිරීමට අදාළ උපාය මාර්ග (strategies) විශ්ලේෂණය ........................................................................ 69**

**සහයෝගීතා අර්ථ ක්‍රමය ........................................................................ 87**

**ව්‍යවහාරික ශාස්ත්‍රීය සංග්‍රහය**

ISSN 2961-5003 (Print) | ISSN 3121-3472 (e-Version)

**3 වෙළුම, ii වන නිකුතුව - 2025 ජූලි-දෙසැම්බර්**

## සංස්කාරක සටහන

*නව පිවිසුම*, දශක දෙකකට පමණ පෙර ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ආරම්භ කර ප්‍රකාශයට පත්කර පැවති *පිවිසුම* සඟරාව නැවත ප්‍රකාශයට පත් කිරීමකි. කෙසේ නමුත් මෙම කලාපයේ සිට *නව පිවිසුම* සඟරාව සමුපකාර ව්‍යවහාරිකයන්ගේ සඟරාවක් (Journal of Co-operative Practitioners) ලෙස ප්‍රකාශයට පත්කෙරෙනු ඇත. මේ අනුව පිවිසුම සඟරාව සමුපකාර ව්‍යාපාරයේ ව්‍යවහාරික කාරණා වලට වැඩි ඉඩක් ලබා දෙමින් ශාස්ත්‍රීය හා අර්ධ ශාස්ත්‍රීය පත්‍රිකා, සංකල්ප පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, පූර්ව මුද්‍රණ පත්‍රිකා (preprint), කළමනාකරණ අත්දැකීම්, සාර්ථකත්ව අත්දැකීම් පමණක් නොව අසාර්ථකත්ව අත්දැකීම්ද බෙදා හදා ගැනීම්, සාහිත්‍යය විමර්ශන, ග්‍රන්ථ විචේචන, ඡායාරූප ආඛ්‍යාන (photo narratives) හා සමුපකාර ව්‍යාපාරයට ඍජුව සම්බන්ධ නොවුනත් සඟරාවේ ගුණාත්මක බව හා කියවීමේ ධාරිතාව වැඩි කිරීමට සාහිත්‍ය හා කලා ක්ෂේත්‍රයටද කුඩා ඉඩක් වෙන්කිරීමක් ආදී ලෙස වන පුළුල් පරාසයක පත්‍රිකාවන්ට හා රචනාවන්ට ඉඩකඩ සලසා දෙනු ඇත.

මෙම කලාපයේ සිට සඟරාවේ සංස්කාරක මණ්ඩලය පුළුල් කර ඇති අතර, මේ අනුව පුළුල් සංස්කාරක මණ්ඩලයක් මගින් විමර්ශනයට භාජනය වන වඩා විධිමත් සඟරාවක් ලෙස මෙය ප්‍රකාශයට පත්වනු ඇත. ඒ අනුව ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ප්‍රකාශයට පත්කරන විමර්ශිත සඟරාවලට විකල්ප මාදිලියක් ලෙසද මෙය හැඳින ගත හැකිය. මෙම වාරික ප්‍රකාශනය “publish then review" ආකෘතියේ පත්‍රිකා සඳහා ද (preprint) ඉඩකඩ ලබාදෙනු ඇත. මේ අනුව සංස්කරණ මණ්ඩල විමර්ශන ක්‍රියාවලියක් ඔස්සේ පමණක් පළවන මෙම පත්‍රිකා සඳහා ලැබෙන ශාස්ත්‍රාලීය හා ව්‍යවහාරික තලයේ ප්‍රතිපෝෂණයන් මත තම පත්‍රිකාවේ සංශෝධන හා වැඩිදියුණු කිරීම් සිදුකරමින් විමර්ශිත සඟරාවලට ඉදිරිපත් කිරීමේ හැකියාවද කතුවරුන්ට ලැබෙනු ඇත. මෙය බොහෝ නූතන විමර්ශිත ශාස්ත්‍රීය සඟරාවල ප්‍රකාශන ආකෘතිය බවට පත්වෙමින් ද පවතින බවත් මතක් කළ යුතු වෙයි.

මේ අනුව ව්‍යවහාරික බහු ශික්ෂිත විෂය ක්ෂේත්‍රයක් වන සමුපකාර අධ්‍යයනයට අදාළව වඩා පුළුල් ලේඛක පිරිසකට හා පාඨක පිරිසකට ප්‍රවේශවීමේ අවස්ථාව හා විශේෂයෙන්ම වෘත්තියමය හා ස්වේච්ඡා පදනම මත යන ආකෘති ද්විත්වයෙන්ම ව්‍යාපාරයට මැදිහත්වන පිරිසට සිය මතවාද, අදහස්, සංකල්ප, නව ආකෘති ඉදිරිපත් කිරීමේ නිදහස් අවකාශයක් බවට මෙම සඟරාව පත්කිරීම සඳහා සම්ප්‍රදායික දෘඪ ශාස්ත්‍රීය ගතිලක්ෂණ විකරණයකට ලක්කරමින් ඉතා නූතන සඟරා ආකෘතියක් අනුගමනය කිරීමට *නව පිවිසුම* ක්‍රියා කරනු ඇත.

නව පිවිසුම

**ව්‍යවහාරික ශාස්ත්‍රීය සංග්‍රහය**

ISSN 2961-5003 (Print) | ISSN 3121-3472 (e-Version)

**3 වෙළුම, ii වන නිකුතුව - 2025 ජූලි-දෙසැම්බර්**

පත්‍රිකා අංක 01

# ප්‍රජාව සවිබල ගැන්වීම: නාගරික නිවාස අර්බුද තුළ නිවාස සමුපකාරයේ කාර්යභාරය[1]

https://doi.org/10.3389/frsc.2025.1519100

සමිකායා ග්ලැඩ්වෙල් ගෝට්[2]

විල්සන් මජී[3]

**සාරසංක්ෂේපය**

දකුණු අප්‍රිකාවේ නාගරික නිවාස හිඟයට සහ සමාජ-ආර්ථික ගැටලුවලට සාර්ථක විසඳුමක් ලෙස නිවාස සමුපකාර සමිති (Housing Cooperatives) හඳුනාගත හැකිය. විද්‍යාත්මක මූලාශ්‍ර 85ක් ඇසුරින් කළ මෙම අධ්‍යයනයට අනුව, නිවාස සමුපකාර මගින් අඩු පිරිවැය නිවාස ලබා දීමට අමතරව, ප්‍රජා බලගැන්වීම සහ සමාජ සහයෝගීතාව වර්ධනය කළ හැකි බව තහවුරු වී ඇත. තිරසාර ලෙස ක්‍රියාත්මක කරන්නේ නම්, මෙම ක්‍රමය හරහා නාගරික ප්‍රජාවන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවා සාධාරණ නාගරික සංවර්ධනයක් ළඟා කරගත හැකිය. එබැවින්, නාගරික නිවාස ප්‍රතිපත්ති සම්පාදනයේදී නිවාස සමුපකාර ක්‍රමය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලෙස මෙමගින් යෝජනා කෙරේ.

[1] Frontiers in Sustainable Cities ජර්නලයේ ක්‍රියේටිව් කොමන්ස් බලපත්‍රය යටතේ පළවූ Zamikhaya Gladwell Gotyi හා Wilson Majee Wilson Majee විසින් රචිත Empowering communities: the role of housing cooperatives in alleviating urban housing crisis (07 April 2025) පත්‍රිකාවේ සිංහල අනුවර්තනය (**අනුවර්තනය:** මොරටුව විශ්වවිද්‍යාලයේ ගෘහ නිර්මාණ පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය **සිතුමිණ රත්නමලල** සහ ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය **ප්‍රභාත් ගලගමගේ** විසිනි)

[2] රාජ්‍ය පරිපාලන හා ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව, මැන්ගෝසුතු තාක්ෂණ විශ්වවිද්‍යාලය, ඩර්බන්, දකුණු අප්‍රිකාව.

[3] සෞඛ්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව, මිසූරි විශ්වවිද්‍යාලය, කොලොම්බියා, මිසූරි, එක්සත් ජනපදය.

**මූල පද:** නිවාස සමුපකාර, නිවාස හිඟය, ප්‍රජා බලගැන්වීම, සමාජ ඒකාබද්ධතාවය, මධ්‍යම නගර (Inner Cities), දකුණු අප්‍රිකාව

## 1. හැඳින්වීම

දකුණු අප්‍රිකාවේ ප්‍රධාන නගර, ඒවායේ සිදුවෙමින් පවතින අධිනාගරීකරණය හේතුවෙන් උග්‍ර නිවාස හිඟයකට මුහුණ දෙමින් සිටියි. පසුගිය දශක ත්‍රිත්වය තුළ, රජය මෙම අර්බුදයට ඇමතීමට විවිධ උපාය මාර්ග ගවේෂණය කර ඇතත්, නිවාස සඳහා ඇති ඉල්ලුම සැපයුම ඉක්මවා යමින් පවතියි. වඩා හොඳ අවස්ථා අපේක්ෂා කරන ග්‍රාමීය ප්‍රදේශවලින් සහ අසල්වැසි රටවලින් පැමිණෙන පුද්ගලයින් නාගරික ප්‍රදේශ වලට ආකර්ෂණය වෙයි (Adigeh and Abebe, 2024). මේ අනුව දැරිය හැකි නිවාසවල පවතින දැඩි හිඟයට ආමන්ත්‍රණය කරන අතරම ප්‍රජා සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කරන නව්‍ය හා අන්තර්ග්‍රහණීත ප්‍රවේශයන්ගේ (innovative and inclusive approaches) දැවෙන අවශ්‍යතාවයක් ඇත. මේ සඳහා වන එක් බලාපොරොත්තු සහගත විසඳුමක් වන්නේ නිවාස සමුපකාර යි. සමුපකාරයක් යනු හවුල් හා ප්‍රජාතන්ත්‍රික හිමිකාරත්වයක් සහිත ව්‍යවසායයක් නිර්මාණය කර පවත්වාගෙන යාම ඔස්සේ, ඔවුන්ගේ ආයෝජන සහ රඳවාගත් ඉපැයීම් මගින් අරමුදල් සපයා, ඒ අනුව ඔවුන්ගේ දායකත්වයන් මත පදනම්ව එහි සාමාජිකයින්ට ප්‍රතිලාභ බෙදා හැරීම මගින් විසඳිය හැකි යැයි ඔවුන් විශ්වාස කරන පොදු ආර්ථික, සමාජ හෝ සංස්කෘතික අවශ්‍යතාවක් බෙදා හදා ගන්නා පුද්ගලයින් සමූහයකි. මෙම ආකෘතිය සමාජීය හා ආර්ථික වශයෙන් පහළ පසුබිම්වලින් පැමිණෙන පුද්ගලයින් ඔවුන්ගේ අභියෝග සාමූහිකව හඳුනා ගැනීමට සහ විසඳුම් නිර්මාණයට අක්ෂගත කරයි (Huron, 2015). නිවාස සමුපකාර ක්ෂණික නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා විකල්ප ආකෘතියක් සපයනවා පමණක් නොව, ප්‍රජා සවිබල ගැන්වීම සහ සමාජ සහජීවනය ද පෝෂණය කරයි (Del Rio, 2022). දැරිය හැකි සහ තිරසාර නිවාස විසඳුම් ලබා දීමෙන්, සමුපකාරවලට ප්‍රජා හිමිකාරිත්වය සහ සහභාගීත්වය පිළිබඳ හැඟීමක් වැඩිදියුණු කළ හැකි අතර (Sanchez-Bajo, 2022), නිවාස ලාභීන්ට සිය නිවාස සම්බන්ධ කටයුතු සම්බන්ධ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සහ කළමනාකරණයක් ලැබීමද සහතික කළ හැකිය (Heath, 2022). බොහෝ රටවල මධ්‍යම හා අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස සැපයීමට නිවාස සමුපකාර ආකෘතිය ඵලදායීතාවය ඔප්පු වී ඇත (Adegun and Olusoga, 2019; Oyalowo, 2020).

විවිධ ශික්ෂණ ක්ෂේත්‍ර ඔස්සේ සමුපකාර ව්‍යාපාරය පිළිබඳව බොහෝ දේ ලියැවී තිබුණද, සමුපකාර ව්‍යාපාරය තුළ ශික්ෂණ-විශේෂිත ක්‍රමානුකූල සමාලෝචන (discipline-specific systematic reviews) පවතින්නේ සීමිතවයි. ඊට ප්‍රතිචාරයක් ලෙස නාගරික නිවාස හිඟය අවම කිරීමේදී සහ ප්‍රජා සවිබල ගැන්වීම මෙන්ම සමාජ-ආර්ථික අන්තර්ග්‍රහණය (socio-economic inclusivity) ප්‍රවර්ධනය කිරීමේදී නිවාස සමුපකාරවල ඓතිහාසික සන්දර්භය, ව්‍යුහාත්මක සහ මෙහෙයුම් යාන්ත්‍රණ මෙන්ම ඒවායේ පරිවර්තනීය විභවය ගවේෂණය කිරීම සඳහා අපි නිවාස සමුපකාර කෙරෙහි අවධානය යොමු කළ ක්‍රමානුකූල සමාලෝචනයක් සිදු කළෙමු. ක්‍රමානුකූල සමාලෝචන මගින් යමක් ගැන දන්නා දේ සහ

නොදන්නා දේ පැහැදිලි කරමින් එම විෂය පිළිබඳ අවබෝධය සැලකිය යුතු ලෙස වැඩි කළ හැකිය (Owens, 2021). ඒවා බොහෝ විට තනි අධ්‍යයනයකට වඩා ගැඹුරු අන්තර්ඥානයක් ලබා දෙන අතර සම්පත් වෙන් කිරීම වැනි තීරණාත්මක කාරණා අරඹයාදා යොදාගත හැකිය (Uttley et al., 2023).

**2. ක්‍රමවේදය**

අපගේ විධිමත් විමර්ශනයේදී (systematic review) housing cooperative, history, policy, developing world, sustainability, community empowerment, social capital, සහ South Africa වැනි මුඛ්‍ය පද භාවිත කරමින් Sabinet සහ Science Direct යන දත්ත සමුදාය දිවිත්වයෙහි සෙවීම් සිදු කළෙමු. මෙම දත්ත සමුදායන්ගෙන් රැස් කරන ලද දත්තවලට අතිරේකව, අපි Google Scholar ද භාවිතා කළ අතර, හඳුනාගත් ලිපිවල ග්‍රන්ථ නාමාවලි (bibliographies) ශ්‍රමායිකව සමාලෝචනය (manually reviewed) කළෙමු. ඉංග්‍රීසි බසින් ප්‍රකාශිත ප්‍රාථමික පර්යේෂණ අධ්‍යයනයන් පමණක් ඇතුළත් කරන ලද මෙම අධ්‍යයනයේදී වාර්තා 211 ක් හඳුනා ගත් අතර, විමර්ශනයට ඇතුළත් කිරගැනීමේ නිර්ණායක සපුරාලූයේ ඉන් 85 ක් පමණි (රූප සටහන් අංක 1).




**රූප සටහන් අංක 1:** දකුණු අප්‍රිකාවේ නිවාස සමුපකාර - PRISMA ප්‍රවාහ සටහන.

## 3. සොයාගැනීම්

### *3.1 දකුණු අප්‍රිකාවේ නිවාස සමුපකාරවල ඉතිහාසය*

දකුණු අප්‍රිකාවේ සමුපකාර ව්‍යාපාරය 1831 දක්වා දිව යන අතර, ඒවා සුදු ජාතිකයින්ට හිමි සහ රජය විසින් අරමුදල් සපයන ලද කෘෂිකාර්මික සමිති ලෙස ආරම්භ වූ අතර (Van Niekerk, 1988; Vink, 2012), නිවාස සමුපකාර මතු වූයේ 1996 වසරේදී පමණය. මේ අවස්ථාවේදී, ගෝටෙන්ග් රජය[4] හිල්බ්‍රෝ, ජුබර්ට් පාර්ක් (Hillbrow, Joubert Park), සහ බෙරියා (Berea) හි මහල් නිවාස හතක කුලී නිවැසියන් 2,000කට නිවාස හිමිකම සඳහා පහසුකම් සලසා දුන්නේය (Jimoh and Van Wyk, 2014). මෙම කුලී නිවැසියන්ට එම නිවාස පහසුකම් භාවිත කිරීමට සුවිශේෂී අයිතිවාසිකම් ලබා දුන් අතර ඔවුන් සිය නිවාස වල කටයුතු කළමනාකරණය කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදීව සහභාගී වීමද ඒ අනුව සිදුවිය (Sanchez-Bajo, 2022). මෙම පරිවර්තනය මඟින් කුලී නිවැසියන්ට හුදු පාරිභෝගිකයින්ගේ සිට කළමනාකරණයේ සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි ක්‍රියාකාරී සහභාගිවන්නන් බවට පත්වීමට ඉඩ සැලසීය (Girbers-Peco et al, 2020). මෙකී මුලපිරීම තිබියදීත්, නිවාස සංවර්ධනය සඳහා ඵලදායී මෙවලම් ලෙස සමුපකාර ආකෘතිය තවමත් රජය විසින් හඳුනාගෙන නොමැති බව පෙනේ. සමුපකාර සඳහා ලබා දෙන සහාය ප්‍රමාණවත් නොවන, අවම, අවධානය යොමු නොකළ සහ දුර්වල ලෙස සම්බන්ධීකරණය කරන ලද එකක් ලෙස මේ අනුව තවමත් පවතී [Republic of South Africa (RSA), 2023]. එහි ප්‍රතිඵලයක් ලෙස, පෞද්ගලික අංශය ද නිවාස සමුපකාර මානව ජනාවාස සඳහා ශක්‍ය ආකෘතියක් ලෙස බැලීමට මැලි වේ (Mushonga et al, 2019). මෙම සහාය නොමැතිකම හේතුවෙන්, නිවාස සමුපකාරවලට සීමිත සංවර්ධනයක් සහ වර්ධනයක් අත්විඳීමට සිදු වී ඇත. කෙසේ වෙතත්, නිවාස අර්බුදය විසඳීමට ඒවාට තවමත් සැලකිය යුතු විභවයක් ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින නිවාස පිළිබඳ අභියෝගයට තිරසාර විසඳුම් ලෙස ජීවමය, අනුකලණිත සහ ස්වයං-කළමනාකරණිත ප්‍රජාවන් ඇතුළත් ආකෘතික රාමුවක් අනුගමනය කිරීම අවශ්‍ය වේ (Van Wyk and Jimoh, 2015).

### 3.2 නිවාස සමුපකාරවල ප්‍රතිලාභ

නිවාස සමුපකාර දැරිය හැකි මිලකට නිවාස සැපයීමට වඩා වැඩි යමක් සපයයි; එනම් ඒවා සමාජ ප්‍රාග්ධනය ද ප්‍රවර්ධනය කරයි, නිවාසවල ගුණාත්මකභාවය සහ ස්ථාවරත්වය වැඩි දියුණු කරයි , නිපුණතා ලබා ගැනීම සඳහා පහසුකම් සපයයි, සහ සමාජ-ආර්ථික සංවර්ධනයට දායක වේ (Bianchi, 2022).

#### 3.2.1 නිවාස ප්‍රවේශනීයතාව (Housing affordability)

නිවාස ප්‍රෙව්ශනීයතාව එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීමේදී සහ රටක ආර්ථික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය නිරෝගී, ඵලදායී ශ්‍රම බලකායකට

---

[4] දකුණු අප්‍රිකාවේ ගෝටෙන්ග් (Gauteng) පළාත මෙයින් අදහස් වෙයි.

සහාය වීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි (Azeez and Mogaji-Allison, 2017). නිවාස සමුපකාර අඩු හා මධ්‍යම ආදායම් ලාභීන් සඳහා ප්‍රෙව්ශණීය නිවාස විසඳුම් ලබා දෙන අතර (Shaker, 2019), ප්‍රජා සහභාගීත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ප්‍රවර්ධනය කරයි (Huron, 2015). ආරක්ෂාව සහ තෘප්තිය වැඩිදියුණු කිරීම මගින් සාමාජිකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවන අතර, අඩු මෙහෙයුම් සහ කළමනාකරණ පිරිවැය හරහා ව්‍යවසාය ලාභදායීතාවය සහතික කරයි (Brzeska and Jedrzojewski, 2021). නිවාස සංවර්ධනය යනු සංකීර්ණ සහ ප්‍රාග්ධනය දැඩි ලෙස අවශ්‍ය වන ක්‍රියාවලියක් වන අතර, එය බොහෝ අඩු සහ මධ්‍යම ආදායම් ලබන පුද්ගලයින්ට දරාගත නොහැකි වේ (Adeoye, 2018). සමුපකාර මෙම ක්‍රියාවලිය සරල කරයි, පිරිවැය සහ අසමානතා අඩු කරයි, සහ නිවාස සංවර්ධන ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදා හැරීම ප්‍රවර්ධනය කරයි (Wanyama, 2014). සම්පත් එකතු කිරීම මගින්, සාමාජිකයින් තම කේවල් කිරීමේ බලය වර්ධනය කර ගන්නා අතර, පරිමාණයේ සහ පරාසයේ වාසි (economies of scale and scope) අත්පත් කර ගනී. එමගින් සංවර්ධන පිරිවැය අඩු කර ගත හැකිය. නිවාස සමුපකාර සාම්ප්‍රදායික නිවාස හිමිකාරිත්වයට විකල්පයක් ලබා දෙන්නේ අඩු මූලික පිරිවැයක් සහ අඩු මාසික වියදම් ඉදිරිපත් කිරීමෙනි (Birchall, 2004).

### 3.2.2 සමාජ ප්‍රාග්ධනය (Social capital)

නිවාස සමුපකාර සහභාගීත්ව සැලසුම්කරණය සහ සාමූහික ක්‍රියාකාරකම්වල මූල-උපරි (bottom-up) සංස්කෘතියක් දිරිමත් කරයි (Lang and Novy, 2014). ඒවා ප්‍රජා බැඳීම් වැඩි දියුණු කරයි, අසල්වැසි සබඳතා පෝෂණය කරයි, සහ නිවසක් සහ ආරක්ෂාවක් පිළිබඳ ශක්තිමත් හැඟීමක් ඇති කරයි (Crabtree-Hayes, 2024). සාමූහික වගකීමක් වර්ධනය කිරීමෙන්, නිවැසියන් ක්‍රියාකාරීව නිවාස පාලනයට සම්බන්ධ වන සමාජ පරිසරයක් සමුපකාර විසින් ස්ථාපිත කරනු ලබයි (Balme and Gerber, 2018). සාමාජිකයින්ගේ සමාජ විරෝධී හැසිරීම් වලට ආමන්ත්‍රණය කිරීම, ප්‍රජා සමගිය ප්‍රවර්ධනය සහ සමාජ ප්‍රාග්ධනය ගොඩනැගීම යන කාරණා සම්බන්ධයෙන් නිවාස සමුපකාර වඩාත් ක්‍රියාශීලීය (White, 2021). මීට අමතරව, නිවාස සමුපකාර පුරවැසියන් අතර සමානාත්මතාවය පෝෂණය කිරීමෙන් සහ ඔවුන්ගේ දෛනික ජීවිතයට බලපාන ක්‍රියාකාරකම්වලට සහභාගී වීමට දිරිගැන්වීමෙන් සමාජ වෙනසක් ඇති කරයි (King et al., 2013). ඔවුන් නිවාස සමුපකාර වල නිවැසියන්ට සමාජ ජාල සඳහා වඩා හොඳ ප්‍රවේශයක්, වැඩි සමාජ සහයෝගයක් සහ ශක්තිමත් සමාජ සහජීවනයක් සපයයි (Crabtree-Hayes, 2024).

### 3.2.3 ප්‍රජා සවිබල ගැන්වීම සහ සහභාගීත්වය (Community empowerment and participation)

සමුපකාර ආකෘතිය අඩු හා මධ්‍යම ආදායම් ලාභී නිවාස හිමියන් ඒකාබද්ධ කරන අතරම ඔවුන් ප්‍රජා ක්‍රියාකාරකම් වලට සම්බන්ධ කරයි (Huron, 2015). ඒ ඔස්සේ සාමාජිකයින්ගේ පොදු හිමිකාරිත්වය බෙදා හදා ගන්නා අතරම, ඔවුන්ගේ නිවාස කළමනාකරණය හා මෙහෙයවීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි නිරත වන අතරම, ප්‍රජා සවිබල ගැන්වීම් ද

පෝෂණය කරයි (Sanchez-Bajo, 2022). මේ අනුව නිවාස සමුපකාර ප්‍රජාවන් සවිබල ගැන්වීම, සමාජ-ආර්ථික පරතරයන් පටු කිරීම සහ වඩාත් සාධාරණ හා සියල්ලන්ම අන්තර්ග්‍රහණිත නාගරික අනාගතයක් සඳහා අභ්‍යන්තර නගරවල දරාගැනීමේ හැකියාව ශක්තිමත් කිරීම මගින් සාමූහික ක්‍රියාකාරකම්වල පරිවර්තනීය විභවය නිදර්ශනය කරයි (Hsiao, 2020). ඔවුන්ගේ පහසුකම් කළමනාකරණයට සහ මෙහෙයුම්වලට ක්‍රියාකාරීව සහභාගී වන නිවැසියන් සිය ජීවන අවකාශයන් නඩත්තු කිරීමට සහ වැඩිදියුණු කිරීමට වැඩි කැමැත්තක් දක්වන අතර, එමගින් ඔවුන්ගේ ප්‍රජාවේ සමස්ත යහපැවැත්ම වැඩි දියුණු කරයි (Chirisa et al., 2014). සමුපකාර ව්‍යුහාත්මකව සැලසුම් කර ඇත්තේ සියලුම සාමාජිකයින්ට එක හා සමානව සැලකීම, සම්පත් හා භාණ්ඩ සමානව බෙදා හැරීම, සහ සෑම සාමාජිකයෙකුටම ඔවුන්ගේ සාමූහික ප්‍රයත්නවල ප්‍රතිලාභ සඳහා සෘජු ප්‍රවේශය සහතික වන ලෙසය (Ajates, 2020). නිවාස සමුපකාර සෑම සාමාජිකයෙකුටම නායකත්ව භූමිකාවන් ගැනීමට දිරිගැන්වීමෙන් සංවාදාත්මක නායකත්වය (dialogic leadership) ප්‍රවර්ධනය කරයි, සමුපකාරයේ තිරසාරභාවය පවත්වා ගැනීම සඳහා බලය සමව බෙදා හැරීම සහතික කරයි (Girbers-Peco et al, 2020). සමුපකාරයේ පාලනයට ක්‍රියාකාරීව සහභාගී වීමෙන්, සාමාජිකයින් ජීවිතයේ වෙනත් අංශවලට ප්‍රයෝජනවත් වන සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදී කුසලතා වර්ධනය කරයි (Huron, 2015). මෙම සම්බන්ධය සාමාජිකයින්ට වටිනා දැනුම ලබා දෙන අතර, ඔවුන්ගේ හැකියාවන් සහ සාමූහිකයේ විභවය පිළිබඳ ඔවුන්ගේ විශ්වාසය ඉහළ නංවයි (Girbérs-Peco et al., 2020). මීට අමතරව, නිවාස සමුපකාර ස්වයං විශ්වාසය පෝෂණය කරයි, ස්වයං අභිමානය වැඩි දියුණු කරයි, සහ සාමාජිකයින් අතර ශක්තිමත් විශ්වාසයක් ඇති කරයි (Coates et al., 2015).

### 3.2.4 තිරසාර සංවර්ධනය සහ පාරිසරික බලපෑම (Sustainable development and environmental impact)

නාගරික නිවාසවල පාරිසරික බලපෑම අඩු කිරීමට සහ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට නිවාස සමුපකාර සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි (Yimam et al., 2022). ඒවා නිතරම බලශක්ති කාර්යක්ෂම සැලසුම්, අපද්‍රව්‍ය අඩු කිරීමේ ක්‍රියාමාර්ග, සහ ප්‍රජා උද්‍යාන වැනි පරිසර හිතකාමී භාවිතයන් අනුගමනය කරයි (Cabré and Andrés, 2018). පාරිසරික තිරසාරභාවය අවධාරණය කිරීමෙන්, නිවාස සමුපකාර ඔරොත්තු දෙන සහ පාරිසරිකව සවිඥානික නාගරික ප්‍රජාවන් ගොඩනැගීමට දායක වේ (King et al., 2013). පුහුණුව, අධ්‍යාපනය සහ සන්නිවේදනය සඳහා ඔවුන්ගේ ආයතනික ධාරිතාව තිරසාර සංවර්ධනය සඳහා වන ගෝලීය ව්‍යාපාරයේ ප්‍රධාන සහභාගිවන්නන් ලෙස සමුපකාර ස්ථානගත කරයි (Wanyama, 2014). නිවාස සමුපකාර නිවාස කළමනාකරණයට නිවැසියන් සම්බන්ධ කර ගැනීමෙන්, තිරසාර සංවර්ධනයේ මූලධර්ම හා ඉලක්ක සමඟ ඔවුන්ගේ ව්‍යුහය සහ මෙහෙයුම් පෙළගස්වමින්, නිවාස මුලපිරීම්වල තිරසාරභාවය තවදුරටත් වැඩි දියුණු කරයි (Brzeska and Jedrzojewski, 2021).

### 3.3 නිවාස සමුපකාරවලට මුහුණ දෙන අභියෝග

නීතිමය සංකීර්ණතා, මූල්‍ය දුෂ්කරතා සහ ආකෘතිය පිළිබඳ සීමිත මහජන දැනුවත්භාවය වැනි සාධක බොහෝ විට නිවාස සමුපකාරවල තිරසාරභාවයට බාධා කරයි (Barenstein et al., 2022).

#### 3.3.1 නීතිමය සංකීර්ණතා (Legal complexities)

සමුපකාරවල තිරසාරභාවය රඳා පවතින්නේ රාජ්‍යයේ සහයෝගය, විශේෂයෙන්ම ඉඩම් හා මුදල් සඳහා ප්‍රවේශය සඳහා ව්‍යවස්ථාදායක හා ප්‍රතිපත්තිමය රාමු මත ය (Sanjines et al., 2022). කෙසේ වෙතත්, රජයේ රෙගුලාසි සහ සැලසුම් නීති බොහෝ විට සාම්ප්‍රදායික නිවාස විසඳුම් කෙරෙහි පක්ෂග්‍රාහී වේ (Crabtree et al., 2021). මෙම සීමා කිරීම් නිවාස සමුපකාර සංවර්ධනයට තර්ජනය කරන අතර ඒවායේ තිරසාරභාවයට බරක් වේ.

#### 3.3.2 ප්‍රමාණවත් නොවන මූල්‍යකරණය (Inadequate finance)

සමුපකාර කෙරෙහි රාජ්‍යයේ උනන්දුවක් නොමැතිකම මූල්‍ය ආයතනවල සහාය ලබා දීමට ඇති පැකිලීමට හේතු වී ඇත (King et al., 2013). මෙය ඒවායේ වර්ධනයට බාධා කර ඇතිවා පමණක් නොව, පවතින සමුපකාර ද දුර්වල කර ඇත. විශේෂයෙන්ම තමන්ගේම නිවාස සඳහා මුදල් යෙදවීමට නොහැකි පුරවැසියන්ට සහනාධාර ලබා දීමෙන්, නිවාස සැපයීමේදී රාජ්‍යය ක්‍රියාකාරී භූමිකාවක් ගැනීම ඉතා තීරණාත්මක ය (Ajayi, 2022). ඕස්ට්‍රේලියාව, කැනඩාව, නෝර්වේ, ස්වීඩනය, ස්විට්සර්ලන්තය සහ තුර්කිය වැනි රටවල, රජය, කම්කරු සමිති, අන්‍යෝන්‍යාධාර පදනම් ආයතන, වාණිජ බැංකු සහ ප්‍රජා සංවිධාන ඇතුළු විවිධ සමාජ ආයතනවල පුළුල් සහයෝගය හේතුවෙන් නිවාස සමුපකාර සමෘද්ධිමත් විය (Sørvoll and Bengtsson, 2018).

#### 3.3.3 දුර්වල ධාරිතාව (Poor capacity)

සමුපකාරවල සාර්ථකත්වයට ඇති ප්‍රධාන බාධාව වන්නේ සමුපකාර ආකෘතිය පිළිබඳ මහජන දැනුවත්භාවය නොමැතිකමයි (Rena, 2017). බොහෝ පුද්ගලයින් මෙම සංවිධාන ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ අවබෝධයකින් තොරව සමුපකාරවලට සම්බන්ධ වේ. ව්‍යවසායය සුමටව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා කලින් ආගන්තුකයන් වූ නමුත් දැන් සහයෝගයෙන් කටයුතු කළ යුතු පුද්ගලයින් විසින් සමුපකාර නිරන්තරව පිහිටුවාගනු ලැබේ (Heath, 2022). බොහෝ විට, මෙම පුද්ගලයින්ට නායකත්වය සහ කළමනාකරණය පිළිබඳ පුහුණුවක් නොමැති අතර, එය සමුපකාරයේ පරිපාලනයට අහිතකර ලෙස බලපායි (Jimoh and Van Wyk, 2014).

### 4. සාකච්ඡාව

වේගවත් නාගරීකරණයත් සමඟ, දකුණු අප්‍රිකාවට ප්‍රවේශනීය (දැරිය හැකි) නිවාස සැපයීම පිළිබඳව ඉහළ නගිමින් පවතින පීඩනයකට ලක්ව ඇත. නිවාස හිඟය විසඳීමට විවිධ උපාය

මාර්ග ගවේෂණය කිරීමෙන් පසුව, රජයට මෙම අර්බුදයට මුහුණ දීම සඳහා විකල්ප ප්‍රවේශයක් ලෙස සමුපකාර සලකා බැලිය හැකිය. රටේ නිවාස හිඟය ඒකක මිලියන 2 ඉක්මවන අතර, අඩු හා මධ්‍යම ආදායම්ලාභී නිවාසවලින් ඉහළ ඉල්ලුමක් පවතී [Centre for Affordable Housing Finance Africa (CAHFA), 2024]. මෙම හිඟය අඩු කිරීමට උපකාර කිරීමට නිවාස සමුපකාර ශක්‍ය, ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන සහ ප්‍රමාණනය කළ හැකි විසඳුමක් ලෙස පෙනේ (Charlton and Kihato, 2006). ඒවා වැඩෙන නාගරික ජනගහනයක නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා තිරසාර විකල්පයක් ලබා දෙන අතරම අවිධිමත් ජනාවාස හා සම්බන්ධ ගැටළු ද විසඳයි (Turok, 2012).

නිවාස සැපයීමේදී සමුපකාර ක්‍රමය අනුගමනය කිරීමට පවතින ව්‍යවස්ථාදායක රාමු සහාය දක්වයි. නිදසුනක් ලෙස, දකුණු අප්‍රිකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සෑම පුරවැසියෙකුටම ප්‍රමාණවත් නිවාස සඳහා ඇති අයිතිය සහතික කරන අතර, සමුපකාර වැනි නව්‍ය විසඳුම් ගවේෂණය කිරීමට රාජ්‍යය උනන්දු කරයි [Republic of South Africa (RSA), 1996]. මීට අමතරව, සමුපකාර පනත මගින් සමුපකාර පිහිටුවීම සහ කළමනාකරණය සඳහා ශක්තිමත් නීතිමය පදනමක් සපයන අතර [Republic of South Africa (RSA), 2005], ඒවා විධිමත් කිරීම, පාලනය සහ සම්පත් සඳහා ප්‍රවේශය පහසු කරයි [Republic of South Africa (RSA), 2005]. තවද, නිවාස සමුපකාර, ඒකාබද්ධ, තිරසාර සහ ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන සංවර්ධනය ප්‍රවර්ධනය කරන "නව මාර්ගයක් විවෘත කිරීම" [Breaking New Ground (BNG)][5] ප්‍රතිපත්තියේ මූලධර්ම සමඟ සමපාත වේ [Republic of South Africa (RSA), 2004]. තෝක් (Turok) සඳහන් කරන පරිදි, නිවාස සමුපකාර මගින් වර්ණභේදවාදී යුගයේ සැලසුම්කරණය මගින් නිර්මාණය කරන ලද අවකාශීය අසමානතා ආමන්ත්‍රණය කරමින්, අඩු ආදායම්ලාභී නිවැසියන් හොඳින් පිහිටි නාගරික ප්‍රදේශවලට ඒකාබද්ධ කිරීමට දකුණු අප්‍රිකාවට අවස්ථාවක් සපයයි (Totaforti, 2021). එසේ කිරීමෙන්, නිවාස සමුපකාර ඉහළ ඝනත්වයකින් යුත් සහ මිශ්‍ර භාවිත සංවර්ධනයන් දිරිමත් කිරීම මගින් තිරසාර නාගරික සැලසුම්කරණයට සහ ඉඩම් භාවිතයට දායක වේ (Czischke et al., 2025).

ගෝලීය වශයෙන්, සමුපකාර නිවාස එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සංවර්ධන අරමුණු (SDG 11) සහ අප්‍රිකානු සංගමයේ "2063 න්‍යාය පත්‍රය" (Agenda 2063)[6] යන ද්විත්වය සමඟ සමපාත වන අතර, ඒවා අන්තර්ග්‍රහනීය (inclusive) වන සහ තිරසාර සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරයි. සමුපකාර දිගු කලක් තිස්සේ අඩු ආදායම් ලබන රටවල පමණක් නොව, මධ්‍යම හා ඉහළ ආදායම් ලබන ජාතීන්හි ද ප්‍රවේශනීය නිවාස සැපයීම සඳහා ඵලදායී මෙවලමක් වී ඇත. නිදසුනක් ලෙස, උරුගුවේ රජය විසින් සහාය දක්වන ලද සමුපකාර නිවාස මුලපිරීම් මගින් නිවාස හිඟය තිරසාර ලෙස විසඳිය හැකි ආකාරය පෙන්වා දී ඇත (Encinales et al.,

[5] "Breaking New Ground" (BNG) යනු තිරසර නිවාස සඳහා වන දකුණු අප්‍රිකානු ප්‍රතිපත්තියයි (අනුවර්තකයින්ගේ පැහැදිලි කිරීමකි).

[6] Agenda 2063 යනු අප්‍රිකානු සංගමය (African Union - AU) විසින් සම්මත කරන ලද, අප්‍රිකානු මහාද්වීපයේ සමාජ-ආර්ථික පරිවර්තනය සඳහා වන වසර 50ක (2013-2063) උපායමාර්ගික රාමුවයි (අනුවර්තකයින්ගේ පැහැදිලි කිරීමකි).

2024). රූෆ්ටොප්ස් කැනඩා (Rooftops Canada) සහ එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-Habitat) වැනි සංවිධාන දකුණු අප්‍රිකාවේ නිවාස සමුපකාරවලට සහාය දැක්වීමට උනන්දුවක් දක්වා ඇති අතර, තාක්ෂණික විශේෂඥ දැනුම සහ මූල්‍ය සහාය ලබා දෙයි (Ngwenya, 2018).

දකුණු අප්‍රිකාවේ නිවාස සමුපකාරවලට සාර්ථක වීමට විභවයක් පැවතියද, සාධක කිහිපයක් ඒවායේ වර්ධනයට බාධා කළ හැකිය. එකක් වන්නේ සමුපකාර නිවාස ආකෘතිය හොඳින් වටහාගෙන නොමැති අතර, එහි ප්‍රතිලාභ පිළිබඳ මහජන දැනුවත්භාවය සීමිත වීමයි (Gotyi et al., 2021). බොහෝ සමුපකාර පිහිටුවා පවත්වාගෙන යනු ලබන්නේ සමුපකාර ව්‍යාපාර ආකෘතිය පිළිබඳ පුහුණුවක් නොලද සාමාජිකයින් විසිනි (Kanyane and Ilorah, 2015). එවැනි මූලික කුසලතා නොමැතිකම සාමාජිකයින් අතර නොවිසඳුණු ගැටුම් ඇති කිරීමට සහ සමුපකාරවල තිරසාරභාවය අඩපණ කිරීමට හේතු විය හැකිය (Ngwenya, 2018). මීට අමතරව, දකුණු අප්‍රිකාවේ වර්ණභේදවාදී යුගයේ ප්‍රතිපත්ති නිසා ජාතිවාදීව වෙන් කරන ලද නාගරික ප්‍රදේශ ඇති වූ අතර අවකාශීය අසමානතාවය ගැඹුරු විය. ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් නිවාස හිමිකමෙන් බැහැර කර නොදියුණු අර්ධ නාගරික ප්‍රදේශවලට නැවත පදිංචි කරන ලද අතර, එය නිවාස හිඟයට දායක විය (Totaforti, 2021). දකුණු අප්‍රිකානුවන්ගෙන් දළ වශයෙන් 12.2% ක් අවිධිමත් ජනාවාසවල ජීවත් වෙති (Statistics South Africa, 2023), සහ ඉඩම් හිමිකාරිත්වයේ අනාරක්ෂිත බව, මූලික යටිතල පහසුකම් නොමැතිකම සමඟ, නිවාස සමුපකාර පිහිටුවීමට තවත් අභියෝග ඉදිරිපත් කරයි. ජනගහනයෙන් 55.5% ක් පමණ ජාතික දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන අතර 2024 තුන්වන කාර්තුවේදී විරැකියා අනුපාතය 32.1% ක් වන බැවින්, සමුපකාර මූල්‍යකරණය ඉහළ නැංවීම අපහසුය (Statistics South Africa, 2024). නිවාස සමුපකාර සඳහා දැරිය හැකි, දිගුකාලීන මූල්‍යකරණයට ප්‍රවේශය අවශ්‍ය වන නමුත්, බොහෝ දකුණු අප්‍රිකානුවන් දැඩි ලෙස ණය වී සිටින අතර, 2024 දී ගෘහස්ථ ණය බැහැර කළ හැකි ආදායමෙන් 40.7% ක් වන බැවින්, ඔවුන්ට සාමූහික මූල්‍ය දායකත්වයන් ලබා දීම අපහසු වේ [South African Reserve Bank (SARB), 2024]. දකුණු අප්‍රිකාවේ මූල්‍ය ආයතන ද සමුපකාර සඳහා මූල්‍ය ආධාර සැපයීමට මැලි වන අතර, ඒ වෙනුවට තනි පුද්ගල නිවාස ණය සඳහා අනුග්‍රහය දක්වයි. රජයේ නිවාස සහනාධාර පවා සාමාන්‍යයෙන් යොමු කරනු ලබන්නේ තනි පුද්ගල හිමිකාරිත්වය සඳහා මිස සාමූහික මුලපිරීම් සඳහා නොවේ (Qumbisa et al., 2025). නිවාස සංවර්ධනයේ ප්‍රාග්ධන-දෘඩ (capital-intensive) ස්වභාවය තිබියදීත්, නිවාස සමුපකාර සඳහා නිශ්චිත අරමුදල් වෙන් කර නොමැත.

මීට අමතරව, නිවාස සංවර්ධනයේදී සමුපකාරවල කාර්යභාරය පැහැදිලිව නිර්වචනය කරන ප්‍රතිපත්ති රාමුවක් නොමැති වීමද දැකගත හැකිය. ජාතික ප්‍රතිපත්ති රාමු තුළ සමුපකාර ගැන කෙටියෙන් සඳහන් කර ඇතත්, නිවාස සමුපකාර සඳහා නිශ්චිත නීති හෝ ප්‍රතිපත්ති ස්ථාපිත කර නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස, නිවාස සමුපකාර පාලනය කරනු ලබන්නේ සාමාන්‍ය සමුපකාර නීති සහ ප්‍රතිපත්ති මගිනි. වත්මන් නිවාස ප්‍රතිපත්ති විකල්ප නිවාස ආකෘතිවලට වඩා

විශාල පරිමාණයේ රාජ්‍ය අනුග්‍රහය ලත් නිවාස බෙදා හැරීමට වැඩි අවධානයක් යොමු කරයි (Tomlinson, 2015). නිවාස සමුපකාර පිහිටුවීමේදී, විශේෂයෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේදී, නිලධාරිවාදී බාධක සැලකිය යුතු අභියෝග ඇති කරයි (Jimoh and Van Wyk, 2014). සමුපකාරවලට බොහෝ විට සංකීර්ණ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියා පටිපාටි සහ නාගරික අනුමත කිරීමේ පද්ධති හරහා ගමන් කිරීමේ දුෂ්කරතාවයට මුහුණ දීමට සිදු වේ (Charlton and Kihato, 2006).

අවබෝධය සහ ප්‍රමාණවත් සහයෝගය නොමැතිකම සමුපකාරවලට නිවාස සැපයීමට ඵලදායී ලෙස දායක වීමේ හැකියාව සීමා කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, දකුණු අප්‍රිකාවේ නිවාස සංවර්ධනය සඳහා ක්‍රියාකාරීව සම්බන්ධ වන්නේ නිවාස සමුපකාර කිහිපයක් පමණි (Jimoh and Van Wyk, 2014). ඉඛායලෙතු[7] නිවාස සමුපකාරය (Ikhayalethu Housing Cooperative) (ජොහැන්නස්බර්ග්) වැනි උදාහරණ, අත්හැර දැමූ ගොඩනැගිලි අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස බවට පරිවර්තනය කිරීමෙන් අභ්‍යන්තර නගරය පුනර්ජීවනය කිරීමේ කාර්යභාරයක් ඉටු කර ඇත (Tissington, 2010). ඒකායා නිවාස සමුපකාරය (Ekhaya Housing Cooperative) (කේප් ටවුන්) අවකාශීය අසමානතා වලට ආමන්ත්‍රණය කරමින් සහ අඩු ආදායම්ලාභී නිවැසියන් නාගරික ප්‍රදේශවලට ඒකාබද්ධ කරමින් අඩු හා මධ්‍යම ආදායම් ලාභීන් සඳහා නිවාස සපයා ඇත (Charlton and Kihato, 2006). කොස්මෝ නගරයේ (Cosmo City) (ජොහැන්නස්බර්ග්) අඩු, මධ්‍යම සහ ඉහළ ආදායම් ලබන අය සාර්ථකව ඒකාබද්ධ කර, සමාජ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කර, අවකාශීය වෙන්වීම අඩු කර ඇත. තෝන්ට (Turok, 2012) අනුව, මෙම ව්‍යාපෘතිය මහා පරිමාණ සංවර්ධනයන්හි සමුපකාරවල විභවය ඉස්මතු කරයි. මෙම උදාහරණ රජය සඳහා වටිනා පාඩම් සපයයි. නාගරික ජනගහනය වේගයෙන් වැඩිවීමත් සමඟ, විකල්ප නිවාස විසඳුම් සඳහා වැඩිවන අවශ්‍යතාවයක් පවතී. වැඩෙන නාගරික ජනගහනයක අභියෝග විසඳීම සඳහා ශක්‍ය ආකෘතියක් ලෙස නිවාස සමුපකාර හඳුනා ගැනීමට කාලය පැමිණ ඇත (Van Wyk and Jimoh, 2015).

## 5. නිගමන

මෙම පත්‍රිකාව සමාජ වෙනස, ප්‍රජා ඔරොත්තු දීමේ හැකියාව සහ සාධාරණ නාගරික සංවර්ධනය සඳහා උත්ප්‍රේරකයක් ලෙස නිවාස සමුපකාර යොදා ගැනීම පිළිබඳ වැදගත් අන්තර්ඥානයක් ලබාදෙනු ඇත. නාගරීකරණය වේගවත් වන විට, නිවාස අර්බුද උග්‍ර වන විට, නිවාස සමුපකාර ආකෘතිය නිවාස හිඟය අවම කිරීම සඳහා විභව උපාය මාර්ග ඉදිරිපත් කරයි. මෙම ආකෘතිය වාණිජ මූල්‍ය ආයතනවලින් උකස් ණය ලබා ගැනීමට අරගල කරන අඩු හා මධ්‍යම ආදායම් ලබන පුරවැසියන් සඳහා දැරිය හැකි නිවාස සැපයීමට පහසුකම් සැලසීමට අමතරව, අපරාධ අවම කිරීමට, සමාජ සහජීවනය ශක්තිමත් කිරීමට සහ අභ්‍යන්තර නගර ප්‍රදේශවල සමාජ-ආර්ථික සංවර්ධනය පෝෂණය කිරීමට ද උපකාරී වනු ඇතැයි පර්යේෂණවලින් පෙනී යයි.

[7] සුලු බසින් “අපේ ගෙදර“ යන තේරුම සහිතයි (අනුවර්තකයින්ගේ පැහැදිලි කිරීමකි).

## සමුද්දේශ

Adegun, O. B., and Olusoga, O. O. (2019). Self-help housing cooperative societies contributions and professionals' views in Akure, Nigeria. *Built Environ.* 45, 332-345. doi: 10.2148/benv 45.3.332.

Adeoye, D. O. (2018). Factors influencing gender differentials in involvement in urban informal housing development process in South-Western Nigeria. Ibadan Plann. J. 7, 30-41.

Adigeh, D. T., and Abebe, B. G. (2024). Land acquisition policy and practice for cooperative housing scheme in Bahir Dar, Ethiopia: toward affordable housing solutions. Front. Sustain. Cities 5, 1-14. doi: 10.3389/frsc.2023.1234620.

Ajates, R. (2020). An integrated conceptual framework for the study of agricultural cooperatives: from repolitisation to cooperative sustainability. J. Rural. *Stud.* 78, 467-479. doi: 10.1016/j.jrurstud.2020.06.019.

Ajayi, A. (2022). Factors militating against cooperative societies contributions to housing development in Osogbo, Nigeria. Acta Structilia 29, 58-82. doi: 10.18820/24150487/as2912.3.

Azeez, T., and Mogaji-Allison, B. (2017). Constraints of affordable housing through cooperative societies in tertiary institutions in Lagos state, Nigeria. J. Geograph. Reg Plan. 10, 39-46. doi: 10.5897/JGRP2016.0599.

Balme, L, and Gerber, J. D. (2018). Why are housing cooperatives successful? Insights from Swiss affordable housing policy. Hous. Stud. 33, 361-385. doi: 10.1080/02673037.2017.1344958.

Barenstein, J. D., Koch, P., Sanjines, D., Assandri, C., Matonte, C., Osorio, D., et al. (2022). Struggles for the decommodification of housing: the politics of housing cooperatives in Uruguay and Switzerland. Hous. Stud. 37, 955-974. doi: 10.1080/02673037.2021.1966392.

Bianchi, M. (2022). Italian community co-operatives and their agency role in sustainable community development. J. Co-operative Stud. 55, 65-77. doi: 10.61869/QRZS8772.

Birchall, J. (2004). Cooperatives and millennium development goals. Geneva: International Labour Office.

Brzeska, A., and Jedrzojewski, S. (2021). The degree of dissemination of the idea of sustainable development in polish housing cooperatives in the light of empirical research. Sustain. For. 13, 1-20. doi: 10.3390/su13105481.

Cabré, E., and Andrés, A. (2018). La Borda: a case study on the implementation of cooperative housing in Catalonia. Int. J. Hous Policy 18, 412-432. doi: 10.1080/19491247.2017.1331591.

Centre for Affordable Housing Finance Africa. (2024). Self-published (Centre for Affordable Housing Finance Africa).

Charlton, S., and Kihato, C. (2006). Reaching the poor? An analysis of the influences on the evolution of South Africa's housing Programme: Cape Town, Development Southern Africa.

Chirisa, I., Gaza, M., and Bandauko, E. (2014). Housing cooperatives and the politics of local organization and representation in Peri-urban Harare, Zimbabwe. African Stud. Quart. 15, 37-53.

Coates, D, Anand, P, and Norris, M. (2015). Housing, happiness, and capabilities: a summary of the international evidence and models. (81). Available online at:http://hdl. handle.net/10419/147532.

Crabtree, L., Perry, N., Grimstad, S., and McNeill, J. (2021). Impediments and opportunities for growing the cooperative housing sector: an Australian case study. Int. J. Housing Polic. 21, 138-152. doi: 10.1080/19491247.2019.1658916.

Crabtree-Hayes, L. (2024). Establishing a glossary of community-led housing. *Intern Housing Policy*, 24, 157-184. doi: 10.1080/19491247-2022 2155339.

Czischke, D., Ruiz-Tagle, J., Valenzuela, E, Carroza-Athens, N., and Cortés-Urra, V. (2025). Housing cooperatives in Chile: the struggle to re-emerge in a neoliberal context of growing self-management. Hous. Stud. doi: 10.1080/02673037.2025.2459145.

Del Rio, S. L. (2022). Conceptualising the commons as a relational triad: lessons from the grant of use cooperative housing model in Barcelona. *Geoforum* 136, 112-121. doi: 10.1016/j.geoforum.2022.09.007.

Encinales, D. S., Barenstein, J. D., and Quíñónez, N. (2024). Exploring the conditions for the emergence and sustainability of housing cooperatives in Latin America. *Housing Studies*, doi: 10.1080/02673037.2024.2392697.

Girbers-Peco, S., Foraster, M. J., Mara, L. C., and Morla-Folch, T. (2020). The role of the democratic organization in the La borda housing cooperative in Spain. *Habitat Int.* 102:102208. doi: 10.1016/j.habitatint.2020.102208.

Gotyi, Z. G., Theletsane, K. I., and Erasmus, W. D. (2021). Functionality and Economics of cooperatives in the development of poor communities within the Chris Hani District Municipality, South Africa. *J Global Business.* 17, 81-97.

Heath, S. (2022). Balancing the formal and the informal: the relational challenges of everyday practices of co-operation in shared housing cooperatives in the UK. Soc. Cult. Geogr. 22, 1256-1273. doi: 10.1080/14649365.2020.1757138.

Hsiao, H. W. (2020). Using participatory-planning-based cooperative housing approaches as housing improvement solutions for Xizhou indigenous squatter settlements in New Taipei City, Taiwan. *City Cult. Soc.* 23:100370. doi: 10.1016/j.ccs. 2020.100370.

Huron, A. (2015). Struggling for housing, from DC to. Johannesburg: Washington Inner-city Self-Help goes to South Africa.

Jimoh, R. A., and Van Wyk, J. J. (2014). Analysis of housing co-operatives in South Africa. Civil Eng. Dimen. 16, 54-60. doi: 10.9744/ced.16.1.54-60.

Kanyane, M. H., and llorah, R. (2015). The cooperative landscape in South Africa: Analysing critical issues. *Africa Today* 61, 3-14, doi: 10.2979/africatoday.61.3.3.

King, R., Adler, M., and Grieves, M. (2013), Cooperatives as sustainable livelihood strategies in rural Mexico. *Bull. Lat. Am. Res.* 32, 163-177. doi: 10.1111/j.1470-9856. 2012.00796.x.

Lang, R., and Novy, A. (2014). Cooperative housing and social cohesion: the role of linking social capital. Eur. Plan. Stud. 22, 1744-1764. doi: 10.1080/09654313.2013.800025.

Mushonga, M., Arun, T. G., and Marwa, N. W. (2019). The cooperative movement in South Africa: can financial cooperatives become sustainable enterprises? Strateg. Chang. 28, 259-271. doi: 10.1002/jsc 2268.

Ngwenya, T. (2018). Cooperative housing in South Africa: a missed opportunity for transformational development. *Urban Forum*..

Owens, J. K. (2021). Systematic reviews: brief overview of methods, limitations, and resources. *Nurse Author Ed.* 31.69-72. doi: 10.1111/nae2.28.

Oyalowo, B. (2020). Co-operative societies and urban housing supply: a study of Lagos, Nigeria. BEYOND 2020-world sustainable built environment conference. *Earth Environ, Sci.* 588:052064. doi: 10.1088/1755-1315/588/5/052064.

Qumbisa, N., Emuze, F., and Smallwood, J. (2025). From perceptions by beneficiaries, can homelessness be reduced through self-help housing in the central region of South Africa? Front. Sustain. Cities. 6:1468668, doi: 10.3389/frsc.2024.1468668.

Rena, R. (2017). Cooperatives in South Africa: a review. Indian J. Sci. Technol. 10, 1-12. doi: 10.17485/ijst/2017/v10145/117678.

Republic of South Africa (RSA) (1996). The constitution of the Republic of South Africa. Pretoria: Government Printers.

Republic of South Africa (RSA) (2004). Breaking new ground: A comprehensive plan for the development of integrated sustainable human settlements: Department of Human Settlements.

Republic of South Africa (RSA) (2005). Cooperatives act 14 of2005. Pretoria: Government Printers.

Republic of South Africa (RSA) (2023). SMMEs and co-operatives funding policy for South Africa: Department of Small Business Development. Pretoria: Government Printers.

Sanchez-Bajo, C. (2022). Cooperatives emerging models in the 21st century, inaugural conference on cooperatives and the solidarity economy, 02-04 November 2022, Johannesburg, Africa Cooperatives Institute of South Africa.

Sanjines, D., Quiñonez, N., and Barenstein, D. (2022). Is there a space for housing cooperatives in Latin America's housing system? The case of Colombia and El Salvador, working paper 11. Tackling the global housing challenges: relevance and replicability of Switzerland's and Uruguay's housing cooperatives policies and strategies. ETH Zurich.

Shaker, S. A. (2019). Cooperative housing and sustainable development goals from the economic perspective: a case study of Egypt. *Munich Personal RePEc Archive (MPRA).* 1-15.

Sørvoll, J., and Bengtsson, B. (2018). The pyrrhic victory of civil society housing? Co-operative housing in Sweden and Norway. Int. J. Hous. Policy 18, 124-142. doi: 10.1080/14616718.2016.1162078.

South African Reserve Bank (SARB) (2024), Note on household sector debt and debt- service cost statistics. Q. Bull..

Statistics South Africa (2023). Census 2022 Results. Pretoria: Government Printers.

Statistics South Africa. (2024). Census reports and labour force statistics. Pretoria. 94-99.

Tissington, K. (2010). A review of housing policy and development in south africa since 1994. Johannesburg: Socio-Economic Rights Institute of South Africa (SERI).

Tomlinson, M. (2015). South Africa's housing conundrum. J. Housing Built Environ. 1-14.

Totaforti, M. (2021). Urbanization and housing development in South Africa. *African J Sci Technol Innov Develop.* 156, 769-777. doi: 10.1080/20421338.2020.1794301.

Turok, I. (2012). Urbanization and development in South Africa: economic imperatives, spatial distortions, and strategic responses. *Urban Forum.* 1-61.

Uttley, L., Quintana, D. S., Montgomery, P., Carroll, C., Page, M. J., Falzon, L., et al. (2023). The problems with systematic reviews: a living systematic review. J. Clin. Epidemiol. 156, 30-41. doi: 10.1016/j.jclinepi.2023.01.011.

Van Niekerk, J. A. S. (1988). Cooperative theory and practice. Pretoria: South African Agricultural Union.

Van Wyk, K., and Jimoh, R. (2015). Framework for the sustainability of housing cooperatives in South Africa. J. Cons. Project Manage. Innov, 5, 1100-1114.

Vink, N. (2012). The long-term economic consequences of agricultural marketing legislation in South Africa. *South African J. Econ.* 80, 553-566. doi: 10.1111/j.1813- 6982.2011.01302.x.

Wanyama, E. O. (2014). Cooperatives and the sustainable development goals: A contribution to the post-2015 development debate. Geneva: International Labour Organization (ILO).

White, M. (2021). Social benefits of co-operative housing: Housing co-ops contribution to the creation of integrated affordable complete communities. The University of British Columbia.

Yimam, S. H., Lind, H., and Alemu, B Y. (2022). Understanding urban land leasing system as a strategic value capture instrument to enhance urban revenue in Ethiopia: a case study of Bahir Dar City. *Economies* 10:146. doi: 10.3390/economies10060146.

ව්‍යවහාරික ශාස්ත්‍රීය සංග්‍රහය
ISSN 2961-5003 (Print) | ISSN 3121-3472 (e-Version)

**3 වෙළුම, ii වන නිකුතුව - 2025 ජූලි-දෙසැම්බර්**
පත්‍රිකා අංක 02

# ලංකාවේ වර්තමාන ආර්ථික අර්බුදය, සමුපකාරය හා සහයෝගිතා අර්ථ ක්‍රමය

උපාලි හේරත්[8]
upaliherath336@gmail.com

**සාරසංක්ෂේපය**

අසාර්ථක වූ නව ලිබරල් ප්‍රතිපත්ති සඳහා විකල්පයක් ලෙස ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සහ එක්සත් ජාතීන්ගේ සමාජ සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ආයතනය (UNRISD) විසින් සමාජයීය සහ සහයෝගීතා ආර්ථිකය (SSE) යෝජනා කර ඇති අතර, එහි පුරෝගාමියා ලෙස සමුපකාර ව්‍යාපාරය හඳුනාගෙන ඇත. සමාජයීය සහ සහයෝගීතා ආර්ථිකය ලාභයට වඩා සමාජ අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය ලබා දෙන අතර, සාමූහික අයිතිය සහ ප්‍රජාතන්ත්‍රවාදී කළමනාකරණය මෙහි ප්‍රධාන ලක්ෂණ වේ. එහි අරමුණ වන්නේ භාවිතයෙන් තොරව පසෙකට දමා ඇති නිෂ්පාදන බලවේග බලගැන්වීම සහ ආර්ථික හා සමාජීය යුක්තිය සහතික කිරීම මගින් සමබර හා තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීමයි. ග්‍රීක සහ ඉතාලි ආකෘතිවල දක්නට ලැබෙන ආකාරයට,මෙම ආර්ථික ක්‍රමය පොදු යහපත උදෙසා රාජ්‍ය, වෙළඳපොළ සහ ප්‍රජා ක්‍රියාකාරකම් ඒකාබද්ධ කරනු ලබයි.

**මූල පද:** සමාජ හා සහයෝගිතා අර්ථ ක්‍රමය, සමුපකාර, නව නිදහස් අර්ථ ක්‍රමය, සමාජ අවශ්‍යතා

[8] ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ වත්මන් සභාපතිවරයා වන අතර, කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධියෙන් අනතුරුව 1970 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳී, සමුපකාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා ලෙස සේවය කර ඇති අතර, 1977-1983 වකවානුවේ ජාතික සමුපකාර මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා සහ ICA ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස ද කටයුතු කර ඇත. 1987-1999 කාලයේ ජාත්‍යන්තර සමුපකාර සන්ධානයේ කලාපීය උපදේශක ලෙස ද සේවයකර ඇති අතර, 2001 වසරේ සිට ILO, ස්වීඩන් සමුපකාර මධ්‍යස්ථානය (SCC/We Effect) සහ සමුපකාර රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙස ද කටයුතු කර ඇත.

**ප්‍රවේශය**

රාජ්‍යයක සමාජ ආර්ථික ව්‍යුහයන් 3 කි: රාජ්‍ය අංශය, පුද්ගලික අංශය හා සමාජ ආර්ථික අංශයයි. සමුපකාර අයත් වන්නේ සමාජ ආර්ථිකයටය. මෑත කාලයේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් තම සමුපකාර අංශයේ විෂය පථය පුළුල් කරමින් සමාජ හා සහයෝගිතා අර්ථ ක්‍රමයක් පිළිබඳ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන අතර රටක සමාජ අර්ථ ක්‍රමයක වර්ධනය සඳහා වැඩ පිළිවෙලක්ද ඉදිරිපත් කරයි. විවිධ රටවල බිහි වී ඇති සහයෝගිතා අර්ථ ක්‍රම පිළිබඳ ගවේෂණ කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සමාජ පර්යේෂණ ආයතනයද ඉදිරිපත් වී සිටී. මීට ප්‍රධාන හේතුව වී ඇත්තේ නව නිදහස් අර්ථ ක්‍රමය රටවල සමාජ ආර්ථික සංවර්ධනයේදී අසාර්ථක තත්වයක් පෙන්වා ඇති හෙයිනි. එහි ප්‍රධාන බලවේගය වී සිටි ඇමෙරිකා එක්සත් ජනපදයද ආනයන අපනයනය පිළිබඳ විවෘත වෙළෙඳපොල න්‍යායයෙන් වෙනස්ව ක්‍රියා කිරීම මෙහි හොඳම නිදසුනකි.

ජාත්‍යන්තර කම්කරු සංවිධානය මෙහිලා සමුපකාර අංශය සලකා බලන්නේ සමාජ හා සහයෝගිතා අර්ථ ක්‍රමයේ නියමුවා ලෙසය. සමතුලිත වූ සමාජ හා ආර්ථික සංවර්ධනයක් සඳහා තිරසාර වූ වෙනත් ක්‍රමයක් නොමැති වීම හේතුවය. එහෙයින් ඒ ගැන සලකා බැලීමට සමුපකාර ක්‍රියාකාරිකයින්ගේ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යව පවතී.

සහයෝගිතා අර්ථ ක්‍රමයේ අනන්‍යතාව මුලින් ලතින් ඇමරිකානු රටවල ඇති වූ අතර යුරෝපයේදී එය සමාජ අර්ථ ක්‍රමයක් ලෙස ක්‍රමයෙන් ප්‍රචලිත විය. එය රටක තුන්වන බලවේගය ලෙස සලකන ලදී. ධනවාදීන්ගේ පාලනයෙන් පීඩාවට පත් වැඩ කරන ජනයාට නව ආර්ථික ක්‍රමයක් සහයෝගිතා අර්ථ ක්‍රමයෙන් හඳුන්වා දෙන ලදී. මෙය ඔවුන්ට නිර්ධන පන්ති අරගල හා වැඩ කරන පන්තියේ ඒකාධිපතිත්වය පිළිබඳ මාක්ස්වාදී උපාය මාර්ග සඳහාද විකල්පයක් විය.

ඇන්ග්ලෝ ඇමෙරිකානු රටවල සහයෝගිතා අර්ථ ක්‍රමය සම්භාවිත ධාර්මික (Moral) අර්ථ ක්‍රමය නැවත උද්දීපනය කිරීමක් විය. එහි පිළිබිඹු වුයේ රාජ්‍යයේ අසමත්කම හා වෙළඳ පොලේ ව්‍යුහගත අසමත්කමට (structured market failure) පිළිතුරු සැපයු ක්‍රියාවලියකි.

**සමාජ සහයෝගිතා අර්ථ ක්‍රමය, රාජ්‍යය, වෙළෙඳ පොළ හා ප්‍රජාව සම්බන්ධ කර ගත සම්මිශ්‍රණය වූ මුලධර්ම ඉදිරිපත් කරයි: නැවත බෙදා හැරීම, හුවමාරුව, අන්‍යොන්‍ය උපකාරය (කාල් පොලන්යි)**

ඉතිහාසය තුළ කේවල ලෙස තම සාමාජිකයන් සඳහා වූ සේවා සැපයූ සමුපකාර සමිති දැන් ප්‍රජා සේවා සපයන ආයතන බවට පත් වී තිබේ. (විවිධ සේවා හා සණස සමිති) ආශ්‍රිත සාමාජිකත්වය නිසා ප්‍රජා සහභාගිත්වයද සලකා තිබේ. සමුපකාර ප්‍රතිපත්ති වල ද එහි අනුගත භාවයක් ඇත.

සමාජ සංවිධාන යනු සමාජ ප්‍රශ්න වලට වෙළෙඳ පොළ තුලින් විසඳුම් සොයන ආයතනයකි. එමගින් ආර්ථික හා සමාජ ප්‍රතිසංස්කරණ කරනු ලබයි. අර්බුදයන්ට ලක් වූ ආර්ථිකයන්හි නව නිදහස් අර්ථ ක්‍රමයේ විප්ලවීය වෙනසක් කිරීමේ දේශපාලන නොහැකියාව නිසා එම අර්බුද වලින් ගොඩ ඒම සඳහා සමාජය පදනම් කර ගත් සහභාගී (inclusive) ප්‍රවේශ ක්‍රම ඉදිරිපත් වේ. මෙය විප්ලවීය මාක්ස් චින්තනයට වෙනස් වුවත් ආදී සමාජවාදීන්ගේ චින්තනයට එකඟය.

සහයෝගිතා ආර්ථික උපාය මාර්ගයක් තුළ මූලික ආර්ථික ගැටළු 3 කට පිළිතුරු සපයයි: සමාජ අවශ්‍යතා, නිෂ්පාදන සම්බන්ධතා හා බෙදා හැරීම් යනු ඒවාය. මෙහි උපකල්පන වන්නේ:

- ☐ කිසියම් සමාජයක, කිසියම් අවස්තාවක සමාජ නිෂ්පාදනයේ හා ඒ හා සම්බන්ධ ප්‍රතිඵල නිසා සමාජ අවශ්‍යතා ඇති වීම;
- ☐ නිෂ්පාදන බලවේගවල සංවර්ධනයේ වැඩි වීම සමග සමාජ අවශ්‍යතාද වැඩිවීම;
- ☐ අර්ථ ක්‍රමයක සමාජ අවශ්‍යතාවන්ට අනුපාතික නොවී ලාභ උපරිම කිරීම සඳහා නිෂ්පාදනය යොදා ගැනීම;
- ☐ කිසියම් සමාජයක කිසියම් අවස්ථාවක පුද්ගලනිශ්‍රිත වූ පූර්ණ සංවර්ධනයක් ඇති කිරීමට ධන වාදයෙන් හමු නොවන සැඟවුණු අවශ්‍යතා පැවතීම.

සමාජ හා සහයෝගිතා අර්ථ ක්‍රමයෙන් හුදෙක් ආර්ථික ක්‍රියාවලිය පුනරුත්ථාපනය කර රැකියා නියුක්තිය ඇති කිරීම පමණක් අරමුණු කර ගන්නේ නැත. එය සමාජ අවශ්‍යතා සඳහා වූ නිෂ්පාදනය, ලාභ උපරිම කිරීමේ නිෂ්පාදනයට වඩා ඉහලින් තබයි. නිදසුන් වන්නේ නිෂ්පාදන මාදිලිය තෝරා ගැනීමේදී පරිසරය, දේශගුණික විපර්යාස, සාධාරණ සමාජයක් (ආහාර සකස් කිරීම්, ප්‍රජා සහභාගිත්වයෙන් යුතු කෘෂිකර්මය) ආදී කාරණා සලකා බැලීමය.

සහයෝගිතා අර්ථ ක්‍රමයක නිෂ්පාදන සම්බන්ධතා, ප්‍රධාන වශයෙන් නිෂ්පාදන සාධකයන්හි සාමූහික අයිතිය හා ප්‍රජාතන්ත්‍රවාදී තීරණ ගැනීම් පිළිබඳ වෙනස්කම් අපේක්ෂා කරයි. මෙය පැරණි යුගයේදී යුගෝස්ලාවියාවේ සාර්ථක වූ අතර, ශ්‍රමිකයන්ගේ සමුපකාර පාලනය ආජන්ටිනාවේ ක්‍රියාත්මක වේ.

නව නිෂ්පාදන සම්බන්ධතා මගින් සමාජ අවශ්‍යතා සපුරා ලීම පිණිස, පවතින ධනවාදී හෝ රජයෙන් පාලනය වන වෙළෙඳ පොළ මගින් කටයුතු කළ හැකි නොවේ. අන්‍යොන්‍ය ලෙස බෙදා හදා ගැනීම් සම්බන්ධතා පදනම් කර ගත් නිෂ්පාදන සඳහා ණය ගනුදෙනු කිරීමේ විකල්ප ක්‍රම, යෙදවුම් ද්‍රව්‍ය මිලට ගැනීම හා තම නිෂ්පාදන බෙදා හැරීමේ විවිධ මාධ්‍ය නැති තැන සමාජ හා ආර්ථික ව්‍යවසාය අසාර්ථක වේ. රජය හෝ ධනවාදී වෙළෙඳ පොළ පිළිබඳ අපේක්ෂා කිරීමද අසාර්ථකය. එයින් කුඩා නිෂ්පාදකයන් නැත්තටම නැති වේ.

අර්බුදයකට පසුව සමාජ පරිවර්තන මාදිලියක සැබෑ ශක්තිය පවත්නේ කලබල කළමනාකරණය කිරීම මතය. එය සාර්ථක වන්නේ සියලු දෙනාට ආර්ථික හා සමාජ යුක්තිය සහතික කිරීමෙනි. එම සංහිඳියාව සහයෝගිතා අර්ථ ක්‍රමයේ මූල සාධකයෙකි.

සමාජ හා සහයෝගිතා ආර්ථික උපාය මාර්ගයක ප්‍රධාන අරමුණ විය යුත්තේ දළ දේශීය නිෂ්පාදිතයෙන් වැඩි දායකත්වයක් ලාභය උපරිම කිරීම චේතනාව කර ගත් පුද්ගලික අංශයට වඩා ලබා දීමය. මේ සඳහා පසෙක දමා ඇති නිෂ්පාදන බලවේග සවි බල ගැන්වීම කළ යුතුය. මෙයට පාඩු ලබන හෝ අක්‍රීය රාජ්‍ය සංස්ථා, අතහැර දැමූ ගොවිපලවල්, කර්මාන්තශාලා, සහයෝගිතා උපාය මාර්ග තුලින් සමාජ ආර්ථිකමය අරමුණක් කරා ගෙන යා යුතුය. මෙය ජාත්‍යන්තර ගිවිසුම් හා ණය ක්‍රමවලට සමාන්තරව යා යුතුය. අර්බුදයෙන් කඩා වැටුණු ග්‍රීසියේ කම්කරු අමාත්‍යාංශය විසින් 'social solidarity economy, the development of its agents and other responsibilities (Law No. 4430/2016) නීතිය ක්‍රියාත්මක කළේය. මෙයින් ප්‍රජාතන්ත්‍ර වාදය, සහයෝගිතාව, සමුපකාරය සමග පරිසරය, මිනිස් අයිතියට ගරු කරන පරිදි නිෂ්පාදන බෙදා හැරීම, පාරිභෝජනය හා ප්‍රති ආයෝජනය පිළිබඳ විකල්ප ආදර්ශ හඳුන්වා තිබේ.

සහයෝගිතා අර්ථ ක්‍රමයක් තුළ සමුපකාර සමිති, ඒවායේ සාර ධර්ම, ආචාර ධර්ම හා ප්‍රතිපත්ති පාදක කර ගන්නා නමුදු සම්භාව්‍ය සීමාවලින් එහාට ගොස් ශ්‍රමිකයන්, ගනුදෙනුකරුවන් හා අවදානම දරන්නන්ගේ වගවීම්, විනිවිද භාවය හා නිර්මාණාත්මක කළමනාකරණය සහිත වූ සමාජ ආර්ථික ක්‍රමයක් හඳුන්වා දෙයි (නිද. ඉතාලියේ Emilia-Romagna).

ග්‍රීක නීතිය අනුව සමාජ හා සහයෝගිතා ව්‍යවසායයන් ලෙස ලියාපදිංචි කිරීමේ ක්‍රමයක් ඇති අතර එහි නිර්ණායක මෙසේය:

- සාමූහික ප්‍රතිලාභ වර්ධනය (ලංකාවේ සමුපකාර සමිතිවල සාමාජික නොවන අය සමග කරන ගනුදෙනු වලින් ලැබෙන අතිරික්තය ප්‍රජා වැඩ වලට හෝ සමිති සංවර්ධනයට යොදා ගනී.)
- එක අයෙකුට එක චන්දයක් ඇති ප්‍රජාතන්ත්‍රවාදී පාලනය
- ලාභ විසර්ජන කිරීමේ සීමා ඇති කිරීම
- වියදම් එක්තැන් කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම පලාත් පාලන හෝ වෙනත් රාජ්‍ය අධිකාරයකින් ස්ථාපිත නොවීම හෝ සෘජු හා වක්‍ර ලෙස කළමනාකරණය නොවීම; වෙනත් සහයෝගිතා ආයතන සමග තිරසාර ලෙස ජාලගත වීමෙන් ආර්ථික ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

රටෙහි සමාජ අර්ථ ක්‍රමය තුළ සමාජ හා සහයෝගිතා අර්ථ ක්‍රමයේ විභව භූමිකාව දෘෂ්ටි කෝණ දෙකකින් සලකා බැලිය හැකිය. පළමුව, අර්බුදකාරී අවස්ථාවේදී බලෙන් පටවන ලද ලද පටි තද කිරීමේ සුභ සාධක සීමා පිළිබඳ සහන සැලසීම සමාජ හා සහයෝගිතා ව්‍යවසාය මගින් කළ හැකිය. දෙවනුව, ලාභය පදනම් කර ගත් ධනවාදී ව්‍යවසාය විසින් සාදා ඇති හිඩැස පිරවීමෙන් ආර්ථිකය ප්‍රතිශෝධනය කිරීම හා රජයේ සැලසුම්වලට එමගින් සහාය වීම කළ හැකිය. නිද: වෙනිසියුලාවේ 2003-204 දරන ජනාධිපති ආඥාව මගින් රජයේ ආයතනවලට කරන මිලදී ගැනීම් අදාළ සමුපකාර වලින් හා සුළු පරිමාන නිෂ්පාදකයන්ගෙන් කළ යුතු බවට පැනවීමක්

කර තිබේ. මෙයින් විවෘත වෙළඳ පොලේ පුද්ගලික සමාගම් සමග සම තත්වයේ තරඟ කිරීමකට ඉඩ ලැබේ. එයින් රජයේ සුභ සාධක ප්‍රතිපත්තිවලට දායකත්වය ලැබේ.

සමාජ හා සහයෝගිතා ව්‍යවසායවලට රජය විසින් උදව් කළ හැක්කේ වෙළෙඳ බදුවලින් එම සේවා නිදහස් කිරීමෙනි. (නිදඃ ජපානය) සාමාජිකයන් සමග පමණක් ගනුදෙනු කරන සමුපකාරවලට බදු නීතිය බල නොපාන්නේ ඔවුන් වෙළඳාමක් නොකරන නිසාය.

පළාත් පාලන ආයතන හා සමාජ හා සහයෝගිතා ව්‍යවසාය අතර වැඩ සටහන් තුළ හවුල් වැඩ සටහන් දියත් කළ හැකිය. (ප්‍රතිචක්‍රීයකරණය සංචාරක කටයුතු, වැඩිහිටි නිවාස, බෙදා හැරීම් ආදිය.) ඉන්දියාවේ මේව ග්‍රාම් සභා හා පන්චායත් සමග කරන හවුල් වැඩ සටහන් වලින් සිදු වේ. 2010 දී යුරෝපා කොමිසම රාජ්‍ය ආයතන වල මිලදී ගැනීම් වලදී සලකා බැලිය යුතු සමාජ සලකා බැලීම් පිළිබඳ මග පෙන්වීමක් නිකුත් කර තිබේ.

- රැකියා ජනනය
- ශිෂ්ට සම්පන්න රැකියා
- සමාජ හා කම්කරු අයිතිඅලට අනුගත වීම
- ආබාධිතයන්ගේ සමාජ අන්තර් ග්‍රහණය
- සම අවස්ථා ඇති කිරීම් සඳහා පුහුණුව
- සෑම දෙනා සඳහාම සැලසුම් කර ඇති බව
- තිරසාර වූ නිර්ණායක
- සාධාරණ වෙළඳ හැසිරීම
- සමාජ වගකීම
- පරිසර සංරක්ෂණය

දකුණු කොරියාව පළාත් පාලන ආයතන හා සමාජ ව්‍යවසාය සම්බන්ධ වූ ප්‍රාදේශික උපාය මාර්ගික ව්‍යාපෘති පවත්වා ගෙන යයි. උදාඃ අයි කෝප්; මෙය රජයේ ව්‍යාපෘති හරහා සමුපකාරය මගින් ක්‍රියාත්මකය. මෙයින් පළාත් පාලන ආයතන, සමාජ සහයෝගිතා ව්‍යවසාය හා සිවිල් සමාජය ඒකාබද්ධ වේ. එමගින් පුද්ගල අභිලාශ, සාමූහික අභිලාශ සමග අන්තර්ග්‍රහණය කරනු ලබයි.

සහයෝගිතා අර්ථ ක්‍රමය යනු එක්තරා ආර්ථික අංශයක් නොව සියලු අර්ථ ක්‍රමවල ක්‍රියාකාරකම් පොදු අරමුණක් සඳහා එක් කරන ක්‍රියා පද්ධතියකි.

ව්‍යවහාරික ශාස්ත්‍රීය සංග්‍රහය
ISSN 2961-5003 (Print) | ISSN 3121-3472 (e-Version)

ISSN 2961-5003 ISSN 3121-3472

**3 වෙළුම, ii වන නිකුතුව - 2025 ජූලි-දෙසැම්බර්**
පත්‍රිකා අංක 03

---

# ඉන්දියාවේ පූනේ හි ස්වාච් (SWaCH) කසළ එක්රැස්කිරීමේ සමුපකාර සමිතිය: ප්‍රජා සවිබලගැන්වීම පිළිබඳ ප්‍රබල අත්දැකීමක් ලෙස හා එකී අත්දැකීම් ශ්‍රී ලාංකේය සංදර්භයට ගලපා ගැනීම

---

වසන්තා කුමුදුනී වර්ණකුලසූරිය[9]
wkwarnakulasooriya@gmail.com

ප්‍රභාත් ගලගමගේ[10]
prabath.nicdstaff@gmail.com

---

**සාරසංක්ෂේපය**

ඉන්දියාවේ පූනේ නගරයේ ක්‍රියාත්මක වන SWaCH සමුපකාර සමිතිය, ආන්තීකරණයට ලක්වූ (විශේෂයෙන්ම කාන්තාවන්) කසළ එක්රැස්කරන්නන් සවිබල ගැන්වීම සඳහා සාර්ථක සමුපකාර ආදර්ශයක් සපයයි. කම්කරු සමුපකාර සමිතියක් ලෙස සංවිධානය වීම හරහා ඔවුන් ආර්ථික ස්වාධීනත්වය, විධිමත් ප්‍රතිලාභ සහ පෙර ස්ථිපිත මට්ටමට සාපේක්ෂව ඉහළ සමාජ තත්ත්වයක් අත්කර ගැනීමට සමත්ව ඇත. මේ අනුව මෙම සාර්ථකත්වය, කසළ එක්රැස්කරන්නන් දැඩි ලෙස සමාජ බැහැර කිරීමට ලක්වන ශ්‍රී ලංකාවට වැදගත් ප්‍රතිපත්තිමය මගපෙන්වීම් ලබා දෙයි.

**මූල පදඃ** කසළ කළමනාකරණය, සමුපකාර සමිතිය, ප්‍රජා සවිබලගැන්වීම, අනියම් අංශය, කාන්තාවන් සවිබල ගැන්වීම

---

[9] සමුපකාර සංවර්ධන නිලධාරී, දකුණු පලාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | Diploma in Co-operative Development, B.Sc (Business Administration) (USJ), Master of Business Management (MBM )(UoR)

[10] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය | Diploma in Co-operative Development, B.A (sp), M.A, M.Phil

**ප්‍රවේශය**

තෙවන ලොව රටවල, විශේෂයෙන්ම ලතින් ඇමරිකානු හා ආසියානු කලාපයේ තෙවන ලොව රටවල ප්‍රධාන සමාජ ප්‍රශ්නයක් බවට කසළ ප්‍රශ්නය පත්වෙමින් තිබීමද දැකගත හැකිය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවන්නේ ශ්‍රීඝ්‍ර ජනගහන වර්ධනය, ගමෙන් නගරයට වන ඉහළ ජනසංක්‍රමනය, ශ්‍රීඝ්‍ර නාගරීකරණය ආදී කාරණායි. සාමාන්‍යයෙන් මෙම ජනපද ව්‍යාප්තිය සිදුවන්නේ සැලසුමකින් තොරවයි. එය එක් අතකින් මුඩුක්කු හා අඩු පහසුකම් සහිත ජනපද ඇතිවීමට ද බලපානු ලබයි. නාගරික පරිසරයක් ගතහොත් එහි පර්යන්තයේ විශාල කොටසක්ද, අභ්‍යන්තරයේ සැලකිය යුතු කොටසක්ද අත්පත්කරගන්නේ මුඩුක්කු ප්‍රදේශයි. මෙය දගර වැටුණු හා පටු මාවත් ඇතිවීමටද, එසේම ගංගා රක්ෂිත, තෙත් බිම්, කලපු, ජල ගැල්මට ලක්වන ප්‍රදේශ, අධි බෑවුම් හා වෙනත් ව්‍යවසනවලට ලක්විය හැකි ජීවත් වීමට නුසුදුසු ප්‍රදේශ බොහෝවිට මෙම මුඩුක්කු වැඩි වශයෙන් බිහිවීම දැකගත හැකිය. නොදියුණු රටවල නගරවල භෞතික ගති ලක්ෂණ වන්නේ මෙම ශ්‍රීඝ්‍ර නාගරික ප්‍රසාරණයට ගැලපෙන ලෙස යටිතල පහසුකම් සැපයීමේ නොහැකියාවයි. ඉන් ප්‍රධාන එකක් වන්නේ අවිධිමත්ව බැහැර කෙරෙන කසළ සඳහා පූර්ණ විසඳුමක් නොමැති වීමයි. මෙසේ අවිධිමත්ව කසළ බැහැර කිරීම භූමිය, ජලය හා වායු දූෂණයට හේතුවෙයි. තෙවන ලෝකයේ රටවල් සාමාන්‍යයෙන් නිපදවෙන කසළ වලින් එකතු කරනුයේ 50-80% දක්වා ප්‍රමාණයක් පමණි. මේ සමාජ ගැටලුව සාකච්ඡා කරන විට ලතින් ඇමරිකානු හා ආසියානු සන්දර්භයේදී මේ සඳහා පැමිණෙන විසඳුමක් ලෙස කසළ එකතුකිරීමේ නිරතව සිටින වෘත්තිකයින් එකමුතුව තනුණු ලැබූ සමුපකාර සමිති පිළිබඳව අවධානය යොමු කිරීමට අනිවාර්යයෙන් සිදුවෙයි.

කසළ එකතු කිරීම සැලකෙන්නේ පහත් වෘත්තියක් ලෙසයි. ලොව පුරාම තත්වය එයයි. ඒ අනුව ඉතා තියුණු සමාජ හා පාරිසරික ප්‍රශ්නයකට විසඳුම් ලබාදෙන ගමන්ම, ප්‍රජාව සවිබලගැන්වීම පිළිබඳ සාකච්ඡා කරන විට ලොව පුරා විසිරී පවතින කසළ එකතුකිරීමේ නිරත ශ්‍රමිකයින්ගේ සමුපකාර සමිති බල රහිත ප්‍රජාවක් යම් මට්ටමක බල සහිත ප්‍රජාවක් බවට පරිවර්තනයෙහි ලා කැපී පෙනෙන සුළු මෙහෙයක් ඉටු කර ඇති ආකාරය සිද්ධි අධ්‍යයන රැසක් ඔස්සේ හඳුනා ගත හැකිය. එසේම කසළ එකතු කිරීම සිදු කරන අති බහුතරය කාන්තාවන්ය. එය හුදෙක් බල රහිත ප්‍රජාවක් සවිබල ගැන්විමෙන් එහාට යන, කාන්තාවන් සවිබලගැන්විම දෙසට ගමන් කරන කාර්යයකි. පහතින් සාකච්ඡා වන්නේ ශ්‍රී ලංකාවට ආසන්නතම ඉන්දීය උදාහරණයකි. එය ලොව විශාලතම එවැනි වර්ගයේ සමුපකාර සමිතියද වෙයි.

## KKPKP සහ SWaCH

1993දී පුනේ හි කසළ ඇහිදින්නියන් සහ කසළ එකතු කිරීම හා සම්බන්ධිතව කටයුතු කරන සෙසු පුද්ගල කණ්ඩායම් කගාඩ් කාච් පාත්‍ර කෂ්ත්‍ර-කාරී පන්චායත් (Kagad Kach Patra Kashta-kari Panchayat - KKPKP) ලෙස වන වෘත්තීය සමිතියක් පිහිටුවා ගන්නා ලදී. මෙම KKPKP කසළ ඇහිදින්නියන්ගේ වෘත්තීය සමිතිය ලෙස පුළුල් මෙහෙවරකට දායක විය. මෙම KKPKP සංවිධානයේ මෙහෙයවීමෙන් 2007 වර්ෂයේදී පූර්ණ කම්කරු අයිතිය යටතේ ඇති

කසළ එකතුකරන්නන්ගේ සමුපකාර සමිතියක් පිහිටුවන ලදී. එහි සාමාජිකත්වය කසළ ඇහිදින්නියන්, සංචාරක කසළ මිලට ගන්නන්, කසළ රැස්කරන්නන් ඇතුළු නාගරික දුගීන්ගෙන් සමන්විත විය. මෙම සමුපකාර සමිතිය SWaCH ලෙස නම් කරනු ලැබූ අතර එය Solid Waste Collection Handling යන්නට අක්නමක් (acronym) විය. SWaCH සේවා සහකාරි සංස්ථා මරයාදිත් (Seva Sahakari Sanstha Maryadit) ලෙස දේශීය බසින් මෙම සමුපකාරය හඳුන්වන ලදී.

පූනේ ඉන්දියාවේ නමවන විශාලතම නගරයයි. ඓතිහාසිකව ගත්කළ පූනේ හැඳින්වෙන්නේ නිදිබර විශ්‍රාමික නගරයක් ලෙසයි. නමුත් පසුගිය දශක ද්විත්වය තුළ සංක්‍රමණ ඔස්සේ පූනේ හි ජන ඝනත්වය ඉතා ඉහළ මට්ටමකට එසවිණි. පූනේ හි ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් සමන්විත වන්නේ තොරතුරු තාක්ෂණය, ජීව-තාක්ෂණය, නිෂ්පාදන කර්මාන්ත හා අධ්‍යාපනය මගිනි. ප්‍රතිචක්‍රීකරණ වෙළෙඳ පොළ සඳහා ද හොඳ ඉඩ කඩක් පවතින ප්‍රදේශයක් ලෙස පූනේ හැඳිනගත හැකිය. මෙම වෙළෙඳ පොළේ ඉහළම මට්ටම අධි තාක්ෂණික කර්මාන්ත නියෝජනය වන විට, එහි පහළම ප්‍රදේශය නියෝජනය වන්නේ කසළ එකතු කරන්නියන්ගෙන් හා සංචාරක කසළ මිලට ගන්නන්ගෙනි.

**KKPKP ගොඩනගා ගැනීම**

පෙරදී ද දක්වා ඇති ආකාරයට SWaCH සමුපකාරය සඳහා මාවත විවර වන්නේ KKPKP වෘත්තීය සමිතිය හරහායි. 1993 දී 800ක ප්‍රමාණයක කසළ ඇහිදින්නියන් / ඇහිදින්නන් එකතුවී සම්මත කරගත් ව්‍යවස්ථාවක් ඔස්සේ මෙම KKPKP වෘත්තීය සමිතිය බිහිවෙයි. මෙය කැලි කසළ සම්බන්ධ රැකියාවන්හි නිරත වන මිනිසුන් නොසලකා හැරීමට, අඩු වැටුප් ගෙවීමට විරුද්ධව, හිරිහැරයට ලක් කිරීමට එරෙහිව කටයුතු කරනු ලැබිණි. කසළ වල ඇති ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කොටස් වෙන්කොට, වර්ග කොට ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමටද KKPKPය කටයුතු කරනු ලැබිණි. කසළ කළමනාකරණය යනු පුළුල් කටයුත්තකි. එසේම පූනේ මහ නගර සභාව මෙම අවිධිමත් කසළ එකතුකිරීමේ ක්‍රමය ඔස්සේද ප්‍රතිලාභ ලැබුවේ, එය මහ නගර සභාවක් විසින් සැපයිය යුතු ප්‍රධාන සේවාවක් අවිධිමත් අංශයක් විසින් සිදුකිරීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. මේ අනුව කසළ ඇහිදින්නියන් (හා ඇහිදින්නන්) මහනගර සභා සේවකයින් නොවුණු අතර, ඔවුන් ස්වයං රැකියාවක නිරත වන්නන් විය. ඔවුන් කසළ එකතු කිරීම, වෙන් කිරීම, කොටස් වලට කැඩීම, පිළිවෙලකට සැකසීම, සමහර අවස්ථාවල අවශ්‍ය නම් සේදීම යන කාර්යයන්ට සිය ශ්‍රමය යෙදීම ඔස්සේ ඒවා ප්‍රතිචක්‍රීකරණයට අවශ්‍ය අමුද්‍රව්‍ය බවට ඒවා පත්කරන ලදී. මෙය මහ නගර සභාවට කිසිදු මුදලක් වැය නොවී නොමිලයේ ලැබෙන සේවාවක්ද විය. එසේම ප්‍රතිචක්‍රීකරණ කර්මාන්තයේ සැපයුම් දාමයේ අත්‍යවශ්‍ය කොටසක් ලෙසද මෙම කසළ ඇහිදින්නියන් සැලකිය හැකිය. ඔවුහු ජාතික ඵලදායීතාවයේ හා ආදායමට දායක වන්නෝය. තවත් කෝණයකින් බලන විට පෙනී යන්නේ කසළ ඇහිදින ජනතාව ආර්ථිකමය වශයෙන් අන්ත දුගීන්ම ලෙස සැලකිය නොහැකි වන නමුත් ඔවුන් සමාජීයව බැහැර කර තිබීම හා නාගරික ජනතාව අතරින් නොසලකා හැරීම් වලට

ලක්කර ඇති ජන කොටසක් වන බවයි. කෙසේ නමුත් පූනේ මහ නගර සභාව කසළ එකතුකරන්නන්ට අනන්‍යතා පත්‍රයක් ලබා දෙමින් ඔවුන්ගේ කටයුත්ත සඳහා අධිකාරී බලයක් ලබාදුන් පළමු ඉන්දිය මහ නගර සභාවයි.

KKPKP සභාපතිවරයා වන මොහාන් සෙල්වරාම් (Mohan Savlaram Nanavre) ඔහුගේ ළමාවිය සිහිපත්කරමින් දක්වන්නේ ඔහුගේ මව හා මවගේ සහෝදරිය යන දෙදෙනාම කසළ ඇහිදින්නියන් වූ බවත්, ඔවුන් මහන්සිවී වැඩකළ කම්කරුවන් වූ බවත්, ඔවුන් කිසි විටෙක කිසිදු දෙයක් සොරා නොගත් බවත්ය. නමුත් මහජනයා ඔවුන් දෙස බැලුවේ සොරුන් ලෙස බවයි. ඒ අනුව මවගේ සහෝදරිය තෙවරක් සොරකම් කිරීමේ චෝදනාව මත පොලීසිය විසින් අත් අඩංගුවට ගන්නා ලදී මව පවසන සෙල්වරාම් තවදුරටත් දක්වන්නේ කසළ ඇහිදින්නියන් නිරන්තරයෙන් පොලීසිය පිළිබඳ දැඩි බයකින් පෙලුන් බවයි (Bhaskar & Chikarmane, 2012).

**සේවා කොන්දේසි හා නගරයට කෙරෙන දායකත්වය**

දශක ද්විත්වයකට වඩා වැඩි කාලයක් KKPKPය ශාස්ත්‍රාලයීය ආයතන සහ වෙනත් නියෝජිතායතන සමඟ කටයුතු කරමින් කම්කරුවන්ගේ සේවා කොන්දේසි ලේඛනගත කිරීමට කටයුතු කළේය. මෙම පර්යේෂණ මගින් සනාථ වූයේ සෑම මසකම පූනේ නගර සභාවට කසළ එකතුකරන්නන් විසින් ඇමරිකානු ඩොලර් 5ක ශ්‍රමයක් නොමිලයේ සපයන බවයි. ඇමරිකානු ඩොලර් 316,455 ක කසළ ප්‍රවාහන පිරිවැයක් මහ නගර සභාවට මේ අනුව ඉතිරිවෙයි. වාර්ෂිකව කසළ ඇහිදින්නන් වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 2.25 ක් උපයයි. වාර්ෂිකව ටොන් 118,000 ක කසළ මෙම අසංවිධිත අංශය මගින් ආවරණය කරයි. එසේම දළ පාරිසරික ප්‍රතිලාභයේ අගය ඇමරිකානු ඩොලර් 3,615,900 කි. මෙම අනාවරණයන් ඔවුන්ට යම් යම් ප්‍රතිලාභ ගෙනෙනු ලැබිණි. මහනගර සභා අයවැය ඔස්සේ වෛද්‍ය රක්ෂණාවරණයක් ලබා දීම එකකි. SWaCH සමුපකාරය සඳහා සහයෝගය ලබා දීම අනෙකයි. SWaCH සමුපකාරය සඳහා නගරයේ ඉඩකඩක් ලබා දීම තවත් එකකි. මේ අනුව කසළ එක්රැස්කරන්නන්ගේ සමුපකාරය (SWaCH) බිහිවන්නේ KKPKP වෘත්තීය සමිතියේ ප්‍රබල දායකත්වයක් තුළිනි (Bhowmik, 2006). SWaCH හි සාමාජිකත්වය සියලු දෙනාටම විවෘත වුවද එහි ප්‍රමුඛත්වය ලැබුනේ KKPKP සාමාජිකයන්ටයි. අනතුරුව අවස්ථාව හිමිවූ අනෙක් කණ්ඩායම වූයේ පහළ දරිද්‍රතා මට්ටම නියෝජනය කරන සමාජ තීරුවටයි.

බොහෝ කසළ ඇහිදින්නියන් / ඇහිදින්නන් දාලිත් හෙවත් අස්පර්ෂණීය කුල පසුබිම් සහිතය. කුලවාදී බවින් ඉහළ ඉන්දිය සමාජය තුළ මෙම කුල ස්ථරායනයේ පතුල නියෝජනය කරන ජන කොටස් සඳහා පවතින්නේ ඉතා පහත් සැලකීමකි. ඉන්දීය රජය මෙම කුල කණ්ඩායම් උපලේඛන ගත කුල (Scheduled Caste - SC) ලෙස නිර්වචනය කර වර්ගීකරණයකට භාජනය කර ඇත්තේද මෙම පීඩිත පරිසරය සලකායි. පර්යේෂණ පෙන්වා දෙන්නේ සමාජයේ බොහෝ පහත් යැයි සලකන වෘත්තීන්හි නිරත වන්නේ මෙම කුල කණ්ඩායම් බවයි. ඔවුන් ජීවත්වන්නේ සමාජයේ වාටියේය. පොදු සමාජීය තීරණ ගැනීමේ ක්‍රියාවලියට, පොදු සමාජීය

ජීවිතයට, සමාජීය කටයුතු වලට හා එවැනි අවස්ථා සම්පාදනය වන ආයතන වලට මෙම කුල කණ්ඩායම් අවශෝෂණය කර ගන්නේ නැත. මේ අනුව මෙම කුල කණ්ඩායම් දැඩි ලෙස බලය අහිමි කරනු ලැබූ කොටසක් බව පැහැදිලිය මෙම තත්වය සමනයටද KKPKPයේ හා SWaCH සමුපකාරය උපකාරී විය. SWaCH සමුපකාරය සිය සාමාජිකයින්ට නිල ඇඳුමක් හඳුන්වා දුනි. එය සේවා සම්පාදකයෙක් වශයෙන් කම්කරුවා ස්ථාපිත කිරීමට අපකාරී වෙයි. SWaCH සාමාජිකයින් ව්‍යවසායකත්මක කම්කරු බලකායක් ලෙස නිර්මාණය කරන ලද අතර, ඔවුන් ස්වයංව වගවීමට පුහුණු කරන ලදී. එසේම ඔවුන්ට පාරිභෝගික සබඳතාව පිළිබඳවද පුහුණුවක් ලබාදුනි. ඔවුන් සමුපකාර සමිතියක් ලෙස සංවිධාන ගතවීම හා විධිමත් පුහුණුවකට භාජනය කිරීම ඔස්සේ ඔවුන්ගේ මෘදු කුසලතා සංවර්ධනය මත කුණු එකතුකරනු ලබන නිවැසියන් සමඟ සමාජ ස්ථරායනාත්මක පරතරය පෙරට වඩා සාපේක්ෂව අඩුකර ගෙන කටයුතු කිරීමේ හැකියාව ලැබිණි. නැතිනම් ඔවුන් ව සැලකුම් ලැබුවේද කසළ හා සමාන තත්වයෙනි. එපමණක්ද නොව අසල්වැසියන් සමඟ යම් මට්ටමක සමානාත්මතා සම්බන්ධයක් පවත්වා ගැනීමටද මෙම සංවිධානාත්මක බව කසළ එකතුකරන්නියන්ට ඉවහල් විය.

එසේම මෙම කසළ එකතුකරන ජනයාගේ හා එම කුල කණ්ඩායමේ සෙසු ජනයාගේ දරුවන්ට පාසල් තුළ ලැබෙන ගර්හිත සැලකුම් නතර කිරීමටද KKPKPයේ හා SWaCHහි කටයුතු දායක වුනි. එසේම ළමා කසළ ඇහිදිනන් එම තත්වයෙන් මුදවා ළමා ශ්‍රමය නතර කිරීමට මෙන්ම ඔවුන් අධ්‍යාපනයට යොමු කිරීමේ කාර්යයටද මෙම සංවිධාන උර දුන්නේය. ඒ අනුව අධ්‍යාපනය ලබන්නන්ගේ පළමු පරම්මරාව පිලිවෙලකට ඇඳුම් නොඇඳීම හෝ ඉරීගිය ඇඳුම් ඇඳීම මත පාසලෙන් නැවත නිවසට එවනු ලැබිණි. ඔවුන් හඩ නැගීමට පටන් ගත්විට ඔවුන්ගේ නිල ඇඳුම් හා පෙල පොත් මහ නගර සභාවේ පාසල් පද්ධතිය විසින් සපයනු ලැබිණි. මේ හා සමානව ප්‍රතිරෝධයකට සෞඛ්‍ය හා රෝහල් පහසුකම් වැනි පොදු සේවා වලට ප්‍රවේශ විමේදී ද කසළ එකතුකරන ජනයා මුහුණ දෙනු ලබයි. එසේම ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ ඇසට අසංවිධිත අංශයක් වූ කසළ ඇහිදින්නියන් හසු නොවී පැවතිනි. ඒ අනුව මහ නගර සභාවේ සිට ජාතික සංවාද දක්වා සියලු තලයන්හිදී, අයවැය තුළදී, නීති හා රෙගුලාසි සම්පාදනයේදී මෙම පිරිස අමතක කෙරිණි. මෙම තත්වය යම් මට්ටමකට සමනය වන්නේද ඔවුන් සංවිධානය වන තත්වය තුළදීය.

**SWaCH ව්‍යුහය හා සංවිධානය**

2007 වසරේදී බිහිවන SWaCH සමුපකාරය පූනේ මහ නගර සභාව සමග 2008 වසරේදී අවබෝධතා ගිවිසුමකට ඇතුළත් වෙයි. ස්වාච් ශ්‍රමික සමුපකාර සමිතියකි (workers' cooperative). එය සාමාජික බලය මත මූලිකව පදනම්ව ඇත. සියලු සාමාජිකයෝ සමිතියේ සේවය කරනු ලබයි. ඒ අනුව ඔවුන් හුදෙක් කොටස් හිමියන් පමණක් වන්නේ නැත. 78%ක සාමාජිකත්වය කාන්තාවන්ය. එසේම සියලු වයස් කාණ්ඩ නියෝජනය වන සාමාජිකයින් එහි දක්නට ඇත. මෙම සාමාජිකයින් අතරින් වැඩිම පිරිස අස්පර්ෂණීය ලෙස සැලකෙන කුල කණ්ඩායම්වලට අයත්ය. අස්පර්ෂණීය කුල කණ්ඩායම් හැරුණු විට වෙනත් පසුගාමී කුල

කණ්ඩායම්ද මෙහි නියෝජනය වෙයි. යම් ප්‍රමාණයකින් මධ්‍යම මට්ටමේ ස්ථරායන දරන කුල කණ්ඩායම් වල සාමාජිකයින්ද මෙම සමුපකාරය නියෝජනය කරයි.

SWaCH අතුරු ව්‍යවස්ථා අනුව එහි සාමාජිකයින්ගෙන් හතරෙන් තුනක් හා පාලක මණ්ඩල වල නියෝජනයෙන් තුනෙන් දෙකක් කාන්තාවන්ට හිමිවිය යුතුවෙයි. ස්ත්‍රී පුරුෂ බව හා කසළ එකතු කිරීම අතර ඍජු සබඳතාවක් දැකිය හැකිය. මේ අනුව කසළ එකතු කිරීම සිදු කරනු ලබන පිරිසෙන් වැඩි ප්‍රතිශතය කන්තාවන්ය. මෙම තත්වය SWaCH පාලක මණ්ඩල වල සංයුතිය තැනීමේදී සලකා බලා ඇති බව පෙනී යයි . SWaCH සාමාජිකයින් 14 දෙනෙකුගෙන් යුත් පාලක මණ්ඩලයක් සිටියි. එහි සංයුතිය KKPKPය නියෝජනනය කරන එක් අයෙකු හා පූනේ මහ නගර සභාව නියෝජනය කරන දෙදෙනෙකු ලෙස බාහිර නියෝජිතයන් 03කින් ද සමන්විතයි. එසේම කෝති සභා (Kothi councils) ලෙස හැඳින්වෙන ප්‍රාදේශීය පරිපාලන ඒකක හා කොට්ඨාස සභා (Ward council) ලෙස හැඳින්වෙන පරිපාලන ඒකක ප්‍රාථමික මට්ටමේදී කම්කරුවන් නියෝජනය කරන අතර, ඔවුන් මාසිකව හමුවීම සිදුවෙයි. SWaCH ප්‍රධාන අරමුණු දෙකක් දරයි. පළමුවැන්න වන්නේ දෛනික කසළ කළමනාකරණ කාර්යයිනහි නිරත වීමයි. දෙවැන්න කසළ කම්කරුවන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමයි. සමිතියේ සේවක මණ්ඩලය නියෝජනය කරන කළමනාකරුවන් වැඩි ප්‍රමාණයක් හැඳින්විය හැක්කේ “පාවහන් රහිත කළමනාකරුවන්” ලෙසයි. ඔවුන් කළමනාකරුවන් ලෙස පුහුණු වන්නේ රැකියාවේ නිරතවෙන අතර තුරයි. අනෙක් කොටස නියෝජනය වන්නේ විවිධ සමාජ පසුබිම් නියෝජනය කෙරෙන උපාධි මට්ටම දක්වා අධ්‍යාපනය ලැබූ පිරිස් වලිනි.

SWaCH සාමාජිකයෝ එකතු කරනු ලබන කසළ වලින් ප්‍රතිචක්‍රීකරණයට භාජය කළ හැකි කොටස වෙන්කරගෙන ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි කොටස මහ නගර සභාවේ කසළ ප්‍රවාහන රථයට ලබා දීම සිදුවෙයි. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අමුද්‍රව්‍ය විකිනීම ඔවින් විසින් සිදු කරන අතර, සමහර සාමාජිකයෝ හොඳ මිලක් ලැබෙන තුරු ඒවා ගබඩා කර තබා ගනිති. එසේම SWaCH හි පාරිභෝගිකයින් නියෝජනය කරන සිවිල් සංවිධාන සමඟ එය සබඳතා පවත්වා ගනියි. පාරිභෝගික තෘප්තිය ඇතිවන ලෙස කටයුතු මෙහෙයවීමට උත්සාහ කරයි. එසේම ගනුදෙනු කරුවන්ට කසළ හා සම්බන්ධ අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීමටද SWaCH කටයුතු කරයි. එසේම ගනුදෙනු කරුවන්ට දුරකථන මගින් SWaCH හා සම්බන්ධවීමට පහසුකම් සැපයීමට මෙන්ම සාමාජිකයින්ට SWaCH හා දුරකථන මගින් සම්බන්ධවීමේ පහසුකමද ආයතනය සලසා ඇත.

SWaCH සාමාජිකයින්ට ජීවිත හා වෛද්‍ය රක්ෂණයක් හා මරණය සහ ආබාධිත බවකදී ප්‍රතිලාභද, මහ නගර සභාව විශ්‍රාම වැටුපක් සඳහා එකඟ වීමක්ද දැකගත හැකියි. එසේම කාන්තාවන් බහුතරයක් වන හෙයින්, එම කාන්තාවන් මේ අනුව පවුලේ පරිමි පාර්ෂවයට අමතරව පවුලේ කටයුතු සඳහා උරදෙනු ලබයි. එසේම කාන්තාවන්ට ආර්ථික ස්වාධීනත්වයක් ද හිමිවීම සිදුවෙයි. සමුපකාර ආකෘතියට සංවිධානය වීම මත සමාජීය සුරක්ෂිත තාවක් අත්වන

අතරම, ආර්ථික ස්වාධීනත්වයක් හිමිවීම මත පවුල තුළ සාම්ප්‍රදායික පුරුෂාධිපත්‍යයට සම්පූර්ණයෙන්ම යටත් නොවී සිටීමේ අවකාශද ඇයට හිමිවෙයි.

**අභියෝග**

SWaCH සමුපකාරයට අභියෝගද පවතියි. සියලු නගරවාසීන් කසළ බැහැර කිරීමට ගාස්තුවක් ගෙවීම ගැන සතුටු නැත. ඔවුන් තර්ක කරන්නේ තමුන් නගර සභාවට බදු ගෙවනු ලබන බවයි. ඒ අනුව කසළ බැහැර කිරීම නගර සභාවේ වගකීමක් බව ඔවුන්ගේ මතයයි. මේ නිසා සමහර ගනුදෙනුකරුවන්ට මේ ගෙවීම් කරනුයේ සේවාවකට බව ඒත්තු ගැන්වීම් අපහසුතාවක් ඇත. මුඩුක්කු හා අඩු ආදායම් ලාභී ප්‍රජාවන් වෙසෙන ප්‍රදේශ පවිත්‍ර කිරීම සඳහා පූනේ මහ නගර සභාව ගෙවීම් කිරීමට නියමිත නමුත්, එම ආයතනය ඒ සඳහා ප්‍රමාණවත් තරම් මුදල් යෙදවීමට පසුබට වෙයි. මේ නිසා මුඩුක්කු හා අඩු ආදායම් ලාභී ප්‍රදේශ ප්‍රමාණවත් තරම් පවිත්‍ර කර නැතැයි යන චෝදනාවටද SWaCH ලක්වෙයි.

**ශ්‍රී ලංකාවට උකහා ගතහැකි අත්දැකීම්**

ඉන්දියාව ගත්විට අඩු ආදායම් ලාභී හා සමාජීය පිටමංකරණයට ලක්වූ ප්‍රජාවන් පිළිබඳ වඩා වැඩි සැලකිල්ලක් හා ඔවුන් සවිබලගැන්වීමට ප්‍රබල දායකත්වයක් සපයන බවට ඉගි SWaCH සමුපකාරය හරහා ලැබෙයි. ශ්‍රී ලංකාවේ ද මෙම වෘත්තීන් තුළ නිරත වන්නේ සමාජයේ දරිද්‍ර කොටස් වන අතර, ඔවුන් විශාල සමාගම් වල ලාභ උපරිමකරණය යටතේ සූරාකෑම්ට ලක්වෙයි. උදාහරණ ලෙස මහනුවර මහයියාව ප්‍රදේශය මෙම කාණ්ඩයට අයත් විශාල පිරිසක් හමුවන තැනකි.

විශේෂයෙන්ම කසල කළමනාකරණ ක්ෂේත්‍රයේ නියැලෙන අනියම් කම්කරුවන් බලය හා ආධිපත්‍යය හමුවේ පීඩනයට පත්වන බව රන්දිකා ජයසිංහ, මයිකල් අසාරියාඩිස් සහ කැරොලයින් බේලි ඔවුන්ගේ “කසළ, බලය සහ ආධිපත්‍යය: ශ්‍රී ලංකාවේ කසළ පරිසරය පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණයක්” (Waste, Power, and Hegemony: A Critical Analysis of the Wastescape of Sri Lanka) නමින් පළකළ පත්‍රිකාව තුළින් විශ්ලේෂණයක යෙදෙයි. ඔවුන් එම පත්‍රිකාව ඔස්සේ මිෂෙල් ෆුකෝ, අන්ටෝනියෝ ග්‍රාම්ස්චි ගේ අනියම් කසළ කළමනාකරණ අංශයේ (informal waste sector) තුළ ඇති ගැටලු ගෙනහැර දක්වයි.

- **ආන්තිකකරණය (Marginalization) සහ බැහැර කිරීම (Exclusion):** විධිමත් කසළ කළමනාකරණ ක්‍රියාවලීන් සහ විශේෂඥ දැනුම පිළිබඳ කතිකාවන් මගින් අනියම් කසළ අංශයේ භාවිතයන් සහ දැනුම ආන්තිකකරණය කරනු ලැබේ.
- **බලහත්කාරය සහ විරසක වීම (Coercion and Alienation):** කසළ කළමනාකරණයේ ප්‍රමුඛ ආකෘතිය තුළ අනාවරණය වූ එක් තේමාවක් ලෙස බලහත්කාරය සහ විරසක වීම දැක්වේ.

- **සමාජීය සහ ආර්ථික වටිනාකම නොසලකා හැරීම:** අනියම් කසළ සේවකයන්, නාගරික අපද්‍රව්‍ය පරිසරයට වටිනා දායකත්වයක් සපයන අය ලෙස හඳුනා ගැනීම වෙනුවට, පිටස්තර කිරීම, බලහත්කාරය සහ බැහැර කිරීම් වලට ලක් කෙරේ. ඔවුන්ට වඩාත් අවශ්‍ය ආදායම් මාර්ගයක් සැපයීමේ හැකියාව මෙමගින් නොසලකා හරියි.
- **බලය පිළිබඳ ගතිකත්වය (Power Dynamics):** ප්‍රබල ආණ්ඩුක්‍රමික ආකෘතිය කසළ අංශයේ අනියම් සේවකයන් විරසක කරමින් හා බැහැර කරමින්, ඔවුන්ගේ දායකත්වය ප්‍රතික්ෂේප කරන්නේ කෙසේද යන්නයි. ඔවුන්ගේ දැනුම හා භාවිතයන්ට වඩා විධිමත් දැනුමට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

ජයසිංහ ඇතුළු පිරිස අවධාරණය කරන කාරණා ඔස්සේ කලසල කළමනාකරණය තුළ බලය, ආධිපත්‍ය, දැනුම පිළිබඳ අධිපතිවාදය හා ඒ ඔස්සේ ශ්‍රී ලංකාවේ සිදුවන වන සමාජ බැහැර කිරීම් හා නොසලකා හැරීම් අවධාරණය කර ඇත. ඔවුන් මෙම තත්වයට විසඳුම් ලෙස විස්තීරණ යෝජනාවලියක් ඉදිරිපත් කර නැතත් ඔවුන් සිය පත්‍රිකාව අවසානයේදී සමාජ ව්‍යවසායන් මෙම ක්ෂේත්‍රය විනිවිදිය යුතු බව අවධාරණය කර ඇත.

> The new trend in waste upcycling and the increasing number of social enterprises using waste as raw materials to manufacture useful products for local markets hints a positive change for the informal sector in Sri Lanka (Jayasinghe, Azariadis, Baillie: 2019).

ඒ අනුව කසළ උඩු-ප්‍රතිචක්‍රීකරණයේ (waste upcycling) යන නව ප්‍රවණතාවය සහ දේශීය වෙළඳපොළ සඳහා ප්‍රයෝජනවත් නිෂ්පාදන තැනීම සඳහා අමුද්‍රව්‍ය ලෙස කසළ භාවිත කරන සමාජ ව්‍යවසායන් (social enterprises) වැඩි වීම ශ්‍රී ලංකාවේ අනියම් අංශය (informal sector) සඳහා ධනාත්මක වෙනසක් ඉඟි කරන බව ඔවුන් දක්වයි. ඒකී සමාජ ව්‍යවසායන්ගේ ශ්‍රී ලාංකේය සන්දර්භයේදී ඉහළින්ම සිටිය යුතු වන්නේ සමුපකාර ව්‍යාපාරය බව පෙනී යයි. ඒයට ප්‍රමුඛතම හේතුව ශ්‍රී ලංකාවේ තදින් ස්ථාපිත සමාජ ව්‍යවසාය ආකෘතිය වන්නේ සමුපකාර ව්‍යාපාරය වන බැවිනි. ඒය ලංකාව තුළ සිදුකළ අත්හදා බැලීම් වලින් යම් කොටසක් සාර්ථකත්වයට පත්ව තිබීමද එක් හේතුවකි.

**නිගමන හා ප්‍රතිපත්තිමය ගම්‍යවීම්**

ඉන්දියාවේ පූනේ නගරයේ කසළ එක් රැස්කරන්නන්ගේ ස්වාච් (SWaCH) සමුපකාර සමිතියෙහි අත්දැකීම් විශ්ලේෂණය කිරීම තුළින්, කසළ කළමනාකරණ ක්ෂේත්‍රයේ නියැලෙන බල රහිත හා සමාජීය වශයෙන් බැහැර කරනු ලැබූ ජන කොටස් සවිබල ගැන්වීම පිළිබඳ ප්‍රබල පාඩම් ශ්‍රී ලංකාවට උකහා ගත හැකියි.

- කසළ එකතු කිරීමේ නිරත අනියම් අංශයේ (informal sector) ශ්‍රමිකයින් නිසි පරිදි සංවිධානගත කිරීම , විශේෂයෙන්ම සමුපකාර ආකෘතියක් යටතේ, ඔවුන්ගේ සමාජීය

හා ආර්ථික තත්ත්වය උසස් කිරීමට තීරණාත්මකව බලපාන බව SWaCH සමුපකාරය පෙන්වා දෙයි. මෙමගින් ඔවුන්ට ආර්ථික ස්වාධීනත්වයක් ලැබෙන අතර, පවුල තුළ පුරුෂාධිපත්‍යයට සම්පූර්ණයෙන්ම යටත් නොවී සිටීමේ අවකාශය, විශේෂයෙන්ම කාන්තාවන්ට හිමි වේ.

- සංවිධානගත වීම හරහා අනන්‍යතා පත්‍ර, නිල ඇඳුම් , පුහුණුව , සහ සෞඛ්‍ය රක්ෂණ වැනි විධිමත් ප්‍රතිලාභ හා සමාජ ආරක්ෂණයක් ලබා ගැනීමට ඔවුන්ට හැකි වී ඇත.
- ජයසිංහ ඇතුළු පිරිස පෙන්වා දෙන පරිදි ශ්‍රී ලංකාවේ කසළ අංශයේ අනියම් සේවකයන් ආන්තිකකරණයට, බැහැර කිරීමට, හා බලහත්කාරයට ලක්ව සිටින බැවින් , ඔවුන්ගේ දායකත්වය අගය කරමින් සහ ඔවුන්ගේ දැනුම හා භාවිතයන්ට ප්‍රමුඛත්වය දෙමින් ඔවුන්ගේ සවිබල ගැන්වීම ප්‍රමුඛ විය යුතුය.
- මෙම තත්ත්වයට විසඳුම් ලෙස යෝජනා කර ඇති සමාජ ව්‍යවසායන් ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ සමුපකාර ව්‍යාපාරය හරහා සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ ඉහළ විභවයක් පවතින බව පෙනී යයි.

SWaCH හි සාමාජිකයින්ගේ සමාජීය ස්ථරායනාත්මක පරතරය සාපේක්ෂව අඩුකර ගෙන කටයුතු කිරීමේ හැකියාව, ළමා ශ්‍රමය නතර කර අධ්‍යාපනයට යොමු කිරීම, සහ පොදු සේවාවලට ප්‍රවේශ වීමේදී මුහුණ දෙන අභියෝග සමනය කිරීම යන අත්දැකීම් ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් සලකා බැලීම වැදගත්ය.

**සමුද්දේශ**


Bhaskar, A., & Chikarmane, P. (2012). The story of waste and its reclaimers: organising waste collectors for better lives and livelihoods. *The Indian Journal of Labour Economics*, *55*(4), 595-619.

Bhowmik, S.K. 2006. "Cooperatives and the Emancipation of the Marginalized: Case Studies from Two Cities in India". Chapter in Santos, B.S., ed., *Another Production is Possible: Beyond the Capitalist Canon*, London, Verso: 70-94.

Carré, F. (2013). Defining and Categorizing Organisations of Informal Workers in Developing and Developed Countries.

Chikarmane, P. (2012). Integrating waste pickers into municipal solid waste management in Pune, India. *WIEGO Policy Brief (Urban Policies)*, *8*, 23.

Chikarmane, P., & Bhaskar, A. around-with-waste. html Agenda.

Dias, S. M., & Ogando, A. C. (2015, November). Engendering Waste Pickers Cooperatives in Brazil. In *ILO Research Conference on Cooperatives and the World of Work in Antalya, Turkey* (pp. 9-10).

Guidi, D. (2013). *Waste Management & Resource Utilisation*. Waste Management & Resource Utilisation, 533.

Hashimoto, Y., & Neha, S. (2015). Waste management and public-private partnership-integrating waste pickers' cooperative in India. *Journal of KIBI International University. Humanities and social sciences*, *(25)*, 103-111.

Jayasinghe, R., Azariadis, M., & Baillie, C. (2019). Waste, Power, and Hegemony: A Critical Analysis of the Wastescape of Sri Lanka. *Journal of Environment & Development*, *28*(2), 173–195.

Kilby, P. (2011). *NGOs in India: The challenges of women's empowerment and accountability* (p. 148). Taylor & Francis.

Malhotra, M. (2001). *SOCIAL IMPACT ASSESSMENT OF THE PUNE WASTE COLLECTION MODEL: THE SWACH MOVEMENT* (Doctoral dissertation, SYMBIOSIS INTERNATIONAL UNIVERSITY).

Patric, K. (2011). *The challenges of women's empowerment and accountability*. Routledge.

van Zeeland, A. J. (2014). The interaction between popular economy, social movements and public policies: A case study of the waste pickers' movement (No. 11). *UNRISD Occasional Paper: Potential and Limits of Social and Solidarity Economy*.

සංකල්ප පත්‍රිකා

නව පිවිසුම

ව්‍යවහාරික ශාස්ත්‍රීය සංග්‍රහය
ISSN 2961-5003 (Print) | ISSN 3121-3472 (e-Version)

**3 වෙළුම, ii වන නිකුතුව - 2025 ජූලි-දෙසැම්බර්**
පත්‍රිකා අංක 04

---

# ත්‍රෛස්ථර ආකෘතියක කෘෂි සමුපකාර ව්‍යාපාරයක් පිළිබඳ සංකල්ප පත්‍රිකාව

---

ආනන්ද සුමිත් වත්තෙආරච්චි[11]
anandasumith@gmail.com

---

**සාරසංක්ෂේපය**

මෙම සංකල්ප පත්‍රිකාව මගින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය මුහුණ දෙන ප්‍රධාන අභියෝග වන අවිධිමත් වෙළඳපොළ, විශ්වසනීය දත්ත පද්ධති නොමැතිකම සහ ග්‍රාමීය සංවර්ධනයට එල්ල වී ඇති බාධාවන් සඳහා ව්‍යුහාත්මක විසඳුමක් යෝජනා කරයි. මෙහි මූලික යෝජනාව වන්නේ ත්‍රෛස්තර සමුපකාර ආකෘතියකි (ප්‍රාථමික සමිතිය, කුඩා සංගමය සහ දිස්ත්‍රික් මට්ටමින් ප්‍රධාන සංගමය).

මෙම ආකෘතිය මගින් සමුපකාර ව්‍යුහය උපයෝගී කර ගනිමින් රටේ වාර්ෂික නිෂ්පාදන අවශ්‍යතා පුරෝකථනය කරන අතර, එම ඉලක්ක සුළු ගොවි මට්ටම දක්වා බෙදා හරිනු ලබයි. ජාතික අවශ්‍යතා මත පදනම්ව නිෂ්පාදනය කළමනාකරණය කිරීමෙන්, අතිරික්ත නිෂ්පාදනය (surplus) හෝ හිඟය (shortages) වළක්වා ගැනීමටත්, එමගින් සාධාරණ සහ ස්ථාවර වෙළඳපොළ මිලක් සහතික කිරීමටත් මෙම පද්ධතිය අපේක්ෂා කරයි.

මීට අමතරව, වෙළඳපොළ ස්ථාවර කිරීම සඳහා සීත ගබඩා පහසුකම් භාවිතා කරමින් අතිරික්ත නිෂ්පාදන කළමනාකරණය කිරීමට ප්‍රධාන සංගමයට (Main Union) හැකියාව පවතී. මෙය නිෂ්පාදකයා මෙන්ම පාරිභෝගිකයාද ආරක්ෂා කරයි. තවද, මෙම පද්ධතිය මගින් දැනුම සහ තාක්ෂණය කාර්යක්ෂමව හුවමාරු කර ගැනීමට පහසුකම් සලසන අතර, අතරමැදියන්ගේ බලපෑම අවම කරමින් අපනයන වෙළඳපොළ වෙත පිවිසීමටද දොරටු විවෘත කරයි.

[11] සමුපකාර සංවර්ධන නිලධාරී, ඌව පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | Diploma in Co-operative Development

**මූල පද:** කෘෂි සමුපකාර, ෆ්‍රෙස්ථර ආකෘතිය, වෙළඳපොළ පාලනය, දත්ත පද්ධති

**ප්‍රවේශය**

කෘෂිකාර්මික සමුපකාර යනු සියක් වසරකට අධික කාලයක් ලොව පුරා ආහාර නිෂ්පාදනයට දායක වී ඇති, සාමූහික ප්‍රයත්නයක් තුළින් සමස්ත ප්‍රජාවේ ආර්ථික දියුණුව සැලසීම ප්‍රධාන අරමුණ කරගත් සංවිධාන ආකෘතියකි. ගොවිපල සමුපකාර සමිති, පශුසම්පත් හා නිෂ්පාදන සමුපකාර සමිති, කෘෂි නිෂ්පාදන සමුපකාර සමිති වැනි විවිධ නම් වලින් හා ආකෘති වලින් ඒවා ලොව පුරා ව්‍යාප්ත වී තිබේ. මෙම සමුපකාරවල පොදු ගති ලක්ෂණය වන්නේ සාමාජික ගොවීන් එක්ව තීරණ ගැනීමත්, සියලුම සාමාජිකයන් අතර ලාභය බෙදා හැරීමත් ය. ලෝක ප්‍රවණතා නිරීක්ෂණය කිරීමේදී පැහැදිලි වන්නේ, කෘෂිකාර්මික සමුපකාර ව්‍යාපාර ආකෘතිය අනුගමනය කිරීම ලොව පුරා වර්ධනය වෙමින් පවතින බවයි.

**කෘෂිකාර්මික සමුපකාරවල ව්‍යුහය හා ප්‍රතිලාභ**

කෘෂිකාර්මික සමුපකාර මඟින් ගොවීන්ට ආර්ථික, සමාජ හා සංස්කෘතික පුළුල් පරාසයක ක්ෂණික හා දිගු කාලීන ප්‍රතිලාභ රාශියක් ලබා ගත හැකි අතර , එහි ප්‍රධාන වාසිය වන්නේ සංවිධානාත්මක ව්‍යුහයයි.

***සමුපකාරවල වාසි***

- **විනිවිදභාවය සහ සහභාගීත්වය:** සංවිධානාත්මක ව්‍යුහය මඟින් මෙහෙයුම් විනිවිදභාවය සහ ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික සහභාගීත්වය සඳහා ඉඩකඩ විවෘත කරයි.
- **වෙළෙඳ පොළ මිල සහ අස්වැන්න:** කෘෂිකාර්මික සමුපකාර මඟින් ගොවීන්ට එක්ව ශක්තිමත් වීමට හැකියාව ලැබෙන අතර, ඒකාබද්ධව සිදු කරන සම්පත් හා අත්දැකීම් භාවිතය තුළින් ඉහළ අස්වැන්නක් සහ වඩා හොඳ වෙළඳපල මිලක් ලබා ගැනීමට උපකාරී වේ.
- **පිරිවැය අඩු කිරීම:** වගාකරුවන්ට ඔවුන්ගේ ලාභදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා යෙදවුම් පිරිවැය අඩු කර ගත හැකිය.
- **තාක්ෂණ භාවිතය:** සමුපකාර සමිතියක් ලෙස ගොවීන් සංවිධානගත වූ විට, දැනුම හා තාක්ෂණය ඒකාකාරීව ගලායාමටත් භාවිතා කිරීමටත් අවස්ථාව උදා වේ. එමෙන්ම, සමිතියට ලබා ගන්නා තාක්ෂණික මෙවලම් සාමාජිකයින් සියල්ලටම පොදුවේ භාවිතා කළ හැකි වීම , ගුණාත්මකභාවය වැඩි දියුණු වීමට හා වැඩි මිලක් හිමි කර දීමට හේතු වේ.
- **සේවා සහ භාණ්ඩ වෙත ප්‍රවේශය:** තනි ගොවිපලවල් එක්ව කටයුතු කිරීමෙන් ගොවීන් පිරිවැය ඉතිරි කරන අතර, ඔවුන්ට වෙනත් ආකාරයකින් ලබා ගත නොහැකි භාණ්ඩ හා සේවා වෙත ප්‍රවේශ වීමට දොරටුව විවෘත කරයි.

**ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වර්තමාන අභියෝග**

ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන අතර එළවළු හා වී නිෂ්පාදනය ප්‍රධාන තැනක් ගනී. එසේම සැලකිය යුතු ධාරිතාවක් සහිත තේ නිෂ්පාදන සමුපකාර සමිති යම් ප්‍රමාණයක්ද දැකගත හැකිය. නමුත් මෙම මැදිහත් වීම් ප්‍රමාණාත්මකව කුඩාතර බව කෘෂි ක්ෂේත්‍රය විනිවිද ඇති ගැටලු සලකා බැලූවිට පෙනීයයි.

ක්ෂේත්‍රය මුහුණ දී තිබෙන අභියෝග පහත පරිදි හඳුනා ගත හැකිය.

- **දත්ත සහ පුරෝකථන පද්ධති නොමැති වීම:** වී නිෂ්පාදනයේ යම් දත්ත පද්ධතියක් ඇතත් , එළවළු නිෂ්පාදනය පැත්තෙන් ගත් කළ එවැනි විශ්වසනීය දත්ත පද්ධතියක් හෝ පුරෝකථන දක්නට නැත. මේ හේතුවෙන් ගොවියා වෙළෙඳ පොළ අවශ්‍යතාවය අනුව නොව, තමන්ට අවශ්‍ය පරිදි නිෂ්පාදනය කරයි.
- **වෙළෙඳ පොළ පාලනය සහ මිල අර්බුදය:** ලංකාවේ ගොවියා මුහුණ දෙන ප්‍රධානතම අර්බුදය වෙළෙඳ පොළයි. නිෂ්පාදකයා කිසිදු අවස්ථාවක සිය නිෂ්පාදනයේ වෙළෙඳ පොළ මිල තීරණය නොකරන අතර, එය වෙළෙන්දා විසින් සිදු කරනු ලබයි.
- **අතරමැදි ගැටලුව:** අතරමැදියන් ප්‍රමාණය අධික වීම, ගොවියාට නිසි මිලක් නොලැබීමටත්, පාරිභෝගිකයා අධිමිලකට භාණ්ඩ මිල දී ගැනීමටත් හේතු වී ඇත.
- **අවශ්‍යතාවට අනුව නිෂ්පාදනය නොකිරීම:** වර්තමාන කෘෂි නිෂ්පාදන පෙර වර්ෂයේ වැඩිම මිල තිබූ භාණ්ඩය සමඟ ගැට ගැසී පවතී. මේ හේතුවෙන් අදාළ වර්ෂයේදී එම භාණ්ඩයේ මිල පහළ ගොස් විකුණාගත නොහැකි තත්ත්වයක් ඇති විය හැකිය.
- **ග්‍රාමීය සංවර්ධනය අඩාල වීම:** ලංකාවේ ප්‍රධාන ජීවනෝපාය මෙය වීම හේතුවෙන්, වෙළෙඳ පොළ ගැටළු නිසා ග්‍රාමීය සංවර්ධනය අඩාල වී ඇත.

**කෘෂි සමුපකාර මත පදනම් වූ විසඳුම් ආකෘතිය**

කෘෂි සමුපකාර ආකෘතිය නව්‍යතාවකින් යුතුව පුළුල් හරහා ඉහත සඳහන් ගැටළු නිරාකරණය කරගත හැකිය.

***ග්‍රාමීය සංවර්ධනය සහ දත්ත පද්ධති***

ග්‍රාමීය මට්ටමින් ගොවීන් සංවිධාන ගත කිරීම තුළින් , ග්‍රාමීය සංවර්ධනයට පුළුල් දායකත්වයක් සැපයිය හැකි අතර , පුරෝකථන මත පදනම් වූ විශ්වසනීය දත්ත පද්ධතියක් නඩත්තු කිරීමේ හැකියාව ලැබේ. ගොවීන් සතු භූමි ප්‍රමාණයන්, පිහිටීම, සාර්ථක බෝග වර්ග සහ රටේ අවශ්‍යතාවය වැනි දත්ත නිවැරදිව හඳුනා ගැනීමට කෘෂි සමුපකාර සුදුසුම ආකෘතිය වේ.

*තරඟකාරී වෙළඳපොළ පාලනය සහ වෙළෙඳ පොළ ආරක්ෂණය*

කෘෂි නිෂ්පාදන සමුපකාර සමිති හරහා අතරමැදියන්ගේ බලපෑම අවම කර, සාධාරණ වෙළෙඳ පොළ පාලනයක් ඇති කළ හැකිය. රටේ අවශ්‍යතාවය මත ගොවීන් වගාවන් සිදු කළේ නම්, මිල පහත වැටීම් මඟහරවා ගත හැකිව තිබුණි.

**යෝජිත ත්‍රෛස්ථර සමුපකාර ආකෘතික රාමුව**

මෙම ගැටළු කළමනාකරණය කිරීම සඳහා පහත සඳහන් ආකෘතික රාමුව යෝජනා කළ හැකිය:

1. **මූලික සමිතිය:** අවම විස්සකින් යුත් ගොවීන්ගේ සමුපකාර සමිතියක් ආරම්භ කිරීම.
2. **කුඩා සංගමය:** එවැනි සමුපකාර සමිති දහයක් එකතු කර සංගමයක් ආරම්භ කිරීම.
3. **ප්‍රධාන සංගමය (දිස්ත්‍රික් මට්ටමින්):** එවැනි සංගම් දහයක් එකතු කර දිස්ත්‍රික් මට්ටමින් විශාල සංගමයක් ඇති කිරීම.

*ක්‍රියාකාරීත්වය:*

- **පුරෝකතනය**: ප්‍රධාන සංගමය රටේ වාර්ෂික අවශ්‍යතාවය පුරෝකථනය කර , එය කුඩා සංගම්, සමිති හරහා ගොවීන් වෙත බෙදා දෙනු ලබයි.
- **නිෂ්පාදන ඉලක්ක තීරණය කිරීම:** උදාහරණයක් ලෙස, වාර්ෂික අර්තාපල් අවශ්‍යතාවය 100,000 ක් ලෙස ගත් විට, එය එක් සමිතියකට 1,000 ක් ලෙස බෙදී යන අතර, එම ප්‍රමාණය නිෂ්පාදනය කළ යුත්තේ කවර ගොවියාද යන්න සමිතිය තීරණය කළ හැකිය.
- **අතිරික්ත කළමනාකරණය:** ප්‍රධාන සංගමයට ශීතාගාරයක් ලබා ගත හැකි අතර, අතිරික්ත නිෂ්පාදන එහි ගබඩා කර අවශ්‍ය පරිදි වෙළෙඳ පොළට නිකුත් කළ හැකිය.
- **ආරක්ෂාව:** මෙම ක්‍රමය මගින් අතිරික්තය නිසා වෙළෙඳ පොළ මිල වෙනස් නොවන බැවින් ගොවියා ආරක්ෂා වන අතර, හිඟයක් ඇති නොවන බැවින් පාරිභෝගිකයා ද ආරක්ෂා වේ.
- **අපනයන:** සමුපකාර සමිති හරහා ගොවීන්ට පහසුවෙන් අපනයන වෙළෙඳ පොළ විවෘත වන අතර, ආනයනකරුවෙකුට කෙලින්ම සමිතිය සමඟ ගනුදෙනුව සිදු කළ හැකිය.

පහත වගු ත්‍රිත්වය ඔස්සේ මෙම සංකල්ප ගත කිරීම සාරාංශ ගතකර ඇත.

වගු අංක අංක 01: ප්‍රාථමික සමිති

| අංගය | විස්තරය | ප්‍රතිලාභ |
|---|---|---|
| **සාමාජිකත්වය** | අවම ගොවීන් විස්සකින් (20) සමන්විත වීම. | ප්‍රජාතන්ත්‍රවාදී තීරණ ගැනීමේ හැකියාව. |
| **ප්‍රධාන කාර්යභාරය** | නිෂ්පාදන ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සහ සාමාජික කළමනාකරණය. | |
| **නිෂ්පාදන ඉලක්ක බෙදා හැරීම** | කුඩා සංගමයෙන් ලැබෙන සමස්ත නිෂ්පාදන ඉලක්කය (උදා: අර්තාපල් කිලෝග්‍රෑම් 1,000) තමන්ගේ සාමාජික ගොවීන් අතර නිවැරදිව බෙදා දීම. | අතිරික්ත (Overproduction) සහ හිඟයන් (Shortages) වැළැක්වීම. |
| **දත්ත හා තාක්ෂණික කළමනාකරණය** | * සාමාජික ගොවීන් සතු භූමි ප්‍රමාණයන්, පිහිටීම සහ සුදුසු බෝග වර්ග පිළිබඳ දත්ත පවත්වා ගැනීම. | විශ්වසනීය දත්ත පද්ධතියක් නඩත්තු කිරීම. |
| | රජයෙන් හෝ සංගමයෙන් ලැබෙන තාක්ෂණික උපදේශනය හා දැනුම ඒකාකාරීව සාමාජිකයන්ට ලබා දීම. | දැනුම හා තාක්ෂණය කාර්යක්ෂමව ගලා යාම. |
| | පොදුවේ භාවිතා කළ හැකි තාක්ෂණික මෙවලම් (යන්ත්‍ර සූත්‍ර) ලබා ගැනීම සහ නඩත්තු කිරීම. | යෙදවුම් පිරිවැය අඩු කර ගැනීම සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම. |

වගු අංක අංක 02: කලාප සංගම්

| අංගය | විස්තරය | ප්‍රතිලාභ |
|---|---|---|
| **සැකැස්ම** | මූලික සමිති දහයක (10) එකතුවකින් ආරම්භ කිරීම. | සමිති අතර සහයෝගිතාව සහ ඒකාබද්ධ කිරීම. |
| **ප්‍රධාන කාර්යභාරය** | ප්‍රධාන මව් සංගමයෙන් ලැබෙන නිෂ්පාදන ඉලක්කය මූලික සමිති අතර බෙදා හැරීම. | නිෂ්පාදන ඉලක්ක කළමනාකරණය. |
| **නිෂ්පාදන කළමනාකරණය** | එක් එක් සමිතියේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම. | කාර්යක්ෂමතාව වැඩි කිරීම. |
| | තම සීමාවේ ඇති සමිති සඳහා අවශ්‍ය පුහුණුවීම් හා කෘෂි යෙදවුම් සැපයීමට ප්‍රධාන සංගමය සමඟ සම්බන්ධීකරණය කිරීම. | යෙදවුම් පිරිවැය අඩු කිරීම. |

වගු අංක අංක 03: දිස්ත්‍රික් සංගමය

| අංගය | විස්තරය | ප්‍රතිලාභ |
|---|---|---|
| සැකැස්ම | කුඩා සංගම් දහයක (10) එකතුවකින් දිස්ත්‍රික් මට්ටමින් ඇති කිරීම. | දිස්ත්‍රික්කයේ සමස්ත කෘෂි නිෂ්පාදන කළමනාකරණය. |
| ප්‍රධාන කාර්යභාරය | රටේ වාර්ෂික නිෂ්පාදන අවශ්‍යතාවය (උදා: අර්තාපල් කිලෝග්‍රෑම් 100,000) පුරෝකථනය කර, එම අවශ්‍යතාවය කුඩා සංගම් අතර බෙදා දීම. | රටේ අවශ්‍යතාවයට අනුව නිෂ්පාදනය කිරීමෙන් වෙළඳපොළ මිල ආරක්ෂා කිරීම. |
| වෙළඳපොළ පාලනය | ශීතාගාර පහසුකම් ලබා ගැනීම සහ අතිරික්ත නිෂ්පාදන එහි ගබඩා කිරීම. | වෙළෙඳ පොළ මිල සාධාරණව පාලනය කිරීම. |
| | ගබඩා කළ අතිරික්තය අවශ්‍ය පරිදි වෙළඳපොළට නිකුත් කිරීම. | ගොවියාගේ සහ පාරිභෝගිකයාගේ ආරක්ෂාව තහවුරු කිරීම. |
| | දේශීය හා අපනයන වෙළඳපොළ සඳහා පහසුකම් සපයා දීම. | ගොවීන්ට වෙළෙඳ පොළ විවර කර දීම සහ අතරමැදියන්ගේ බලපෑම අවම කිරීම. |
| රජයේ සම්බන්ධීකරණය | රජයෙන් පහසුකම්, උපදේශන හෝ සහන ලබා ගැනීමේදී තනි ඒකකයක් ලෙස රජය සමග කටයුතු කිරීම. | පහසුකම් සැපයීම කාර්යක්ෂම වීම. |

**නිගමනය හා ප්‍රතිපත්තිමය ගම්‍යවීම්**

කෘෂිකාර්මික සමුපකාර සමිති, ඒවායේ සංවිධානාත්මක ව්‍යුහය සහ ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික සහභාගීත්වය තුළින්, ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට බලපාන ප්‍රධාන අභියෝග වන **අවිධිමත් වෙළෙඳ පොළ, දත්ත පද්ධති නොමැතිවීම සහ ග්‍රාමීය සංවර්ධන අඩාල වීම** යන ගැටළු සඳහා සෘජු හා ඵලදායී විසඳුම් සපයයි. යෝජිත ත්‍රෛස්ථර ආකෘතිය, රටේ අවශ්‍යතාවය මත පදනම් වූ නිශ්චිත නිෂ්පාදන ඉලක්ක සහ අතිරික්ත කළමනාකරණය තුළින්, නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා යන දෙදෙනාම ආරක්ෂා කරන **සාධාරණ හා තිරසාර කෘෂිකර්මාන්තයක්** සඳහා පදනම දමයි

**සමුද්දේශ**

International Co-operative Alliance (ICA). (1995). *Statement on the co-operative identity*. Retrieved from ICA Statement on Co-operative Identity

නව පිවිසුම

ව්‍යවහාරික ශාස්ත්‍රීය සංග්‍රහය
ISSN 2961-5003 (Print) | ISSN 3121-3472 (e-Version)

**3 වෙළුම, ii වන නිකුතුව - 2025 ජූලි-දෙසැම්බර්**
පත්‍රිකා අංක 05

---

# මොන්ඩ්‍රැගොන් හා එමිලියා රොමාග්නා: සාර්ථක සමුපකාර මාදිලි ද්විත්වයක් ලෙස

---

වසන්තා කුමුදුනී වර්ණකුලසූරිය[12]
wkwarnakulasooriya@gmail.com

ප්‍රභාත් ගලගමගේ[13]
prabath.nicdstaff@gmail.com

---

**සාරසංක්ෂේපය**

මෙම අධ්‍යයනය මගින් සාර්ථක ජාත්‍යන්තර ආකෘති දෙකක් වන ස්පාඤ්ඤයේ මොන්ඩ්‍රැගන් සමුපකාර සංගමය (MCC) සහ ඉතාලියේ එමිලියා රොමැග්නා (Emilia Romagna) ආකෘතිය විශ්ලේෂණය කරමින්, ගෝලීය හොඳම භාවිතයන් ශ්‍රී ලංකාවේ සමුපකාර ක්ෂේත්‍රයට ඒකාබද්ධ කිරීම පිළිබඳව ඇගයීමට ලක් කරයි.

ස්පාඤ්ඤයේ හත්වන විශාලතම ව්‍යාපාරික සමූහය වන MCC, මූල්‍ය හා කර්මාන්ත යන අංශ අළලා පැතිරී පවතින අතර, එය "ශ්‍රමයේ ස්වෛරීභාවය" (Sovereignty of Labour) සහ පාලනය කරන ලද කළමනාකරණ වැටුප් වැනි සුවිශේෂී ප්‍රතිපත්ති මගින් මෙහෙයවනු ලබයි. ඊට ප්‍රතිවිරුද්ධව, එමිලියා රොමැග්නා යනු කෘෂිකර්මාන්තය සහ සමාජ සේවා යන අංශයන්හි ප්‍රමුඛත්වය දරන සාර්ථක කුඩා හා මධ්‍ය පරිමාණ සමුපකාරවල සමීප ජාලයකි. එහිදී බොහෝ

---

[12] සමුපකාර සංවර්ධන නිලධාරී, දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | Diploma in Co-operative Development, B.Sc (Business Administration) (USJ), Master of Business Management (MBM )(UoR)

[13] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය | Diploma in Co-operative Development, B.A (sp), M.A, M.Phil

පුරවැසියන් සමුපකාර සාමාජිකයින් වන අතර, එම පද්ධතිය මගින් දේශීය නිෂ්පාදන ගෝලීය වෙළඳපොළ සමග කාර්යක්ෂමව සම්බන්ධ කරයි.

**මූල පද:** කම්කරු සමුපකාර, අන්තර් සහයෝගීතාව, සමාජ විපරිවර්තනය, සමුපකාර සංවර්ධනය, ගෝලීය වෙළෙඳපොළ

**ප්‍රවේශය**

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය සාර්ථක ව්‍යාපෘතියක් ලෙස ඉදිරියට ගමන් කරවීමට නම් ලොවපුරා පවතින සාර්ථක සමුපකාර ව්‍යාපාර පිළිබඳ අත්දැකීම්ද භාවිත කළ යුතුය. ලාංකේය සන්දර්භයේ පවතින දුර්වලතා හඳුනා ගෙන හා ශක්‍යතා අවබෝධකරගෙන සමුපකාර සංවර්ධනය සඳහනා නව උපක්‍රම හා සැලසුම් සැකසිය හැක්කේ ඒ තුළිනි. මේ සඳහා විශ්වීය මට්ටමමට්ටමේ සාර්ථක සමුපකාර ද්විත්වයක් අධ්‍යයනට යොමුවෙමු.

**ස්පාඤ්ඤයේ මොන්ඩ්‍රැගොන් සමුපකාර සමිතිය (Mondragon Co-operative Corporation - the MCC)**

මොන්ඩ්‍රැගොන් සමුපකාරය යනු ස්පාඤ්ඤයේ බැස්ක්‍යු (Basque) කලාපය පාදක කරගෙන බිහිවී ඇති කම්කරු සමුපකාර සමිති හා එම සමිති වල ද්විතීක සංගමයයි. මෙම මොන්ඩ්‍රැගොන් කම්කරු සමුපකාර සමිති වල හා මොන්ඩ්‍රැගොන් කම්කරු සමුපකාර සමිති සංගමයේ නම නිර්මාණය වී ඇත්තේ එහි පළමු සමිතිය බිහිවූ මොන්ඩ්‍රැගොන් නගරය නමිනි. වත්කම් පිරිවැටුම (asset turnover) අනුව එය ස්පාඤ්ඤයේ හත්වන විශාලතම ව්‍යාපාරික ආයතනයයි. 2015 වාර්ෂික වාර්තාවට අනුව සේවක සංඛ්‍යාව 74335කි. මෙම කම්කරු සමුපකාර සමිති සංගමය ප්‍රාථමික සමිති 101කින් සමන්විතය. ජාත්‍යන්තර සේවා සම්ගම් 13ක් එය සතුය. නිෂ්පාදන මධ්‍යස්ථාන 128ක් සතුය. මුළු කොටස් ප්‍රමාණයෙන් කාන්තා කොටස්කාරිණියන්ට 43%ක අයිතියක් ලැබී ඇත. මෙම සමිතිය මූල්‍ය, කාර්මික, පාරිභෝගික හා දැනුම් වෙළඳපොළ යන ප්‍රදේශ ආවරණය කරයි. පාරිසරික සුරක්ෂිතතාව පිළිබඳ සහතික හා තත්ව සහතික රැසක් හිමි ආයතනයකි. මෙම සමිතිය විශාල ප්‍රමාණයක් වන පර්යේෂණ සඳහාද සහය වී ඇත. එසේම විශාල ප්‍රමාණයක් සංවර්ධන වැඩසටහන් සඳහා මූල්‍යාධාර ලබා දී ඇත.

**ඉතිහාසය**

ස්පාඤ්ඤ කම්කරු සමුපකාර සමිති වල ඉතිහාසය 1842 තරම් ඈතට දිවයයි. මෙම ඓතිහාසික පදනම් වල සිටයි මොන්ඩ්‍රැගොන් සමුපකාරය බිහිවන්නේ. 1941දී තරුණ කතෝලික පූජකවරයෙක් වූ ජූසේ මාරියා ඇරිස්පැන්ඩයරිඑටා (José María Arizmendiarrieta) ස්පාඤ්ඤ සිවිල් යුද්ධයේ ආතතිය තුළින් තවමත් නොමිදී දුගීබව හා සාගින්න සහිත වූ 7000ක පමණ ජනගහනයක් විසූ මොන්ඩ්‍රැගොන් නගරයේ පදිංචි විය. 1943දී හෙතෙම කළමනාකරුවන්, ඉංජිනේරුවන්, පුහුණු කම්කරුවන් පුහුණු කරන කාර්මික විද්‍යාලයක් ස්ථාපිත කළේය. වසර කිහිපයක පුහුණුවකින් පසු 1955දී මේ අතරින් තෝරාගත්

පස් දෙනෙකුගෙන් යුත් තරුණ කණ්ඩායමකින් මොන්ඩ්‍රැගොන් සමුපකාරය ආරම්භ කළේය. 1956 දී මෙම කණ්ඩායම 25ක් බවට පත්විය. 1960 ගණන් වල මැද සිට 1970 ගණන් දක්වා කාලය තුළ මොන්ඩ්‍රැගොන් සමුපකාරය වසරකට 1000ක පමණ කම්කරුවන් පිරිසක් ඇතුළු වෙමින් වර්ධනය විය. 1986-1996 කාලය තුළ 19699ක සේවකයින් ප්‍රමාණය 30634ක් දක්වා වර්ධනය විය. 2003 වසරේදී ෆෝචූන් සඟරාව (Fortune) යුරෝපයේ හොඳම රැකියා ස්ථාන 10න් එකක් ලෙස මොන්ඩ්‍රැගොන් තෝරා ගත්තේය. මොන්ඩ්‍රැගොන් විශ්වවිද්‍යාලය තුන්දහසකට අධික සිසුන්ගෙන් සමන්විත වෙයි. එහි බැංකුව විසින් සපයන ණය සඳහා අයකරන සම්මත පොලී අනුපාත ස්පාඤ්ඤයේ සාමාන්‍ය බැංකු වල පොලී අනුපාතයට වඩා 50%කින් අඩුය (Corcoran and Wilson, 2010; Mondragon Corporation, 2017, August 12). මෙම කාරණා මත ඇමරිකානු මහාචාර්ය රිචර්ඩ් වුල්ෆ් *ගාඩියන්* සඟරාවට ලිපියක් යොමුකරමින් මොන්ඩ්‍රැගොන් සමුපකාරය උදාහරණයට ගනිමින් පවසන්නේ ධනවාදී නිෂ්පාදන මාදිලියට විකල්පයක් තිබෙන බවයි. මෙවැනි අදහස් ශාස්ත්‍රීය මට්ටමින් පැන නැගීමට හේතු වන්නේ මෙම සමුපකාරයේ ඇති අති දැවැන්ත සාර්ථකත්වයයි.

ජාත්‍යන්තර සමුපකාර සංධානයේ සමුපකාර මූලධර්ම විහිදුවා සකසාගත් ඔවුන්ගේම සමුපකාර මූලධර්ම කට්ටලයක් ද මොන්ඩ්‍රැගොන් සතුය.

1. විවෘත ප්‍රවේශය (Open Admission)
2. ප්‍රජාතාන්ත්‍රික සංවිධානය (Democratic Organization)
3. කම්කරු පරමාධිපත්‍ය (Sovereignty of Labour)
4. ප්‍රාග්ධනය උපකරණයක හා අප්‍රධාන ස්වාභාවයෙන් සැලකීම (Instrumental and Subordinate Nature of Capital)
5. සහභාගිත්ව කළමනාකරණය (Participatory Management)
6. වේතන පිළිබඳ ඒකමතිකත්වය (Wage Solidarity)
7. අන්තර් සහයෝගීතාව (Interco-operation)
8. සමාජ විපරිවර්තනය (Social Transformation)
9. විශ්වීයත්වය (Universality)
10. අධ්‍යාපනය (Education)

මෙම මොන්ඩ්‍රැගොන් මූලධර්ම අනුව අපට පෙනී යන්නේ එම මූලධර්ම ජාත්‍යන්තර සමුපකාර සංධානයේ මූලධර්ම වලට ඉහළින් සිටින බව පෙනී යයි. විශේෂයෙන්ම 3වන මූලධර්මයේ සිට හයවන මූලධර්මය දක්වා කම්කරු පංතිය කෙරෙහි වැදගත් අවධානයක් යොමුකර ඇත. මන්ද ඔවුන්ගේ සමුපකාරයට නායකත්වය දෙන්නේ වැඩකරන පංතිය වනවා සේම ප්‍රතිලාභ ලබන්නේද වැඩකරන පංතිය වන බැවිනි. සමිතියේ අරමුණ සමාජ විපරිවර්තනයකි. අධ්‍යාපනය තුළින් ඔවුන් හුදෙක් සමුපකාර ව්‍යාපාරය පිළිබඳ පුහුණුව පමණක් අදහස් නොකරයි. එයින් ඔවුහු එදිනෙදා තාක්ෂණික ලැටලු විසඳීමට අවශය අධයාපනයද අදහස් කරයි (Corcoran and Wilson, 2010).

මොන්ඩ්‍රැගොන් පුරෝගාමීන් වැටුප් තීරණය කිරීමේදී ප්‍රජාවේ අවශ්‍යතාව මත මිස සමිතියේ ඵලදායීතාව මත පදනම් වූයේ නැත. මෙයින් ඔවුන් කාරණා දෙකක් සපුරා ගැනීමට උත්සාහ කළේය. එකක් වන්නේ වැඩකරන ප්‍රජාවේ සමානාත්මතාවය රැකීමයි. අනෙක අතිරික්ත අරමුදල් සමුපකාර සංවර්ධනය සඳහා යෙදවීමයි. කෙසේ වෙතත් ක්ෂේත්‍රයේ සමාන රැකියාවලට වඩා මොන්ඩ්‍රැගොන් වැඩකරන පංතියේ වැටුප් 13%කින් වැඩිය. මෙයට අමතරව ලාභ බෙදීමේදී ද ඔවුන්ට ප්‍රතිලාභ හිමිවෙයි. මධ්‍යම කළමනාකරණයේ වැටුප පුද්ගලික අංශයේ වැටුප හා සමානය. ඉහළ කළමනාකරණයේ වැටුප පුද්ගලික අංශයට වඩා 30%කින් අඩුය (Corcoran and Wilson, 2010). සාමාන්‍යයෙන් පුද්ගලික අංශය සිදු කරන්නේ ඉහළ කළමනාකරණයට වැඩි වැටුප් ලබා දෙමින් වැඩකරන පංතියට පහළ වැටුප් ලබා දෙමින් ඉහළ කළමනාකරණය හරහා වැඩ කරන පංතිය පීඩිත සේවා කොන්දේසි යටතේ සූරා කෑමයි. මොන්ඩ්‍රැගොන් හි විශේෂත්වය වන්නේ සේවක වැටුප් යන කාරණය සංවිධානයෙන් බාහිරට යන වැය බරක් ලෙස දුරස්තරව නොසිතීමයි (McDonnell, Macknight, & Donnelly, H. 2012). මොන්ඩ්‍රැගොන් සේවකයින්ට හා ප්‍රජාවට ස්ථාවර, සුරක්ෂිත හා සාමකාමී වැඩ පරිසරයක් ඇති කිරීම ඔස්සේ ද වැදගත් සේවයක් සලසයි. ඔවුන්ගේ දරුවන්ටද අනාගතයේ සම්බන්ධ විය හැකි සේවාස්ථානයක් තනාදෙයි. සමිතිය සිය ලාභයෙන් 10%ක් ප්‍රජාව වෙනුවෙන් වෙන් කරයි. මෙම අරමුදල් වලින් විවධ සමාජ සේවා සිදුවෙයි. උදාහරණයක් ලෙස මොන්ඩ්‍රැගොන් සරසවිය පොදු ජනයාට විවෘත එකක් වන්නේ ඒ ඔස්සේය. මොන්ඩ්‍රැගොන් සාර්ථකත්වයේ එක් ප්‍රදේශයක් නියෝජනය කරන්නේ නවෝත්පාදනයි. නවෝතපාදන යනු විශාල ආයෝජනයක් සිදුකළ යුතු ක්ෂේත්‍රයකි. මොන්ඩ්‍රැගොන් වැනි දැවැන්ත සමුපකාර සමිතිවලට මෙම කාර්යය සිදුකළ හැක. මෙම කාරණයේදී කුඩා සමුපකාර සමිති අසමත්වෙයි (Novkovic, 2008). මොන්ඩ්‍රැගොන් සමුපකාර සමිතිය සිය සංවිධාන ව්‍යුහයද වෙනසකට ලක් කළ අතර මෙය සමහරුන් නව-සමුපකාරවාදය (neo-cooperativism) ලෙසද හඳුන්වයි. මේ අනුව මොන්ඩ්‍රැගොන් සමුපකාර සමිති සංගමය සිය ව්‍යුහය යම් වෙනසකට භාජනය කරමින් සාමාජිකයින් හා සේවකයින් ආකාර කිහිපයකට හඳුනා ගෙන ඇත.

1. සමුපකාර සාමාජිකයින්
2. තාවකාලික සාමාජිකයි
3. තාවකාලික සාමාජික නොවන අය
4. විදේශ ආශ්‍රි සමාගම් වල කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින්
5. දේශීය ආශ්‍රිත සමාගම් වල කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින්

පළමු වර්ග තුන සමුපකාරය ඇතුළත සේවය කරන අතර අවසාර වර්ග ද්විත්වය සමුපකාරයෙන් පිටත සේවය කරයි (Errasti, Heras, Bakaikoa, & Elgoibar, 2003). මොන්ඩ්‍රැගොන් සමුපකාර සමිති සංගමයේ සාර්ථකත්වය හේතුකොටගෙන සමහර පුද්ගලික සමාගම් සේවකයින්ට කොටස් නිකුත් කිරීම හා සාමාන්‍ය පොදු අයිතිය යටතේ පවත්වාගෙන ගිය සමුපකාර සමිති සේවක මණ්ඩලයට බහුතර කොටස් හිමි සමුපකාර බවට පරිවර්තනය කිරීමේ ප්‍රවණතාවක් හඳුනා ගත හැකිය (Errasti, Heras, Bakaikoa, 2003).

**එමිලියා රොමාග්නා ආකෘතිය (Emilia Romagna model)**

එමිලියා රොමාග්නා ආකෘතිය හෝ සමහර අවස්ථාවල වඩා සරලව එමිලියා ආකෘතිය හෝ එමිලියන් ආකෘතිය (The Emilian Model) ලෙස හැඳින්වෙන්නේ ප්‍රකට සමුපකාර ආකෘතිකි. එය එක් අතකින් දේශීය ගොවීන් ගෝලීය වෙළෙඳ පොළ සමඟ සම්බන්ධකිරීමට විශේෂයෙන් සැකසුණු සමුපකාර ආකෘතියකි. තවත් අතකට ශිල්පීන්ගේ නිපයුම් සඳහා ඉඩකඩ සලසන සමුපකාර ආකෘතියකි. නූතන ගෝලීය ධනවාදී අර්ථක්‍රමය තුළ විකල්ප ආකෘතියක් ලෙස ඉදිරියට පැමිණ සාර්ථක වූ සමුපකාර ව්‍යාපෘතියකි. එසේම මෙම ආකෘතිය ස්පාඤ්ඤ මොන්ඩ්‍රැගොන් ආකෘතිය සමඟ කරට කර කියවෙන නාමයකි. මෙය උතුරුදිග ඉතාලිය පාදක කරගත් ව්‍යාපෘතියකි. එමිලියා රොමාග්නා කලාපය මිලියන 3.9ක ජනගහනයක් සහිතය. ලොව පැරණිතම සරසවිය වන බොලොග්නා (Bologna) සරසවිය පිහිටා ඇත්තේද මෙම ප්‍රදේශයේය. මෙම ප්‍රදේශයේ ඇති ඓතිහාසික වටිනාකම සමඟ සම්බන්ධ වන තවත් දෙයක් වන්නේ සාම්ප්‍රදායික කළා හා අත්කම් නොනැසී ඉදිරියට ගමන් කිරීමයි. මෙම කලාපයේ පිරිස් ඉතා විශාල ප්‍රමාණයක් නිෂ්පාදන ව්‍යවසායන්හි නිරත වෙයි. මෙයින් බොහොමයක් කුඩා පරිමාණ හෝ ශ්වයං-රැකියා මට්ටමේ ඒවාය. යුරෝපයේ වැඩිම ව්‍යවසායකත්ව ගති ලක්ෂණ වලින් හෙබි කලාපයක් ලෙසද එමිලියා රොමාග්නා සැලකෙයි. කෙසේ වෙතත් 500කට වැඩි සේවකයින් සිටින ආයතන ඇත්තේ ස්වල්ප ප්‍රමාණයකි. එමිලියා රොමාග්නා ප්‍රදේශය ගත්විට 420000ක් ගොවීන්ගෙන් ද එය සමන්විත වෙයි. එහි ජනගහනයෙන් අඩකටත් වඩා සමුපකාර සාමාජිකයෝය (Logue, 2006). තවත් ලෙසකට පැවසුවහොත් මෙම කුඩා පරිමාණ ව්‍යවසායන් ගෙන් අඩක් දිවෙන්නේ සමුපකාර ආකෘතියටයි (Restakis, 2007). මෙහි ඇති නිවාස සමුපකාර සමිති හා පාරිභෝගික සමුපකාර සමිති ගත්විට ඒවා විසින් මිල ගණන් පාලනයට මැදිහත් වී ඇත. එසේම පුද්ගලීකරණය කළ බොහෝ සමාජ සේවාවන් පවත්වාගෙන යන්නේ සමුපකාර ඔස්සේය. එමිලියා රොමාග්නා හි පැවති සාම්ප්‍රදායික සේවක අයිතිය යටතේ පවතින සමුපකාර සමිති වන්නේ ශිල්පීන්ගේ සමුපකාර සමිතියි. උදාහරණයක් ලෙස ඉතාලි පස්වන විශාලතම සෙරමික් නිෂ්පාදන ආයතනය ධාවනය වන්නේ මේ අනුව සමුපකාර ආකෘතියටයි.

කෙසේ වෙතත් දෙවන ලෝක යුද සමයේදී මෙම කලාපය බොහෝ ගැහැට වලට මැදිවිය. මුසෝලනීගේ ෆැසිස්වාදය හමුවේ සමුපකාර හා කම්කරු ව්‍යාපාරය දැඩි මර්දනයකට ලක්විය. සියලු ස්වාධීන සංවිධාන යටපත් කළ අතර බොහෝ කම්කරු හා සමුපකාර නායකයින් සිරගත කරන ලදී. ඇන්ග්ලෝ-ඇමරිකානුන් දකුණු ඉතාලියට පැමිණීමත් සමඟ එමිලියා රොමාග්නා ප්‍රදේශය තවත් ව්‍යවසනකාරී තත්වයකට නාසි ජර්මනියේ බලපෑම යටතේ මුහුණ දුන්නේය. යුද්ධය විසින් දැඩි රැකියා විරහිත බවක්ද ජනිත කරනු ලැබිණි. යුද්ධයෙන් අනතුරුව ජාත්‍යන්තර සමුපකාර සංධානය සමුපකාර ව්‍යාපාරය සඳහා දායකත්වයක් ලබා දුන්නේය. ඒ සමගාමීව පැවති වාම රජය සියලු කුඩා වෙළෙඳ ව්‍යාපාර සඳහා සමුපකාර ආකෘතිය හඳුන්වා දුන්නේය. ඒ අනුව පාරිභෝගික සමුපකාර, කෘෂි සමුපකාර හා කුඩා ව්‍යවසායන් සමුපකාර ක්‍රමය යටතේ සංවිධානගත කිරීම සිදුවිය. ස්වයංරැකියා ව්‍යාපාර, කෘෂි සමුපකාර, පාරිභෝගික සමුපකාර,

නිවාස සමුපකාර, ධීවර සමුපකාර, ණය සංගම් ආදිය ක්‍රියාත්මක වූ නීතිය යටතේ ක්‍රියාත්මක වීමේදී සේවකයින්ගේ අයිතිය යටතේ පැවති සමුපකාර අසාර්ථක විය. ඉතාලි සමුපකාර ව්‍යාපාරය 1850 ගණන්වල ඇරඹී මුසෝලිනී බලයට පත්වන විට ඉහළ තලයකට ගමන් කර තිබිණි. එසේම සේවක-අයිතිය යටතේ පැවති සමුපකාර ප්‍රධාන භූමිකාවක් ඉටු කළේය. 1921 වන විට 3600ක් පාරිභෝගික සමුපකාරද, 2700ක් නිෂ්පාදන සමුපකාර ද එමිලියා රොමාග්නා හි පැවතිණි. මුසෝලිනීගෙන් පසු 1947 නිර්මාණය කළ ව්‍යවස්ථාවෙන්ම (47 වගන්තිය) සමුපකාරය සඳහා පිළිගැනුමක් හිමිකතර දී තිබිණි (Logue, 2006).

> "The Republic recognizes the social function of cooperation characterized by mutual aid and not private profit. The law promotes and favors the growth of these structures using the most appropriate means and guarantees that their character and purpose will be inspected accordingly." (උපුටනය Logue, 2006 වෙතිනි).

එසේම ව්‍යවස්ථාව හා සමාන්තරව නිර්මාණය වන සමුපකාර නීතිය යටතේ සමුපකාර සඳහා බදු සහන ඇතුළු වාසි සහගත තත්වයන් හිමිකර දී තිබිණි. එසේම සේවක සාමාජික අයිතිය යටතේ පවතින කම්කරු සමුපකාර සමිති සඳහා ද පහසුකම් සලසා තිබිණි. මේ අනුව අද දින වන විට එමිලියා රොමාග්නා ආකෘතිය ලෙස හඳුනා ගත හැක්කේ එම කලාපය ධාවනය වන ව්‍යවසායකත්ව ව්‍යුහය අනුවයි. එනම් කුඩා ව්‍යවසායන් බහුතරය සමුපකාර ආකෘතිය අනුව සංවිධානය වී ඇති අතර ඒවා ජාලගතව දේශීය වෙළෙඳ පොළ පමණක් නොව ගෝලීය වෙළෙඳ පොළ දක්වා ගමන් කර ඇත. ඉතාලියේ ඇති 43000ක් වන සමුපකාර සමිති වලින් 15000ක් ස්ථාපිතව ඇත්තේ එමිලියා රොමාග්නාහි ය. ඒ අනුව එමිලියා රොමාග්නා යනු යුරෝපයේ වැඩිම සමුපකාර ප්‍රමාණයක් සංකේන්ද්‍රිත කලාපයයි. ඒවා නිෂ්පාදනයන්ට, බෙදා හැරීමට හා පුහුණුකටයුතු සඳහා මැදිහත් වෙයි. Bologna නගරය උදාහරණයකට ගතහොත් එහි පුරවැසියන්ගෙන් 2/3ක් සමුපකාර සාමාජිකයෝය. සිල්ලර වෙළෙඳාම, ඉදිකිරීම්, කෘෂි නිපයුම්, නිවාස, නිෂ්පාදන, සමාජ සේවා යන ක්ෂේත්‍රවල ආධිපත්‍ය දරන්නේ සමුපකාරයි. උදාහරණ ලෙස මහා පරිමාණ ඉංජිනේරු වැඩ, ඉදිකිරීම්, උරුම සංරක්ෂණ ව්‍යාපෘති ඇතුළු බොහෝ පොදු වැඩ සිදුවන්නේ සාමාජික හිමිකම සහිත ඔවුන්ම සේවයේ යෙදෙන ගොඩනැගිලි සමුපකාර සමිති විසිනි.

**ශ්‍රී ලංකාවට ගත හැකි අත්දැකීම්**

මොන්ඩ්‍රාගොන් සහ එමිලියා රොමාග්නා ආකෘති ද්විත්වයේ සාර්ථකත්වය විශ්ලේෂණය කිරීමෙන්, ශ්‍රී ලාංකේය සමුපකාර සංවර්ධනය සඳහා නව උපාය මාර්ග සකස් කර ගැනීමට අදාළ වැදගත් පාඩම් රැසක් ගත හැක.

**කම්කරු පරමාධිපත්‍ය තහවුරු කිරීම (Asserting Labour Sovereignty):** මොන්ඩ්‍රාගොන් මූලධර්මවල මෙන්, ශ්‍රී ලංකාවේ සමුපකාර තුළ කළමනාකරණ තීරණ ගැනීමේදී කම්කරු

සාමාජිකයාගේ භූමිකාව වැඩිදියුණු කළ යුතුය. මෙහිදී, ඉහළ කළමනාකාරීත්වයේ වැටුප් පෞද්ගලික අංශයට වඩා 30% කින් අඩු මට්ටමක තබා ගනිමින් , වැඩ කරන පන්තියට සාමාන්‍ය වැටුපට වඩා 13% කින් වැඩි වැටුපක් ලබා දෙන මොන්ඩ්‍රාගොන් හි වැටුප් ප්‍රතිපත්තිය (Wage Solidarity) දෙස අවධානය යොමු කළ යුතුය.

**ප්‍රාග්ධනයේ උපකරණ ස්වභාවය (Instrumental Nature of Capital):** සමුපකාර තුළ ප්‍රාග්ධනය සලකනු ලබන්නේ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ උපකරණයක් ලෙස මිස ප්‍රධාන ස්වභාවයකින් නොවිය යුතුය. අතිරික්ත අරමුදල් සමුපකාර සංවර්ධනය සඳහා නැවත යෙදවීම මෙහිදී ඉතා වැදගත් වේ.

**අන්තර් සමුපකාර සහයෝගීතාව ජාලගත කිරීම (Networking Inter-Cooperation):** එමිලියා රොමාග්නා ආකෘතියේ මෙන්, ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ සමුපකාර සමිති ජාලගත කර දේශීය වෙළෙඳපොළ පමණක් නොව ගෝලීය වෙළෙඳපොළ දක්වා ගමන් කිරීමේ හැකියාව ගවේෂණය කළ යුතුය. මෙය කුඩා සමිතිවලට නවෝත්පාදන (Innovation) වැනි දැවැන්ත ආයෝජන අවශ්‍ය වන ක්ෂේත්‍රවල සාර්ථක වීමට මඟ පාදයි.

**සමාජ විපරිවර්තනය ඉලක්ක කිරීම (Targeting Social Transformation):** සමුපකාරයේ මූලික අරමුණ සමාජ විපරිවර්තනය බවට පත් කළ යුතුය. ලාභයෙන් 10% ක් ප්‍රජාව වෙනුවෙන් වෙන් කරමින් , අධ්‍යාපනය සහ සමාජ සේවා ව්‍යාපෘති හරහා සමුපකාරය පොදු ජනතාවට විවෘත කිරීම අත්‍යවශ්‍ය වේ.

**රාජ්‍ය ප්‍රතිපත්තිමය සහයෝගය (State Policy Support):** ඉතාලි ව්‍යවස්ථාවේ (47 වගන්තිය) මෙන්, ශ්‍රී ලංකාවේ සමුපකාර සඳහා බදු සහන ඇතුළු වාසිදායක නෛතික සහ ප්‍රතිපත්තිමය තත්ත්වයන් හිමිකර දිය යුතුය.

**නිගමන හා ප්‍රතිපත්තිමය ගම්‍යවීම්**

ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරයේ ඉදිරි ගමනට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා, මෙම පත්‍රිකාව විශ්වීය මට්ටමේ සාර්ථක සමුපකාර ද්විත්වයක් වන මොන්ඩ්‍රාගොන් සහ එමිලියා රොමාග්නා ආකෘති විශ්ලේෂණය කරයි. ධනවාදී නිෂ්පාදන මාදිලියට විකල්පයක් පවතින බවට මෙම ආකෘති විසින් ස්ථිර සාක්ෂි සපයයි. මොන්ඩ්‍රාගොන් ආකෘතියේ පදනම වී ඇත්තේ කම්කරු පරමාධිපත්‍යය තහවුරු කිරීම සහ ප්‍රාග්ධනය උපකරණයක හා අප්‍රධාන ස්වභාවයකින් සැලකීමයි. තවද, සමාජ විපරිවර්තනය අරමුණු කර ගත් මෙම සමිතියේ සාර්ථකත්වය, ශාස්ත්‍රීය මට්ටමින් ප්‍රශංසාවට ලක් වීමට හේතු වී ඇත.

අනෙක් අතට, එමිලියා රොමාග්නා ආකෘතිය කුඩා පරිමාණ ව්‍යවසායන් සමුපකාර ආකෘතියට අනුව සංවිධානය වී , ඒවා ජාලගතව ගෝලීය වෙළෙඳපොළ දක්වා ගමන් කිරීමේ සාර්ථකත්වයක් නිරූපණය කරයි. මෙම කලාපය යුරෝපයේ වැඩිම සමුපකාර ප්‍රමාණයක්

සංකේන්ද්‍රිත කලාපය වීම සහ සිය පුරවැසියන්ගෙන් අති බහුතරය සමුපකාර සාමාජිකයන් වීම මෙම ආකෘතියේ සමාජීය හා ආර්ථික සාර්ථකත්වය තහවුරු කරයි.

ඒ අනුව, ලාංකේය සමුපකාර සන්දර්භය තුළ නව උපක්‍රම හා සැලසුම් සැකසීමේදී, මෙම විශ්වීය මූලධර්මයන් යථාර්ථවාදී ලෙස යොදාගත යුතුය. විශේෂයෙන්ම, කම්කරු පරමාධිපත්‍යය මූලධර්ම ගත කිරීම, අන්තර් සමුපකාර සහයෝගීතාව තුළින් නවෝත්පාදන සඳහා යොමු වීම සහ ප්‍රතිපත්තිමය සහයෝගය තහවුරු කර ගැනීම (උදා: ව්‍යවස්ථානුකූල පිළිගැනීම ) ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය සාර්ථක හා ස්ථාවර ව්‍යාපෘතියක් බවට පත් කිරීමට ඇති හැකියාව මෙම විශ්ලේෂණය මගින් අවධාරණය කරයි.

**සමුද්දේශ**


Restakis, J. (2007). The Emilian Model-Profile of a Co-operative Economy.

Logue, J. (2006). Economics, Cooperation, and Employee Ownership: The Emilia-Romagna model–in more detail. *Community Wealth, Ohio Employee Ownership Centre, Kent, OH.*

McDonnell, D. P., Macknight, E. C., & Donnelly, H. (2012). Democratic Enterprise: Ethical business for the 21st century.

Errasti, A. M., Heras, I., Bakaikoa, B., & Elgoibar, P. (2003). The internationalisation of cooperatives: the case of the Mondragon Cooperative Corporation. *Annals of Public and Cooperative Economics*, *74*(4), 553-584.

Novkovic, S. (2008). Defining the co-operative difference. *The Journal of Socio-Economics*, *37*(6), 2168-2177.

Corcoran, H., & Wilson, D. (2010). *The Worker Co-operative Movements in Italy. Mondragon and France: Context, Success Factors and Lessons,* Canadian Worker Co-operative Federation.

Wolff, Richard (Sunday 24 June 2012). Yes, there is an alternative to capitalism: Mondragon shows the way. Retrieved 06:53, August 13, 2017, from

https://www.theguardian.com/commentisfree/2012/jun/24/alternative-capitalism-mondragon

Mondragon Corporation. (2017, August 12). In *Wikipedia, The Free Encyclopedia*. Retrieved 06:53, August 13, 2017, from https://en.wikipedia.org/w/index.php?title=Mondragon_Corporation&oldid=795122392

**ව්‍යවහාරික ශාස්ත්‍රීය සංග්‍රහය**
ISSN 2961-5003 (Print) | ISSN 3121-3472 (e-Version)
**3 වෙළුම, ii වන නිකුතුව - 2025 ජූලි-දෙසැම්බර්**
පත්‍රිකා අංක 06

# තරඟකාරීත්වය හා සමුපකාරය

අසංක වීරසිංහ[14]
asanka2013sanasagm@gmail.com

**සාරසංක්ෂේපය**

තාක්ෂණය සහ නවෝත්පාදනය වේගයෙන් වැළඳ ගන්නා පෞද්ගලික ව්‍යවසායයන් සමඟ තනි වෙළඳපොළක් තුළ ක්‍රියාත්මක වීමේදී, සමුපකාර ව්‍යාපාරය සිය අභ්‍යන්තර ගැටලු පසෙකලා මූලෝපායික තරඟකාරී කළමනාකරණයක් අනුගමනය කළ යුතුය. සමුපකාර ව්‍යාපාරය, රොබට් ඩන්කන්ගේ තීරණාත්මක පාරිසරික තත්ත්වයන් වන ස්ථාවර-ගතික සහ සරල-සංකීර්ණ යන තත්ත්වයන්ට මුහුණ දෙන අතර, බාහිර තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දීම සඳහා කළමනාකරණය කළ හැකි අභ්‍යන්තර පාරිසරික සාධක අනුවර්තනය කරගත යුතුය. සමුපකාරවල පැවැත්ම මූලික තරඟකාරී සාධක තුනක් කළමනාකරණය කිරීම මත රඳා පවතී: ප්‍රථමව, මූලික නිෂ්පාදනයෙන් හෝ සේවාවෙන් ඔබ්බට ගොස් විශිෂ්ට පාරිභෝගික සත්කාරයක් සහ ද්විතීයික පැකේජ (අත්දැකීම්, ආකර්ෂණීය ස්ථාන, තොරතුරු සේවා) ලබා දීම මගින් පක්ෂපාතී පාරිභෝගික පදනමක් ගොඩනැගීම; දෙවනුව, සමුපකාරයේ කීර්තිනාමය ආරක්ෂා කරන විශ්වාසවන්ත අතරමැදියන් සුරක්ෂිත කර ගැනීම; සහ තෙවනුව, නිෂ්පාදන ධාරිතාවට ගැළපෙන පරිදි උසස් තත්ත්වයේ අමුද්‍රව්‍ය නිවැරදි ප්‍රමාණයෙන් සහ නියමිත වේලාවට ලබා දෙන හොඳම සැපයුම්කරුවන් තෝරා ගැනීමයි. මෙම සාධක සාර්ථකව ජය ගැනීම සඳහා සාම්ප්‍රදායික මූලික සාරධර්ම ආරක්ෂා කරගනිමින් නවෝත්පාදනය වැළඳ ගැනීම අවශ්‍ය වෙයි.

**මූල පද:** උපාය මාර්ගික කළමනාකරණය, තරඟකාරී පරිසරය, අභ්‍යන්තර/බාහිර පරිසරය , පාරිභෝගික ලැදියාව

[14] B.Sc, PhD

**ප්‍රවේශය**

ආයතනයක කළමනාකරණ ක්‍රියාවලිය සරල ක්‍රියාවලියක් නොවේ. ඕනෑ ම ආයතනයක් තරඟකාරි ලෙස ක්‍රියාත්මක පරිසරය තුළ තම ස්ථාවරත්වය ආරක්ෂාකර ගැනීම වෙනුවෙන් ක්‍රියා කිරිමේ දී විවිධ වූ උපාය උපක්‍රමිකයන් ක්‍රියාත්මක කිරිමට සිදු වේ. සමුපකාර ව්‍යාපාරය තුළ ද එකී උපාය උපක්‍රම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය දැඩිව ඇත. සමුපකාර ව්‍යාපාරය මුදලින් පෝෂණය වුව ද සේවක දැනුම හා ආකල්ප ඊට අනුගතව පෝෂණය නොවීම මෙන් ම, තරඟකාරී උපාය උපක්‍රම නිසි පරිදි හසුරුවාලීමට අසමත්වීම සමුපකාර ක්ෂේත්‍රය ලැබූ ජයග්‍රහණයන් ආපස්සට හරවන තත්ත්වයක් නිර්මාණය කරවන්නක් විය හැකි ය. එය අකමැත්තෙන් වුව ද තේරුම් ගත යුතු සත්‍යයකි. එයට ප්‍රධානත ම හේතුව තරඟකාරි පරිසරය තුළ පෞද්ගලික ව්‍යවසායකයා වේගයෙන් තාක්ෂණය තම ව්‍යාපාර කටයුතු සමග ඒකාබද්ධ කර ගනිමින් නව්‍යකරණයට ලක්වීමත්, සමුපකාර ව්‍යාපාරය එයට දක්වන අනුකූලතාවය ප්‍රමාණවත් නොවීමත් ය. දෙපාර්ශවය ම වෙළෙඳ පොළ දෙකක වෙන වෙන ම කටයුතු කරන්නේ නම් සැබැවින්ම ගැටලුවක් නොවනු ඇත. එහෙත් සියලු ම පාර්ශවයන් කටයුතු කරන්නේ එක ම වෙළඳපලක් තුළ බව අවබෝධ කර ගැනීම වැදගත් ය.

**සංවිධාන පරිසරය**

1979 දි තරඟකාරි පරිසරය සම්බන්ධයෙන් අදහස් දක්වන රොබට් ඩන්කන් නැමැති මතධාරියා පෙන්වා දී ඇත්තේ ඕනෑ ම ව්‍යාපාරයක් සඳහා වලංගු වන පරිසර කාණ්ඩ දෙකක් පවතින බවයි. එම පරිසර තත්ත්වයන්ට ශ්‍රී ලාංකික සමුපකාර ආයතන ද මුහුණ දෙනු ලබයි.

- ගතික - ස්ථාවර පරිසරය (Stable – dynamic)
- සරල - සංකීර්ණ පරිසරය (Simple – Complex)

ඉහත කී පරිසර තත්ත්වයන් සමුපකාර ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක ව්‍යාපරයන්ට ද අදාළ වේ. එකී පරිසර තත්ත්වයන් වල දී ඒ ඒ තත්ත්වයන්ට උචිතවන පරිදි ක්‍රියා කිරීමේ අවශ්‍යතාවය සමුපකාර ක්ෂේත්‍රයේ සෑම නායකයෙක් ම සහ කළමනාකරුවෙක් ම මනාව තේරුම් ගත යුතු ය. ඒ අනුව, ඉදිරියට තබන පියවර කුමක්ද....? එය කෙසේ විය යුතු ද ....? සහ පසුපසට තබන පියවර කුමක්ද..? එය කෙසේ විය යුතු ද ...? යන්න සම්බන්ධයෙන් ස්වයං අවබෝධය සෑම නායකයෙකු ම සහ කළමනාකරුවෙකු ම සතු විය යුතු ය. එය පොතපතින් හෝ වෙනයම් ආකාරයක විධිමත් අධ්‍යාපනයක් තුළින් පමණක් ලැබිය නොහැකි ය. එනම්, පොත පතෙහි කරුණු සහ වෙනයම් ආකාරයන්හි විධිමත් අධ්‍යාපනයන් තුළින් ලැබූ අවබෝධය සමඟ ස්වයං අවබෝධය, ස්වයං අත්දැකීම මිශ්‍රකරගත් නායකත්ව සහ කළමනාකරණ අවබෝධයක් තිබීම වැදගත් ය. ඒ සඳහා සමුපකාර පරිචය පිළිබඳ දැනහැදින ගත යුතු ය.

සංවිධාන පරිසරය යනු ආයතනික ක්‍රියාකාරකම් සඳහා බලපෑම් එල්ලකරන ඕනෑ ම සාධකයකි. එනම් ආයතනයක ක්‍රියාකාරිත්වය සඳහා බලපෑම් එල්ල කරනවන විවිධ සාධක හෙවත් සංරචක

සියල්ල පරිසරයට අයත් ය. එම බලපෑම ධනාත්මක බලපෑමක් හෝ සෘණාත්මක බලපෑමක් විය හැකි ය. සමහර විටක ඉතාමත් සහයෝගීව සහ-සම්බන්ධ වන සංරචක විටෙක ඉතාමත් ඉහළ තරඟකාරී සාධක හා තත්ත්වයන් නිර්මාණය කරන්නක් විය. ඒ අනුව සංවිධාන පරිසරය ප්‍රධාන කොටස් දෙකකින් යුක්තය.

- අභ්‍යන්තර පරිසරය
- බාහිර පරිසරය

**අභ්‍යන්තර පරිසරය**

අභ්‍යන්තර පරිසරය යනු, කළමනාකරණයට තම අවශ්‍යතාවය පරිදි වෙනස් කර ගැනීම් කළහැකි පරිසරයයි. ඒ අනුව, ගරු අධ්‍යක්ෂක මණ්ඩලය හෙවත් ගරු කාරක සභික මණ්ඩලය සහ ස්වකීය සීමාව තුළ කළමනාකරණය විසින් ගනු ලබන තීරණ යටතේ වෙනස්කරගත හැකි කිසියම් වූ ආයතනගත කරුණක් ඇතොත් ඒවා අභ්‍යන්තර පරිසරයට අදාළ වේ. උදාහරණ ලෙස කාර්යාලීය පරිශ්‍රය සකස් කර ගැනීමේ ආකාරය, තම අභ්‍යන්තර චක්‍රලේඛන, ප්‍රතිපත්ති, ක්‍රියාමාර්ග, වැඩසටහන්, තනතුරු නාමයන් බලතල පැවරුම් ආදිය දැක්විය හැකි ය. මෙම සංරචක සෑම විටක ම බාහිර තරඟකාරී ලෝකයට මුහුණ දිය හැකි පරිදි සකස් කරගත යුතු ය. තමන්ට පමණක් ආවේණික වන පරිදි සහ අවශ්‍ය පරිදි සකස් කර ගැනීමෙන් ලැබිය හැකි ප්‍රතිඵලයන් සීමිත ය. එමනිසා බහිර්වර්ති පදනමක් මත පිහිටා මෙම සංවරක හසුරවාලීමට මෙම කළමනාකරණ මණ්ඩලයන් කටයුතු සැලසිය යුතුය.

**බාහිර පරිසරය**

බාහිර පරිසරය යනු කළමනාකරණයට තම අවශ්‍යතාවය පරිදි වෙනස්කර ගැනීමට නොහැකි මෙන් ම, අනිවාර්යෙන් වෙනසකට ලක්වන, සංවිධානයෙන් බැහැරව පවතින වෙනත් පරිසර සාධකයන්ය. එනම්, නායකත්වයට සහ කළමනාකරණයට සිදුවන්නේ වෙනස්වන සාධකයන් හි වෙනස තේරුම් ගනිමින් අභ්‍යන්තර පරිසර සාධක වෙනස් කර ගැනීමයි. උදාහරණ ලෙස සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විගණන ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා ආකෘති සමුපකාර සංවර්ධන දෙපාර්තfමින්තුව විසින් වෙනස් කළහොත් සමිති කළමනාකරුවන්ට සිදුවන්නේ විගණනයට ඉදිරිපත් කරන ලේඛන සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉල්ලුම් කරන ආකෘතිවලට යටත්ව සකස් කිරිමට මිස ඉන් බැහැරව ක්‍රියා කිරිමට නොවේ. එනම් භාහිර පරිසරයට අනුගත වීම මිස එය මඟහරවා යාම නොවේ.

මෙසේ හඳුනාගන්නා බාහිර පරිසරය ප්‍රධාන කොටස් කිහිපයකි.

**ක්‍රියාකාරි පරිසරය (Task environment)**

සංවිධාන කටයුතු සඳහා සෘජුව ම බලපෑම් ඇතිකරනු ලබන පරිසර සංරචකයන් ය. එනම්, සාමාජිකයන්, ණය දෙනු ලබන ආයතන, බාහිර තැන්පත් කරුවන්, සෘජුව සහ - සම්බන්ධතා

පවත්වන ආයතන, බැංකු, සැපයුම්කරුවන්, ලීසිං සමාගම්, අතරමැදියන් ආදි පාර්ශව මෙම පරිසරය තුළ ක්‍රියාත්මක වේ. මෙම සංරචකවල බලපෑම් සමුපකාරික ආයතනයට ඉතා තදින් ම දැනේ. ඒ නිසා මෙම සංරචකයන්ට ඉතා සංවේදීව කටයුතු කිරීම ඉතාම වැදගත් ය. එසේ නොවුනහොත් තම පැවැත්ම පිළිබඳ ගැටළු ඇතිවේ.

**දේශීය පරිසරය හෙවත් සාමාජීය පරිසරය**

මෙය ප්‍රධාන කොටස් කිහිපයකි. දේශපාලනික, සමාජ හා සංස්කෘතික, තාක්‍ෂණික, නෛතික , ජන විඥානය, ස්වාභාවික පරිසර තත්ත්වයන්, ආර්ථික සාධක ආදිය ඉන් ප්‍රධාන වේ. උදාහරණ ලෙස සමුපකාර සමිති ක්‍රියාකාරීත්වය අයහපත්යැයි සමාජ මතයක් ඇති වුවහොත් එය සමුපකාර සමිති සංවිධාන වලට අහිතකර අයුරින් බලපෑම් ඇතිකිරීම දැක්විය හැකි ය. එමෙන් ම, අධික වියලි කාලගුණය තේ වගා කටයුතු සඳහා හානිකර අන්දමින් බලපෑම නිසා තේ වගාව ආශ්‍රිත ප්‍රදේශවල පවතින මූල්‍ය සේවා සමුපකාර සමිතිවල සාමජික තැන්පත් අඩුවීම මෙන්ම, නව තැන්පත් නොලැබී යාම දැක්විය හැකිය. එමෙන් ම සමුපකාර අලෙවිසැලට වඩා පෞද්ගලික වෙළඳසැල යහපත්යැයි ඇතිවන සමාජ මතය නිසා සමුපකාර අලෙවිසැලට පැමිණෙන පාරිභෝගිකයින් ගිලිහී යා හැකි ය. එමෙන් ම, සමුපකාර රෝහලට වඩා පෞද්ගලික රෝහල නවීන වෛද්‍ය පහසුකම් වලින් සමන්විත නම්, සමුපකාර රෝහලට ඇති ආදායම අඩුවිය හැකි ය. සමුපකාර සමිති සඳහා නෛතික සහනයක් ලැබෙයි නම් වඩාත් හොඳින් සංවර්ධනයට අවස්ථාවක් ලැබිය හැකි ය.

**ගෝලීය පරිසරය**

ජාත්‍යන්තර වශයෙන් ඇතිවන සංසිද්ධි මේ යටතේ අදාළ වේ. උදාහරණයක් ලෙස ගල්ෆ් කලාපිය රටවල්වල ඇතිවන සිවිල් අරගල හේතුවෙන් එකී රටවල්හි තෙල් නිෂ්පාදනය අඩපන වීම නිසා අප රටෙහි ඉන්ධන මිල ඉහල යාම හේතු කරගෙන ඇතිවන ජීවන වියදම ඉහළ යාම සමුපකාර සමිතිවල සාමාජිකයින්ගේ හා පාරිභෝගිකයින්ගේ ජීවන වියදම වැඩිවීමට හේතුවන බැවින් සමිතිවල තැන්පත් අඩුවීමට මෙන් ම, තිබෙන තැන්පත් ගලා යාමට හේතුවක් සහ අලෙවි ආදායම අඩුවීමට හේතුවක් බව දැක්විය හැකි ය. එමෙන් ම, ලෝක වෙළඳපලට තේ ඉදිරිපත් කරන වෙනත් රටවල් ලංකාවේ තේ නිෂ්පාදයන්ගේ මිලට වඩා අඩු මිලකට තේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, තේ සමුපකාර සමිති (ආනයනයට අදාළ) වල ආදායම අඩුවිය හැකි ය.

ඒ අනුව, පරිසරය කුමක්ද..? යන්න හඳුනාගෙන ක්‍රියා කිරීම වැදගත් ය. මේ සම්බන්ධයෙන් පුළුල් වශයෙන් අදහස් දක්වා ඇති රොබට් ඩන්කන් පෙන්වා දී ඇත්තේ ගතික තත්ත්වය තුළ ඉතා ශීඝ්‍රව පරිසර සාධක වෙනසකට ලක්වීමත්, සංකීර්ණ තත්ත්වය තුළ පරිසර සාධක විශාල ප්‍රමාණයක් ව්‍යාපාර කටයුතු සඳහා බලපෑම් එල්ලකරලීමත් හේතු කරගෙන එවන් ගතික - සංකීර්ණ පරිසර තත්ත්යන්ට මුහුණදෙන සංවිධානයන් හි ප්‍රතිපත්ති සම්පාදනයේ දී කළමනාකරුවන් අතිශය අසීරුතාවයන්ට මුහුණ දෙන බවයි. ඒ සඳහා ඇති හොඳ ම විසඳුම

උපක්‍රමික කළමනාකරණ ක්‍රමවේද භාවිතයට ගැනීම බවද පෙන්වා දී ඇත. එම පෙන්වාදීම සමුපකාර සමිති සංවිධානවල ගරු අධ්‍යක්ෂක මණ්ඩලයන්ට හා විධායක මට්ටමේ නිලධාරින්ට අතිශය වැදගත් වනු ඇත. ඒ සඳහා උපායමාර්ගික කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා යොමු විය යුතුව ඇත.

සමුපකාර සමිති ව්‍යාපාරයට ද උපක්‍රමික කළමනාකරණ ක්‍රමවේද අවශ්‍ය බව කාලීන තත්ත්වයන් අනුව පෙනී යයි. දිනෙන් දින දියුණුවන සමුපකාර සමිති සාම්ප්‍රදායක තත්ත්වයෙන් මිදී, එනමුත්, සාම්ප්‍රදායකව පවතින අතිශය වැදගත් හර පද්ධතීන් රැක ගනිමින් නව්‍යකරණයට ලක්වීම අත්‍යවශ්‍ය ය. එසේ නොවුනහොත් ඇතිවන තරගයට මුහුණ දිය නොහැකි ය.

**තරගකාරිත්ව සාධක**

තරගකාරි වටපිටාවක් තුළ කටයුතු කරන ආයතන විසින් තරගකාරිත්වය නිර්මාණ කරවන ප්‍රධාන සාධක තුනකි. එකී සාධක තුනට ම අදවන විට සමුපකාර සමිති මුහුණ දෙමින් පවති.

1. ආයතන ලැදි පාරිභෝගික පිරිසක් ඇතිකර ගැනීම.
2. හොඳ ම අතරමැදියන් ලබා ගැනීම.
3. හොඳ ම සැපයුම්කරුවන් දිනා ගැනීම

ඉහත කී කරුණු හෙවත් තරගකාරිත්වය තීවු කරන සාධක සමුපකාර ව්‍යාපාරයේ සංවිධාන වලට බලපාන්නේ කෙසේද ... යන්න හඳුනා ගැනීම වැදගත් ය. මදක් සිතන්න. සමුපකාර සමිතියක ක්‍රියාකාරි සාමාජිකත්වය දිනෙන් දින කුමන තත්ත්වයකට පත්වෙමින් පවතී ද... දැනට සිටින සාමාජිකයින් ද වයස් සංයුතිය අනුව කාණ්ඩගත කළහොත් හඳුනාගත හැකි තත්ත්වය කුමක්ද ... ඒ අනුව, ඔබට ස්වයංව පෙනීයනු ඇත්තේ තරුණ පරම්පරාfවි දායකත්වය ඉතා අඩුවෙන් ලැබී තිබිමත්, දහස් ගණනින් හෝ සිය ගණනින් සාමාජික නාම ලේඛනය තුළ සාමාජිකයින්ගේ නාමයන් පැවතියද ක්‍රියාකාරි සාමාජිකත්වය වර්ෂයෙන් වර්ෂය අඩුවීමේ වේගයක් පෙන්නුම් කිරිමත් ය. සත්‍ය වශයෙන් ම ආයතනයට ලැදි පාරිභෝගික පිරිසක් ඇතිකර ගැනීමේ අවශ්‍යතාවය මත සිදු කරන කාර්යයක් යැයි ප්‍රකාශ කරමින් සමුපකාර සමිතියකට අයත් බල ප්‍රදේශ උල්ලංඝණය කරන සමුපකාර සමිති දැකිය හැකි ය. එය සමුපකාර ප්‍රතිපත්ති සාරධර්ම හා ආචාරධර්ම උල්ලංඝණය කොට ක්‍රියා කිරීමකි. එබැවින් පාරිභෝගිකයින් හා සාමාජිකයින් වැඩිකර ගැනීමට එවැනි ක්‍රම අනුගමනය නොකිරීමට වගබලා ගැනීම අතිශය වැදගත් ය.

**ආයතන ලැදි පාභෝගික පිරිසක් ඇතිකර ගැනීම**

ඕනෑ ම සංවිධානයකට ඉතාමත් වැදගත් පාර්ශවය වන්නේ පාරිභෝගිකයා ය. පාරිභෝගිකයා යනු අවසන් වශයෙන් භාණ්ඩය හෝ සේවාව පරිභෝජනය කරනු ලබන පුද්ගලයා ය. එම පුද්ගල සංඛ්‍යාව වැඩිවන තරමට සහ එම අය විසින් ඉල්ලුම් කරන භාණ්ඩ ඒකක ගණන හෝ

සේවා වාර ගණන වැඩිවන තරමට අදාළ සමුපකාර ආයතනයේ ආදායම ඉහළ යයි. ආදායම ඉහළ යනවිට පිරිවැය ආවරණ හැකියාව (මෙහෙයුම් කාර්යක්ෂමතාවය) ඉහළ යමින් අතිරික්තයක් හෙවත් ලාභයක් ලැබිය හැකි වේ. එසේ වනවිට ඉතිරි ලාභ සංචිතය ඇතුළු අතුරු ව්‍යවස්ථානුකූලව ලාභ විසර්ජනය යටතේ වන සංචිත හා අරමුදල් ගිණුම් ශේෂ ඉහළ නංවා ගත හැකි ය. අවසන් වශයෙන් සමුපකාර සමිතියේ හිමිකම් හෙවත් සමුපකාර සමිතියේ අයිතිය (සාමාජික අයිතිය යැයි කීම ද වරදක් නොවේ) ඉහළ නංවාගත හැකි ය.

1972 අංක 05 දරන සමුපකාර පනත, විවිධ පළාත්බද ප්‍රඥප්ති, විවිධ ස්වභාවයෙන් සංශෝධනයට ලක්කරගත් අතුරු ව්‍යවස්ථා, විවිධ තත්ත්ව යටතේ ක්‍රියාත්මක වන කොමිෂන් සභා නීතිරීති හා චක්‍රලේඛන ආදිය කුමන තත්ත්වයක් යටතේ පැවතිය ද එය පාරිභෝගිකයාට අදාළ නොවන තත්ත්වයකි. උදාහරණ ලෙස සමුපකාර ගණයට අයත් රෝහලකින් ප්‍රතිකාර ගැනීමට පැමිණෙන රෝගියාට හෝ සේවාලාභියාට, උක්ත නීතිරීති කිසිවක් අදාළ නැත. එම පාරිභෝගිකයාට අවශ්‍ය වන්නේ වඩාත් හොඳයැයි පිළිගත් වෛද්‍යවරයෙකු ගෙන් සේවාව සහ ඉහළ පහසුකම් සහිත රෝහල් සේවාවකි. එහිදි අදාළ සමුපකාර රෝහලේ සේවකයින්ට කොමිෂන් සභා නෛතික තත්ත්ව අනුව වැටුප් අඩු ද, වැඩි ද, දීමනා ප්‍රමාණවත් ද, නැති ද, හෝ රුපියල් පන්දහසකට වැඩි උපකරණ ලබා ගැනීමේ දී කොමසාරිස් අනුමැතිය අවශ්‍ය වේ ද.., නැති ද., තමන් පරීක්ෂාවට ලක්කරන උපකරණ අදාළ සමුපකාර රෝහල විසින් මිලට ගෙන ඇත්තේ අනුමැතිය ඇතිව ද.., නැතිව ද, පාලක මණ්ඩලයට එරෙහිව විවිධ පරීක්ෂණ පවතී ද.., නැති ද.., යනාදී වශයෙන් වූ කිසිවක් පාරිභෝගිකයාට අදාළ නැත. පාරිභෝගිකයාට අදාළ වන එකම දෙය ඉහළ පාරිභෝගික සත්කාරය සහිත සෞඛ්‍ය සේවාවකි.

තවත් අයුරකින් පාරිභෝගික අලෙවි සේවා කරන සමුපකාර සමිතියක් හෝ නිෂ්පාදන සමුපකාර සමිතියක් සලකා බලන්නේ නම්, එම ඒකකයන් හි පාරිභෝගිකයාට අවශ්‍ය වන්නේ ඉහළ ප්‍රමිතියෙන් යුක්ත භාණ්ඩ තම පාරිභෝජන අවශ්‍යතා සඳහා ලබා ගැනීමයි. එහිදි පාරිභෝගිකයාට කැමැත්ත ඇතිවන්නේ නවීන ගෙවීම් ක්‍රම සහිත, වාහන නැවතුම්පලක් සහිත, ආකර්ශනීය ඇසුරුම් හා ප්‍රවර්ධන ක්‍රම සහිත ස්වයං තෝරා ගැනීම කළහැකි මෙන් ම, විනීතවත් පාරිභෝගික සත්කාරයක් ඇති හිත්ගන්නා සුලු පාරිභෝගික සේවාවකි. එහි සේවය කරන සේවක, සේවිකාවන්ගේ වැටුප කීයද ...? අතිකාල ලැබෙන්නේ ද, යන්න ඔවුන්ට කිසිසේත් ම අදාළ නැත. සමුපකාර සේවකයා මෙය අවබෝධ කරගත යුතුව ඇත. තමන්ට අතිකාල නොලැබීම හෝ අතිකාල පැයක වටිනාකම අඩුවීම හෝ වැටුප අඩුවීම හෝ වෙනයම් අභ්‍යන්තර ගැටළු පාරිභෝගිකයා වෙත මුදා හැරීම (උදාහරණ ලෙස ඔවුන් සමග කතා කිරීම, සිනාසීමෙන් වැළකීම, සේවාවන් සැපයීමේ මන්දගාමීත්වය.....ආදිය) කිසිවිටකත් නොකළ යුතු ය. සමුපකාර සමිති සංවිධාන පාලනය කරන ගරු අධ්‍යක්ෂක මණ්ඩලයන් ද, නියාමනය අධිකාරීන් ද එය මනාව තේරුම් ගැනීම වැදගත් ය. ඒ සියලුම දෙනා තමන්ගේ භූමිකාවන්, තම තමන්ට පැවරුණ නෛතික සීමාවන්ට යටත්ව සම්පූර්ණ කිරීමට සෑම කෙනෙක්ම උත්සාහ දරණවා විය හැකිය. නමුත්, ඒවා කිසිවක් අවසන් පාරිභෝගිකයාට කිසිඳු අදාළත්වයක් නොමැති තරමය.

පාරිභෝගිකයා අපේක්ෂා කරන ප්‍රශස්ථ මට්ටමේ සෞඛ්‍ය සේවාව, ඉහළ පාරිභෝගික සත්කාරය, ප්‍රමිතිගත නිපැයුම්, ප්‍රමිතිගත පාරිභෝගික භාණ්ඩ, පාරිභෝගිකයාට නොලැබෙන්නේ නම් වෙනත් තැනකට ගමන් කිරීමට පාරිභෝගිකයා පසුබට නොවෙති. එවිට , සමුපකාරයේ හැටි මෙහෙමයි, කීමට වඩා වැදගත් වන්නේ ඒසේ නොවීමට අවශ්‍ය මාර්ගය ස්ථාපිත කිරීමට වගබලා ගැනීමයි. එනම්, නූතනයට ගැළපෙන නෛතික විධිවිධාන සකස් කර ගැනීමට අවැසි බලපෑම ඇතිකිරීමයි. නූතනයට ගැළපෙන සේවක වැටුප්, වරප්‍රසාද, ආයතනික සංවර්ධනය ලගාකරගත හැකි නම්‍යශීලි නෛතික ප්‍රතිපත්ති, තරඟකාරිත්වයට උචිත ප්‍රතිචාර දැක්වීම සඳහා වන පහසුකම ස්ථාපිත කර ගනිමින්, වෙනස්, වෙනස් පාරිභෝගික අපේක්ෂාවන් සහ තෘප්තීන් ආමන්ත්‍රණයට අවශ්‍ය පහසුකම ස්ථාපිත කර ගැනීමට වගබලා ගැනීම වැදගත් ය. එය ඉටුනොකොට පාරිභෝගිකයා මත එහි පීඩනය මුදා හැරීමට පියවර ගැනීම තුළින් ඇතිවන්නේ සමුපකාර සංවිධානයට ලැදිව සිටින පාරිභෝගිකයා ද සමුපකාර සංවිධාන වෙතින් ඉවත්වීම හෝ දුරස් වීම පමණි.

පෞද්ගලික ව්‍යවසායකයා තම වෙළෙඳ පොළ කොටස වර්ධනය කර ගැනීම හා දැනටමත් ඇති වෙළෙඳ පොළ කොටස ආරක්ෂා කර ගැනීමට නව්‍යකරණයට ලක්කළ විවිධ උපාය, උපක්‍රම දියත් කරයි. ඒවාට ඔරොත්තු දෙන හෝ අභිබවා යන ක්‍රමවේද සමුපකාර ව්‍යවසායකත්වය තුළ ද අන්තර්ගත කළ යුතු ය. එහෙත් වෙළඳපල ක්‍රමයන් තුළ භාවිතයට ගනු ලබන සදාචාරාත්මක නොවන හෝ ,කෙසේ හෝ ලාභ ලැබීම, අරමුණු කරගත් ක්‍රමවේද කිසිවිටකත් සමුපකාරයට ඇතුළත් කර නොගැනීමට ද වගබලා ගත යුතු ය.

උදාහරණ ලෙස කාමර පහසුකම් සපයන සමුපකාර සමිති ව්‍යවසායකත්වයක් විසින් තම පහසුකම් උපරිම අයුරින් වැඩිදියුණු කොට සැපයිය යුතු ය. ඇඳන්, වායු සමීකරණ, ජලනල පද්ධති ක්‍රියාකාරිත්වයන්, අවට අලංකරණය, පවිත්‍රතාවය, ආහාරවල සෞඛ්‍ය සම්පන්න බව හා ප්‍රනීතවත්භාවය, ආකාර්ෂණිය සේවාව, සිත්ඇදගන්නා සුලු පාරිභෝගික සත්කාරය, ආදිය උපරිමයෙන් සැපයිය යුතු ය. එසේ නමුත්, අවුරුදු 18 ට අඩු අයට පහසුකම් සැපයීම හෝ ගණිකා වෘත්තිය හෝ එයට සමගාමී ක්‍රියාවන්ට පහසුකම් ලබා දීම කිසිදු අයුරකින් නොකළ යුතු ය.

පාරිභෝගිකයාට අවශ්‍ය කුමක්ද..? ඒ සඳහා පාරිභෝගිකයා ඉල්ලුම් කරන හොඳම ස්ථානය සමුපකාර රෝහල, සමුපකාර රංග ශාලාව, සමුපකාර අලෙවිසැල, සමුපකාර දේශන ශාලාව, සමුපකාර හෝටලය, සමුපකාර නේවාසිකාගාරය, සමුපකාර නිෂ්පාදනාගාරය, සමුපකාර මුද්‍රණාලය, බවට පත්කර ගැනීමට අවැසි අවධානය යොමු කළ යුතුව ඇත. එය පහසු නොවන කටයුත්තකි. එහෙත් ඉදිරි පියවරයන් යහපත් කර ගැනීමට නම් එය අනිවාර්යෙන් ඉටුකළ යුතුව ඇත. එසේ නොවුනහොත් නූතන තාක්‍ෂණවාදී පරම්පරාවේ පාරිභෝගික බලාපොරොත්තු ඉටු කිරීමට අසමත්වීම මත සමුපකාර ව්‍යවසාය පසුගාමීත්වයට පත්වනු ඇත. සෙමෙන්, සෙමෙන් මිය යමින් සදාකාලික මරණයට පත්වීම වළක්වාගත නොහැකි වනු ඇත. ඒ නිසා සෑම සමුපකාර සමිතියක් ම තමන්ගේ පැවැත්ම සහතික කර ගැනීම උදෙසා ඉටුකළ යුතු අවම

කාර්යය හෙවත් මූලික පැකේජය පමණක් නොව ඉන් ඔබ්බට ගිය ද්විතියික පැකේජයක් දක්වා තම භාණ්ඩ හා සේවාවන් සංවර්ධනය කර ගැනීමට අවශ්‍ය අවධානය යොමු කළ යුතු ය.

**හොඳම අතරමැදියන් ලබා ගැනීම**

ඕනෑ ම ආයතනයක නිෂ්පාදනයක් පාරිභෝගිකයා දක්වා රැගෙන යාමට අතරමැදියන් අවශ්‍ය ය. බොහෝ නිෂ්පාදන ආයතන තම නිෂ්පාදනය අලෙවි කරනුයේ සිල්ලර වෙළඳසැල් වෙත තම නිෂ්පාදනය යොමු කිරීමෙන් පසුව ය. සිල්ලර වෙළෙන්දා වෙත ප්‍රවේශ විය හැකි ආකාර කිහිපයක් නිෂ්පාදකයා සතුව පවතී.

- තමන් විසින් ම භාණ්ඩ සිල්ලර වෙළෙන්දා වෙත ලබා දීම.
- නියෝජිතයකු මගින් සිල්ලර වෙළෙන්දාට ලබා දීම.
- තොග වෙළෙන්දකු හෝ කිහිප දෙනෙකු මගින් සිල්ලර වෙළෙන්දාට ලබා දීම.
- අවශ්‍ය නම් සිල්ලර වෙළෙන්දා තමන් බවට පත්වීම.

ඉහත කුමන ආකාරයක් අනුගමනය කරමින් පාරිභෝගික පාර්ශවය වෙත භාණ්ඩ අලෙවි කලද, නිෂ්පාදනාගාරය හෝ නිෂ්පාදනාගාරයේ ගබඩා ඇති ස්ථානයේ සිට විවිධ ගම් හා නගර වල පිහිටි සිල්ලර වෙළෙන්දා දක්වා තම නිෂ්පාදන ඉතා වගකීමෙන් බෙදා හැරීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ සඳහා ඉතා විශ්වාසවන්ත, වගකීම් සහගත, කාර්යක්ෂම, පිළිගැනීමක් ඇති අතරමැදි පාර්ශවයක් සම්බන්ධ කර ගැනීම අත්‍යවශ්‍යය. උදාහරණ ලෙස කිරි නිෂ්පාදන බිහිකරන සමුපකාර සමිතියක තම නිපැයුම් පාරිභෝගිකයාට ලබා දෙන්නේ කෙසේද...? නිෂ්පාදනය ඉතා කුඩා මට්ටමක දී, නිෂ්පාදකයා විසින්ම පාරිභෝගිකයා වෙත අලෙවි කිරීම කළ හැකි නමුත් නිෂ්පාදන ප්‍රමාණය ඉහළ ප්‍රමාණයකින් සිදු කරන විට එම ක්‍රමය අනුගමනය අසීරු විය හැකි ය.

එමෙන් ම අලෙවි කරනු ලබන භූගෝලීය වපසරිය විශාල වනවිට තමන්ටම අලෙවිය සඳහා අලෙවි සැල් ස්ථාපිත කළ නොහැකි විය හැකිය. එවන් අවස්ථාවක සිදුවන්නේ කුමක්ද ...? තමන්ගේ නිෂ්පාදන වෙනත් අයකු මාර්ගයෙන් සිල්ලර වෙළඳසැල් දක්වා බෙදා හරිමින් අලෙවියට අවශ්‍ය පසුතලය සකසා ගැනීමයි. එනම් සිල්ලර වෙළෙන්දන් හෝ තොග වෙළඳාමේ නිරත අයගේ සහාය ලබා ගැනීමට සිදු විමයි. සමහර විටක සිල්ලර වෙළෙන්දා විසින් ම නිෂ්පාදනාගාරයට පැමිණ නිෂ්පාදන කිසියම් ප්‍රමාණයක් ප්‍රති-විකුණුම් සඳහා රැගෙන යනවා විය හැකි ය. එසේ නොවුනහොත් නිෂ්පාදකයා වන සමුපකාර සමිතියට සිදුවන්නේ පාරිභෝගිකයා දක්වා ප්‍රවාහනය කර දීමට ය. එම ප්‍රවාහනය සිදු කරන්නේ සමුපකාර සමිතියේ ම වාහන මගින් සමුපකාර සමිතියේ සේවකයින්මද..? පිළිතුර ,ඔව්, නම් ඉතා සාර්ථකව කාර්යය කළ හැකිව ඇත්තේ එහි පාලනය සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩලය සතුවන බැවිනි. යම් වරදක් - අඩුපාඩුවක් - නොගැළපෙන විනය විරෝධී ක්‍රියාවක් කලහොත් දඬුවම් දීමේ හා පාලන බලය සමිතිය ම සතු වන නිසා වඩාත් පහසුවක් පවතී.

නමුත්, පිළිතුර ,නැත , නම් අනිවාර්යයෙන් ම එම ප්‍රවාහන කාර්යය ඉටුකරන්නේ බාහිර පාර්ශවයක් විසිනි. එම බාහිර පාර්ශවය වඩාත් විශ්වාසදායක, වගකීම් සහගත කාර්යක්ෂම හා පිළිගැනීමක් ඇති බෙදාහරින්නෙකු වීම අත්‍යවශ්‍ය ය. සමුපකාර සමිතියේ කීර්තිනාමය ආරක්ෂා කරන හා එය ප්‍රවර්ධනය කරන්නෙකු බවට බෙදාහරින්නන් පත්විය යුතු ය. අතරමගක දී අදාළ භාණ්ඩයට හානිවන අයුරින් තම ක්‍රියාකාරිත්වය හා ගමන් ගැනීම් නොකරන (උදාහරණ ලෙස රථය ධාවනය කරන වේගය, මාර්ගය... ආදිය) බෙදාහරින්නන් බවට සනාථ කර ගත යුතුය. අතරමැද දී ලේබල් මාරු කිරීම් නොකරන, ඇතුලත ද්‍රව්‍ය මාරු කිරීම් නොකරන, අතරමැදි ගබඩා කටයුතු සිදුකිරීම් අවශ්‍ය වෙයි නම් එය නිසි පරිදි සිදු කරන සිල්ලර වෙළඳුන් සමග ඉතාමත් හොඳින් ගනුදෙනු කරන (වචනයෙන් හා ක්‍රියාවන්ගෙන්) රටේ පිළිගත් නෛතික වශයෙන් තහනම් ද්‍රව්‍ය සමුපකාර සමිතියේ නිපැයුම් සමග ප්‍රවාහනය නොකරන අතරමැදි පාර්ශවන් විය යුතු ය. එම තත්ත්වයන් ආරක්ෂා කිරීමට නිපැයුම ප්‍රවාහනය කරදෙන හෙවත්, හුවමාරු කටයුතු කරන පුද්ගලයා හෝ අයතනය අසමත් වන්නේ නම්, හානියට පත්වන්නේ සමුපකාර සමිතියේ කීර්තිනාමයයි. එම සමුපකාර සමිතියේ නිෂ්පාදනයේ වෙළඳ සන්නාමයයි. එබැවින් වෙළඳපල ක්‍රියාකාරිත්වයේ දී සමුපකාර සමිතියේ කිර්තිය හා සන්නම් නාමයේ කීර්තිය ආරක්ෂා වන පරිදි කටයුතු කරන අතරමැදියන් අවශ්‍ය වේ.

අනෙක් අතට පාරිභෝගිකයාට අවශ්‍ය වේලාවට භාණ්ඩ සැපයීම අත්‍යවශ්‍ය ය. එසේ නොවන්නේ නම් තරඟකාරි වෙනත් නිපැයුමක් හෝ සන්නමක් වෙත පාරිභෝගිකයා ආකර්ෂණය වේ. එය දිගු කාලීනව ඉතාමත් අවාසිදායක ය. එබැවින් නියමිත වේලාවට සිල්ලර වෙළඳසැල වෙත භාණ්ඩ රැගෙනයාමේ වගකීම නිසිපරිදි දර අතරමැදි සේවා සපයන ආයතන හෝ පුද්ගලයින් වීම ද අත්‍යවශ්‍ය ය. අතරමග රැදී සිටිමින්, තේ පැන් පානය කරමින් කල්මරන හෝ තමන්ගේ කාර්යයන් වෙනුවෙන් කාලය ගත කරන රියදුරන් සහිත නියමිත පහසුකම් රහිත හෝ අඩු පහසුකම් පවතින රථවාහන සපයන අතරමැදි ඒකකයක් ලාභදායක වුව ද ඉන් ඇතිවන අහිතකර ප්‍රතිඵලය දිගුකාලින ආයතනික අසාර්ථකත්වයට හේතුවකි. එබැවින් සෑම අතකින් ම පිළිගත හැකි අතරමැදි පාර්ශවයක් සම්බන්ධ කර ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. එසේ නොවුන හොත් සමස්ත ක්‍රියාවලිය ම අසමත් හෙවත් අසාර්ථක වනු ඇත.

තම නිෂ්පාදන අපනයනය කරන්නේ නම්, අතරමැදියන් අතිශය වැදගත් කාර්යයක් ඉටු කරයි. නිෂ්පාදනාගාරයේ සිට වරායට හෝ ගුවන් තොටුපලට හෝ නියමිත වේලාවට ම වගකීමෙන් ප්‍රවාහනය කරදීම අතිශය වැදගත් ය. උදාහරණ ලෙස නැව් මාර්ගයෙන් (මුහුදු ගමන් මාර්ගය) ප්‍රවාහනය කරන භාණ්ඩයක් නිසි වේලාවට වරාය වෙත හෝ නැව් සමාගම වෙත (හෝ නැව් සමාගම් නියෝජිතයා වෙත) භාරදීමට අසමත් වුවහොත් සමස්ත ඇණවුම ම අවලංගු විය හැකිය. එය විශාල පාඩුවකි. එසේ නැතහොත් නැව වරායෙන් පිටත් වීමෙන් පසුව නැංගුරම්ලන ඊළග වරාය දක්වා අදාළ ඇමුණුම් භාණ්ඩ ගුවනින් ප්‍රවාහනය කරදීමට සිදුවිය හැකිය. එය ඉතාමත් පිරිවැය ඉහළ කාර්යයකි. මෙම සියල්ල සිදුවන්නේ නිසි වේලාවට බෙදාහැරිම සඳහා අවශ්‍ය කටයුතු සළසා නොගැනීමයි. එබැවින් අතරමැදි පාර්ශවයේ

මැදිහත්වීම ඉතාමත් වගකීම් සහගත විම සහ ඇතිවන අහිතකර තත්ත්වයන් හමුවේ නිදහසට කරුණු නොකියන අතරමැදියන් වීම අත්‍යවශ්‍ය ය.

**හොඳ ම සැපයුම්කරුවන් දිනා ගැනීම**

ඕනෑ ම භාණ්ඩයක් හෝ සේවාවක් නිපදවන සංවිධානයකට මෙම සංරචකය පොදු සංරචකයකි. භාණ්ඩය හෝ සේවාව නිපදවීමට අවශ්‍ය අමුද්‍රව්‍ය නියමිත ගුණත්වයෙන් හා නියමිත වේලාවට සැපයීමට අසමත් වන තත්ත්වයක් ඇතිවන්නේ නම්, සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය ම හා සමස්ත භාණ්ඩය ම අසාර්ථක වීමට ඉඩ ඇත. ඒ තුළින් තම භාණ්ඩ හෝ සේවාව ඇණවුම් කරන පාර්ශවයන් අපහසුතාවයකට පත්වන අතර, එහි දිගුකාලින ප්‍රතිඵලය වන්නේ ඇණවුම් කරන්නන් හා පාරිභෝගිකයන් තම ආයතනයෙන් ඉවත්වීමයි. උදාහරණ ලෙස තේ නිෂ්පාදන සමුපකාර සමිතියකට අවශ්‍යකරන මූලික අමුද්‍රව්‍ය වන තේ දළු නියමිත ප්‍රමිති මට්ටමින්, නියමිත ප්‍රමාණයෙන්, නියමිත වේලාවට නොලැබුනහොත් කුමක් සිදුවන්නේ ද...? තම නිෂ්පාදනයේ ගුණත්වය හා ප්‍රමිතිගත බව අඩුවනවා පමණක් නොව තේ කර්මාන්ත ශාලාවේ පිරිවැය වත් ආවරණය කර ගත නොහැකි මට්ටමේ නිෂ්පාදන ධාරිතාවයක් වෙනුවෙන් යන්ත්‍ර සූත්‍ර හා කාර්ය මණ්ඩලය යෙදවීමට සිදුවේ. එය බරපතල අවාසිදායක තත්ත්වයකි.

එබැවින් ඉහළ ප්‍රමිතිය සහිත තේ දළු සපයන, කර්මාන්ත ශාලාවේ නිපැයුම් ධාරිතාවයට ගැළපෙන ප්‍රමාණයක් සැපයුම් කළහැකි, නියමිත වේලාවට තේ දළු සැපයීමට සමත් වූ, තේ දළු සපයන්නන්ගෙන් යුක්ත පිරිසක් හඳුනාගෙන තිබීම අත්‍යවශ්‍ය ය. එම ප්‍රමාණයට වඩා තේ දළු සපයන සැපයුම්කරුවන් සිටීම වඩාත් යහපත් ය. එනමුත්, අවම වශයෙන් කර්මාන්ත ශාලාවේ ධාරිතාවයට ගැළපෙන තේ දළු ප්‍රමාණයන් අඛණ්ඩව සැපයිය හැකි සැපයුම්කරුවන් පිරිසක් සිටීම තුළින් තේ සමුපකාර සමිතියට ලැබෙන ඇණවුම් බාධාවකින් තොරව සම්පූර්ණ කරලීමේ හැකියාව ලැබෙනවා පමණක් නොව සමුපකාර සමිතිය ලාභදායිව පවත්වාගෙන යාමට ද අවස්ථාව උදාවේ.

කිරි නිෂ්පාදන ආශ්‍රිතව කටයුතු කරන සමුපකාර සංවිධානයක් සලකා බලන්නෙහි නම්, ඉතා ඉහළ නැවුම් බවකින් යුක්ත දියර කිරි සපයන සැපයුම්කරුවන් අතිශය වැදගත් ය. තම ප්‍රවාහන සේවාව කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන හෝ ස්ථානයන් ගෙන් පිටපත්වීමට පළමුව නියමිත ප්‍රමිතියෙන් යුතු දියර කිරි ගෙනවිත් භාරදීමට සමත් වන සැපයුම්කරුවන් සිටීම අත්‍යවශයය. එහිදි ප්‍රමිතිගත බව පිළිබඳව වඩාත් ඉහළ සැලකිල්ලක් දක්වන සැපයුම්කරුවන් අතිශය වැදගත් වන්නේ ය. හෝටල් ව්‍යාපාරයක නිරත සමුපකාර සමිතියක් නම් මාළු - මස් - එළවලු - කුළුබඩු ආදිය නියමිත ප්‍රමිතියෙන් හා ඒ ඒ ඇණවුමට උචිත පරිදි සපයන සැපයුම්කරුවන් සිටීම අත්‍යවශ්‍ය ය. ඇණවුම් ප්‍රමාණය වැඩිවන විට සැපයුම් කිරීමට හැකියාවක් නොමැති සැපයුම්කරුවන් නොවිය යුතුය. මස් - මාළු වැනි ද්‍රව්‍යවල දී නශ්‍ය නොවූ මස් - මාළු සැපයුම් කිරීමට වගකීමෙන් ක්‍රියාකරන්නන් විය යුතු ය.

මංගල උත්සවයකට ශාලා පහසුකම් හා අනෙකුත් පහසුකම් ලබාදෙන සමුපකාර සමිතියක සැපයුම්කරුවන් විසින් ඒ ඒ උත්සවයට අවශ්‍යවන පරිදි හා සාම්ප්‍රදායිකව පිළිගත් නැකත් ශාස්ත්‍රය (සුභ නිමිති) සඳහා උචිත වන පරිදි සේවාලාභීන්ට ඔවුන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කරගත හැකි ආකාරයට නම්‍යශීලිව තම සේවා පහසුකම් සැපයිය යුතු ය. එකී පහසුකම් සමුපකාර සමිතිය විසින් ම සම්පූර්ණ කර නොගෙන බාහිර පාර්ශවයන්ට යොමුකොට බදු පදනම මත හෝ සේවා සැපයුම් පදනම මත ගාස්තු ගෙවා ලබාගන්නේ නම් (බහිර්සේවාර්ථනය යටතේ) එම සැපයුම්කරුවන් නිසි කලට වේලාවට අදාළ පහසුකම් හා ද්‍රව්‍ය නොසැපවූයේ නම්, සමුපකාර සමිතියේ ඉදිරි ඇණවුම් සියල්ල ම බිඳ වැටීමට ඉඩ ඇත. එහි දී දිවා/රාත්‍රී භේදයකින් තොරව හෝ වෙනයම් සාධකයකින් තොරව, කේවල් කරන සැපයුම්කරුවන් ද නොවිය යුතු ය. එනම්, වේලාව පිළිබඳව නම්‍යශීලව ක්‍රියා කරන්නකු විය යුතුම ය. සැපයුම් ද්‍රව්‍ය අවස්ථානුකූල තත්ත්වයන් යටතේ වෙනසකට ලක්වන විටක එවා සැපයීම සම්බන්ධව නම්‍යශීලව ක්‍රියා කරන්නකු විය යුතුම ය.

ඉහත ආකාරයට සලකා බැලීම් කරනවිට තරඟකාරී ව්‍යාපාරික පරිසරයේ කටයුතු කරන සමුපකාර සංවිධානයන් ද, ඒ ඒ සංරචක මනාව හඳුනාගෙන ඒවා කළමනාකරණයට සමත් වූ දැනුම, කුසලතා, ආකල්ප ඇති කාර්ය මණ්ඩලයක් මගින් කාර්ය හසුරවාලීමට ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය ය. එමෙන් ම, ඒ ඒ කාර්ය කොටස් සම්පූර්ණ කර ගැනීමට තරම් නම්‍යශීලි වූ සංවිධාන ව්‍යුහයක් (සංවිධාන ව්‍යුහය යනු සංවිධාන සටහන නොවන බව අවබෝධ කරගත යුතු අතරම, සංවිධාන ව්‍යුහයක් ප්‍රධාන මූලිකාංග හතකින් සමන්විත පුළුල් තත්ත්වයකි.) තිබීමද අත්‍යවශ්‍යය. එසේ නොවුනහොත්, තරඟය හමුවේ ඉතිරි වන්නේ පසුබෑම හෝ පරාජය පමණි. එමනිසා තරඟකාරී බලවේග පිළිබඳව මනාව හඳුනාගෙන, මනාව විශ්ලේෂණය කොට, ඔවුන්ගේ ඉදිරි හැසිරීම් පුරෝකථනයකොට සැලසුම් කිරීම අත්‍යවශ්‍ය ය.

### මූලික පැකේජය හා ද්විතියික පැකේජය (Primary package and secondary package)

පාරිභෝගිකයින් දිනා ගැනීම සඳහා සමුපකාර ව්‍යාපාරයේ ඒකක බොහොමයක් විසින් පිරිනමමින් සිටින්නේ මූලික පැකේජය පමණි. වර්තමානයට එය කොතරම් දුරට සාර්ථකද.., අසාර්ථක ද... යන්න විමසීමට වඩා අනාගතයේ දී එය ප්‍රමාණවත් නොවන කාර්යයක් බව හඳුනා ගැනීම ඉතා වැදගත් ය. ඒනිසා සමුපකාර ව්‍යුහය තුළ ක්‍රියාත්මක වන සෑම සංවිධානයක් ම පාරිභෝගික සේවා සැපයීමේ දී තම කාර්යයන්ට අයත් මූලික පැකේජය ක්‍රමානුකූලව ද්විතික පැකේජයක් දක්වා සංවර්ධනය කළ යුතු ය.

#### මූලික පැකේජය

මූලික පැකේජය යනු ආයතනයක් විසින් පාරිභෝගිකයාට ලබා දීමට අපේක්ෂා කරන සහ පාරිභොගිකයා මුදල් ගෙවා ඉල්ලුම් කරනු ලබන ප්‍රධානත ම හා අත්‍යවශ්‍ය දෙයයි. එනම්, ඉල්ලුම් කරන භාණ්ඩය හෝ සේවාවයි. උදාහරණ ලෙස සමුපකාර අලෙවි සැලකින් ඉල්ලුම් කරන්නේ ,සහල්, නම් එම සහල් ලබා දීම මූලික පැකේජය ලබා දීමයි. ඉල්ලුම් කරන්නේ

වෛද්‍ය සේවාව නම් එම සේවාව ලබා දීමයි. එය ස්ථානගත වන්නේ කුමන පරිසරයක් යටතේ ද..., එයට වඩා වැඩි යමක් ලබාදිය හැක ිද... එය විවිධාංගීකරණයට ලක්විය හැකි ද.., යන්න මූලික පැකේජයේ දී සළකා නොලබලයි. ,ඉල්ලු දේ දුන්නා ම ඇති. ඊට වඩා මොකක්ද..?, යනුවෙන් වචන භාවිතා කරන සමුපකාර සේවකයින් මෙන්ම ප්‍රතිපත්ති සාධනයේ නිරත අය විසින් තේරුම් ගත යුතු වන්නේ ,ඊට වඩා වැඩියමක් දිය යුතුව ඇති බවයි,. අවම වශයෙන් මානුෂීයව හා ලෙන්ගතුව නොමිලයේ සැපයිය හැකි සිනහව, මානුෂිය ආමන්ත්‍රණය, ආකර්ෂණීය පෙනුම, තමන් සේවය කරන ස්ථානයේ පවිත්‍රතාවය, අවට මිදුලේ සීමාව තුළ අලංකාරවත් මල් හා විසිතුරු පැළ මගින් ලබාදෙන අලංකාරය, ඉතා ම මිහිරි ගීතයක සුවය, අලංකාරවත් සුරතල් මත්සයින් ගේ රිද්මය, කියවා බැලීමට ස්ථානගත කළ පුවත්පතක් හෝ සඟරාවක් සැපයිය නොහැකි ද ....?, එය වැදගත් ආකර්ෂණීය මාධ්‍යයක් නොවේ ද...?, ඉතා විශාල පිරිවැයක් ඒ සඳහා වැය කිරීමට සිදුවෙයි ද ...? යනාදිය පිළිබඳ යළි යළිත් සිතා බැලිය යුතු මොහොතක සමුපකාර ක්ෂේත්‍රය පවතින බව සිහිපත් කළ යුතුව ඇත.

බොහෝ දේ ආරම්භ කිරිමට යම් පිරිවැයක් අවශ්‍ය නමුත්, නඩත්තුවට අවශ්‍ය වන්නේ අවම පිරිවැයකි. බොහෝ කටයුතු සේවා ස්ථානයේ සේවය කරන කාර්ය මණ්ඩලය ම තම සේවා කාලයෙන් දිනකට පැය භාගයක් වෙන්කොට ඉහත කී සියලු සැකසුම් සඳහා යොමු විය හැකි ය. මල්පෝච්චි නඩත්තුව. අවට පිරිසිදුව තබා ගැනීම, ආකර්ශනීය ස්ථානයක් බවට පත්කර ගැනීම යනාදිය දෛනික රාජකාරියට බාධාවක් නොවනු ඇත. එමෙන් ම, සිනාසීමට නොහැකි ප්‍රියමනාප බව භාවිතාකොට මිනිසුන් ඇසුරු කළ නොහැකි, විනීතව පාරිභෝගික සත්කාරය සැපයිය නොහැකි අවංකව කටයුතු නොකරන කිසිදු සේවකයකු සමුපකාරයට උචිත නොවන සේවකයින් ලෙස සලකා කටයුතු කිරීමට යොමු විය යුතු ය. අසීරු වුවත් සමුපකාරයේ පැවැත්මට එය කළ යුතු ය. එමනිසා තම රාජකාරි කාලය තුළ පාරිභෝගිකයාට අවශ්‍ය ආකර්ෂණීය ක්‍රමවේදයන් සකස් කර ගැනීමට දායකවන සේවකයකු වඩාත් ඉහළ වගකීමක් ඇති අතර ම, එය ඉටුකිරීමට අසමත් මෙන්ම, ඍණාත්මකව අදහස් ව්‍යාප්ත කිරීම දායක වන සේවකයා අඩු වටිනාකමක් ඇති සේවකයකු ලෙස සලකා කටයුතු කිරීම වරදක් නොවනු ඇත.

**ද්විතීයික පැකේජය**

ද්විතියික පැකේජය යනු මූලික පිරිනැමීම් වලට වඩා වැඩියමක් ලබා දෙමින් භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවශ්‍ය අතිරේක සානුබලයක් සැපයිමයි. එනම්, මූලික භාණ්ඩය හෝ සේවාවට වඩා වැඩි යමක් නිපදවීම සහ සැපයීමයි. මේ සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවුව ද එහි ඇති අනාගත ප්‍රතිඵලදායකත්වය ඉතාමත් ඉහළ ය.

පාරිභෝගිකයින්ට තරඟකාරිත්ව වාසිය ලබා දීමට නම් ද්විතියික පැකේජය කරා යොමු වීම අත්‍යවශ්‍ය වන යුගයකට සමුපකාර ව්‍යාපාරය මුහුණ දෙමින් සිටින බව ද හඳුනා ගැනීම වැදගත් ය. ද්විතියක පැකේජය සඳහා බොහෝ සංවිධාන විසින් ,අතිරේක පිරිනැමීම්, ලෙස බොහෝ දේ සපයයි. ඒ අතරින් පහත ඒවා ප්‍රමුඛ වේ. එම පිරිනැමීම් පිළිබඳ අවබෝධය ලබා ගැනීම හා

නිසි අවධානය ලබා දීම තුළින් සමුපකාර සමිති සංවිධානය දැනට පවතින තත්ත්වයට වඩා ඉහළ වර්ධනයකට යොමුකර ගත හැකි ය.

- අදහස්
- පුද්ගලයින්
- ඉසව්
- ස්ථානයන්
- දේපල
- තොරතුරු
- අත්දැකීම්
- සංවිධාන
- අදහස්

සංවිධානයකට තම සේවා ස්ථානය තුළ සහ පාරිභෝගිකයාට ප්‍රදර්ශනය වන පරිදි හොඳ සිතුවිලි ජනනය කරන වගන්ති හා රූප රාමු ප්‍රදර්ශනයට අවශ්‍ය කටයුතු සැලසිය හැකිය. සමාජීය වටිනාකමක් ඇති සහ හරයක් සහිත වගන්ති ප්‍රදර්ශනය තුළින් පාරිභෝගිකයාට අදහස් සැපයීම අවම පිරිවැයක් මත සිදුකළ හැකි ය. එමෙන් ම, ,කාර්යාලීය පිලි සැකැස්ම, ( බිහ දමළු * ප්‍රදර්ශනය කිරීම, විවිධ ස්ථානයන්ට අයත් සංකේත නඩත්තුව, පිවිසුම් - පිටවීම් මාර්ග, පැහැදිලිව දැක්වීම සංකේත භාවිතය ආදිය තුළින් පාරිභෝගිකයාගේ කාලය ඉතිරි කළ හැකිය. ඉතා පහසුවෙන් අවශ්‍ය නිලධාරීයා හමුවී, තම කාර්යයන් සම්පූර්ණ කර ගැනීමටත්, තවත් අයෙකු ගෙන් විමසීම් නොකොට ස්වයංව කාර්යාල භූමියෙන් නික්ම යාමටත්, අවස්ථාව ලබාගත හැකි ය. එය ආයතනය පිළිබඳ යහපත් අදහසක් ඇතිකර ගැනීමට ද හේතුවකි.

**පුද්ගලයින්**

එමෙන් ම, සමාජය අගය කරන හා පිළිගත් පුද්ගලයින් ගේ ඇසුර, තම පාරිභෝගිකයින්ට ලබාදිය හැකි ය. සංගීත සන්ධ්‍යාවක් සංවිධානය, නාට්‍යයක් ප්‍රදර්ශනය කිරීම, සුහද හමු සංවිධානය, ප්‍රාසාංගික කව නිර්මාණය, සංස්කෘති අංග සංවිධානය (දහඅට සන්නිය, රූකඩ, සෙත්පිරිස්.... ආදී ) ආදිය සැලසුම් කරමින් එම වැඩසටහන් සමග ප්‍රවීණ හා පිළිගත් පුද්ගලයින් ගේ ඇසුර (දැකබලා ගැනීම, අත්සන ලබා ගැනීමට අවස්ථාව ලබා දීම, ආහාර වේලට සම්බන්ධ කර ගැනීම, ගීත ගායනය... ආදී ලෙස) ලබා දීම කිසියම් අවම පිරිවැයක් දරා සම්පූර්ණ කළ හැකි ය. පෞද්ගලික අංශය වර්තමානය වනවිට ජනප්‍රිය පුද්ගලයින් සමග විදේශ ගමන් පවා තම පාරිභෝගිකයින් වෙනුවෙන් සංවිධානය කරන්නේ විශාල මුදලක් වැය කරමිනි. සමුපකාර සමිති ව්‍යාපාරයට එවැනි අධික පිරිවැයක් දැරිය නොහැකි බැවින් ශ්‍රී ලාංකික ප්‍රජාව අගය කරන ඉහත ක්‍රියාකාරකම් පහසුවෙන් සැපයිය හැකි ය.

**ඉසව්**

එක්වරක් පමණක් අත්විදීමට ලැබෙන හා මිනිසුන් ඉල්ලුම් කරන යම්කිසි අවස්ථාවක් ලබා දීම මෙහිදි සිදු කරයි. සමුපකාර සමිතියක් එක් ග්‍රාමීය බැංකු ශාඛාවක ඉහළ ම තැන්පත්කරුවන් දස දෙනා අතරින් එක් අයෙකුට කුසපත් ඇදීම යටතේ ලෝක කුසලාන ක්‍රිකට් තරඟය නැරඹීමට අවස්ථාවක් උදාකර දීම සඳහා කටයුතු සැළසීම ආසන්න උදාහරණයකි. එනම්, මුළු සමුපකාර ග්‍රාමීය බැංකු පද්ධතියෙන් ම (එක් විවිධ සේවා ඒකකයකට අයත්ව පවතින) එක් අයෙකුට පමණක් මෙම අවස්ථාව උදාවේ. එය ලබා ගැනීමේ අරමුණින් තැන්පත්කරුවන් මුදල් ආයෝජනයේ නිරතවිය හැකි ය. අවශ්‍යනම් තවත් සාධාරණ හා උචිත කොන්දේසි ඇතුළත් කිරීම බාධාවක් නොවේ.

එමෙන් ම, සමුපකාර අලෙවි සැලෙන් මාසයකට ඉහළම වටිනාකමින් භාණ්ඩ ලබාගත් පාරිභෝගිකයා තෝරා ගැනීම කළ හැකි ය. ඒ සඳහා අලෙවි වාර්තා නඩත්තුවේ දී පාරිභෝගිකයින් නමින් නඩත්තු වන ක්‍රමවේදයක් සකස් කර ගත යුතු ය. එහි දී අංක ක්‍රමයක් මත පාරිභෝගිකයා හඳුනා ගැනීමට කාඩ් ක්‍රමයක් භාවිතයට ගත හැකි ය. අවශ්‍යනම් ලෝක කුසලාන ක්‍රිකට් තරඟය වෙනුවට වෙනත් යමක් තෝරාගත හැකි ය. නමුත්, තෝරා ගන්නා දෙය සාපේක්ෂව ඉහළ වටිනාකමක් හා ඉහළ ඉල්ලුමක් ඇති එකක් විය යුතු ය. එය අත්විදීමේ අවස්ථාවක් මිසක නිවසට ලබාදෙන පාරිභෝගික භාණ්ඩයක් ද නොවිය යුතු ය. එමෙන් ම එක් වරක් පමණක් වන අත්දැකීම් අත්විදින අවස්ථාවක් විය යුතු ය.

**ස්ථානයන්**

අලංකාරය සපිරි ස්ථානවල පවතින අංලකාරය හා සුන්දරත්වය පාරිභෝගිකයාට අත්විදිමට ඉඩ ලබා දීමයි. විශේෂයෙන් සමුපකාර අවන්හල්, හෝටල්, නවාතැන්, රංග ශාලා සහ උත්සව ශාලා, සඳහා මෙම පිරිනැමීම පහසුවෙන් යොදවා ගත හැකි ය. ප්‍රදේශයේ අඩුම මිල සහිත ඉඩමක් තෝරාගෙන අඩු පිරිවැයක් මත කාර්යයන් සම්පූර්ණ කරමින් ලබා ගන්නා අදායමට වඩා ඉහළ ආදායමක් මේ තුළින් ලැබිය හැකි ය. අලංකාරවත්, ස්වාභාවික සුන්දරත්වයෙන් යුක්ත ස්ථානයක් මිලට ගැනීමට ඉහළ මුදලක් අවශ්‍ය වේ. සමහර විටක අඩු මිලකට ද ලබාගත හැකි ය. එවන් අඩු මිලට දේපළක් ලබාගත් අවස්ථාවක මාර්ග පහසුකම් වෙනුවෙන් හා අවශේෂ සැකසුම් වෙනුවෙන් විශාල පිරිවැයක් දැරිමට සිදුවිය හැකි ය.

එසේ නමුත්, ඒ .තුළින් ලැබිය හැකි ආදායම සාපේක්ෂව ඉහළ ය. උදාහරණ ලෙස අලංකාරවත් පරිසයක් දැක බලාගත හැකි කන්දක් මුදුනේ හෝලටයක් ස්ථාපිත කිරිම, මුහුදු වෙරළ අයිනක අවන්හලක් පවත්වාගෙන යාම, ගඟක් - වැවක් යාබද වන පරිදි නවාතැන්පලක් පවත්වාගෙන යාම ආදිය දැක්විය හැකිය. එවන් ස්ථානක් තුළින් ලබාදෙන සේවාවට සාමාන්‍ය ස්ථානයක් යොදා ගෙන ලබාදෙන සේවාවට වඩා වැඩි ගාස්තුවක් නියම කළ හැකි ය. එමෙන්ම, ගාස්තුව ඉහළ ගිය ද අලංකරණය හා සුවිශේෂිභාවය මත ඉල්ලුම ද අඩුවක් නොවනු ඇත.

**දේපළ**

වර්තමාන පාරිභෝගිකයා ඉතා කාර්ය බහුල තත්ත්වයක පසු විය හැකි ය . තම දරුවන් සමග හෝ දෙමාපියන් සමග අලෙවිසැලට පිවිසෙන්නේ වඩාත් ඉක්මනින් හා පහසුවෙන් තම කාර්යයන් සම්පූර්ණ කරගෙන පිටත්ව යාමේ බලාපොරොත්තුව ඇතිව ය. එහි දී පාරිභොගිකයාට දරුවන් හෝ දෙමාපියන් වෙනමම ස්ථානගත කර තම අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගැනීම වඩාත් පහසු විය හැකි ය. බොහෝ විට කුඩා දරුවන් සම්බන්ධව මෙම අවශ්‍යතාවය ඉතා ඉහළින් පවතී.

එහි දී දරුවන් වෙනුවෙන් ළමා උද්‍යානයක් ස්ථාපිත කර පාරිභෝගිකයින්ගේ දරුවන්ට ළමා උයනක අත්විදීම් ලබා ගැනීමට සැලැස්වීම තුළින් හා දෙමාපියන් වෙනුවෙන් කුඩා පුස්තකාලයක් හෝ පුවත්පත් කියවීම් කවුලුවක් ස්ථාපිත කිරීමෙන් වැඩි පාරිභෝගික පිරිසක් ආකර්ෂණය කරගත හැකි ය. පාරිභෝගිකයින් තම දරුවන් සමග පැමිණ දරුවන් ළමා උද්‍යානයට යොමු කර තමන්ට අවශ්‍ය දේ නිදහසේ මිලදී ගැනීමට මේ තුළින් පෙළ බේ. තවත් ආකාරයකින් ගතහොත් වාහන ගාල්කර තැබීමේ පහසුකම සැපයීම, වැඩි පාරිභෝගිකයින් පිරිසක් ආකර්ශනයට හේතුවකි. මේ සඳහා යොමු වන සමුපකාර සංවිධානය යම් පිරිවැයක් දැරිය යුතු ය. නමුත්, එය හානිකර පියවරක් නොවේ. ආයෝජනයක් සඳහා වූ මූල්‍ය යෙදවීමකි.

**තොරතුරු**

පාරිභෝගිකයන්ට පහසුවෙන් ලබාගත නොහැකි, එමෙන් ම, පාරිභෝගිකයාට අවශ්‍ය වන තොරතුරු සැපයුම් ඒකකය බවට සමුපකාර සමිතිය හෝ සංවිධානය යොදාගත යුතු ය. විවිධ සංඛ්‍යා ලේඛන තොරතුරු රෝහල් හා වෛද්‍ය සේවා තොරතුරු, අධිකරණ හා නෛතික ක්‍රියාවන්ට අයත් තොරතුරු, ළමා පෝෂණය පිළිබඳ තොරතුරු, ආදිය උදාහරණ ලෙස පෙන්වා දිය හැකි ය. සමුපකාර සමිතිය හෝ සංවිධානය එවැනි තොරතුරු සැපයුම් මධ්‍යස්ථානයක් බවට පත්කරගත් විටක සමාජික හා සාමාජික නොවන දෙපාර්ශවය ම එම තොරතුරු ලබා ගැනීමට සංවිධානය හෝ සමිතිය සමග සම්බන්ධ වේ. එය දිගුකාලීනව යහපත් තත්ත්වයකි.

**අත්දැකීම්**

මිනිසුන් ලෙස අත්විදීමට කැමැති නමුත්, ඉතා පහසුවෙන් අත්විදීමට නොහැකි හෝ ඉහළ පිරිවැයක් දරා අත්විදිමට සිදුවන අත්දැකීම් සමිතියේ පාරිභෝගිකයින් වෙනුවෙන් ලබා දීමයි. මේ සඳහා සැලකිය යුතු පිරිවැයක් දැරීමට සිදුවන නමුත්, ලැබිය හැකි ප්‍රතිලාභය ඉතා ඉහළ ය. උදාහරණ ලෙස ශ්‍රී ලංකා පුරවැසියන්ට ,හිමමත ඇවිදීම, යනු අතිශයින් ම දුර්ලභ අත්විදීමකි. ඉසව් සඳහා තෝරා ගැනීම් කළ ආකාරයට පාරිභෝගිකයින් අතරින් තෝරාගත් පිරිසකට හිමමත ඇවිදීමේ අවස්ථාවක් ලබා දීම සඳහා ජපානයේ ශීත කාලයේ දින හතරක සංචාරයක් සංවිධාන කිරීම උදාහරණයක් ලෙස දැක්විය හැකි ය. සමහරවිටක වසර තුනකට වරක් හෝ වසර පහකට වරක් වශයෙන් මෙය ක්‍රියාත්මක කළ හැකිය. නමුත්, එම වසර තුන හෝ පහක

කාලය පාරිභෝගිකයා අඛණ්ඩව අදාළ අවස්ථාව ලබා ගැනීමේ අපේක්ෂාව සහිතව සමුපකාර සංවිධානය සමග රැඳී සිටින බව අමතක නොකළ යුතු ය.

**සංවිධාන**

සමුපකාර සංවිධානය විසින් ලබාදෙන සේවාවන් තව තවත්, බාහිර වෙනත් සංවිධාන සමග සම්බන්ධ කළ හැකි ය. තම සේවාව නව සංවිධානයක සේවාවන් සමග සම්බන්ධ කිරීම තුළින් සහ-සම්බන්ධ වන සංවිධාන දෙකට ම ආර්ථික ප්‍රතිලාභ අත්කර ගත හැකිය. උදාහරණයක් ලෙස ප්‍රවාහන සේවා ක්‍රියාත්මක කරන සමුපකාර සමිතියක් බස් රථ කිහිපයකින් ගොස් තම රෝගියා බැලීමට සිදුවන පාර්ශවය ඉලක්ක කරගෙන ප්‍රවාහන සේවා ක්‍රියාත්මක කළ හැකි ය. එවිට තම ප්‍රවාහන සේවය ක්‍රියාත්මක වන්නේ දුෂ්කර මාර්ගයක් තුළින් සහ ගමනාන්තය ඉතා ඉහළ රෝගීන් ප්‍රමාණයක් ඇතුලත් කරනු ලබන ප්‍රදේශයේ හෝ පළාතේ ප්‍රධාන රෝහලක් දක්වා වූ ආකාරයටය. මේ සඳහා පාසලක් ද, තොර්ාගත හැකි ය. නැතහොත් දුම්රිය ස්ථානයක් හෝ වැඩබිමක් ඉලක්ක ගමනාන්තය බවට පත්කර ගත හැකිය. වඩාත් වාසිදායක විකල්පය තෝරා ගැනීම සමුපකාර සමිති සංවිධානය සතු කාර්යයකි.

**කියවීම්**


Dash, T. R. (2021). *Cooperatives in the Global Economy*. Independently published.

Department of Cooperative Development. (1990). *Sri Lanka Cooperative Movement, Historical Evolution and Challenges.* Department of Cooperative Development.

Hirschman, A. O. (1970). *Exit, Voice, and Loyalty: Responses to Decline in Firms, Organizations, and States*. Harvard University Press.

Porter, M. E. (1980). *Competitive Strategy: Techniques for Analyzing Industries and Competitors.* Free Press.

Rajan, R. G., & Zingales, L. (2003). *Saving Capitalism from the Capitalists: Unleashing the Power of Financial Markets to Create Wealth and Spread Opportunity*. Crown Business.

Samarasinghe, V., & Jayawardena, D. (2021). The Role of Co-operatives in Neoliberal Sri Lanka: A Case Study. In *The Role of Co-operatives in Neoliberal Sri Lanka.* Independently published.

Warren, J. N., Biggiero, L., Hübner, J., & Ogunyemi, K. (Eds.). (2024). *The Routledge Handbook of Cooperative Economics and Management.* Routledge.

Whinston, M. D. (2006). *Lectures on Antitrust Economics.* MIT Press.

නව පිවිසුම
ව්‍යවහාරික ශාස්ත්‍රීය සංග්‍රහය
ISSN 2961-5003 (Print) | ISSN 3121-3472 (e-Version)
3 වෙළුම, ii වන නිකුතුව - 2025 ජූලි-දෙසැම්බර්
පත්‍රිකා අංක 07

# සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියේ ආයතනික අරමුණු (objectives) සාක්ෂාත්කරණයේදී මුහුණ දෙන බාහිර පාරිසරික ව්‍යාපාර අභියෝග හා එකී අභියෝග සමඟ කටයුතු කිරීමට අදාළ උපාය මාර්ග (strategies) විශ්ලේෂණය

වසන්තා කුමුදුනී වර්ණකුලසූරිය[15]
wkwarnakulasooriya@gmail.com

**සාරසංක්ෂේපය**

මෙම පත්‍රිකාව සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය සිය ආයතනික අරමුණු ඉටු කර ගැනීමේදී මුහුණ දෙන බාහිර පාරිසරික අභියෝග සහ ඒවාට එරෙහිව අනුගමනය කරන උපාය මාර්ග විශ්ලේෂණය කරයි. ශ්‍රී ලංකාවේ විවෘත ආර්ථිකය තුළ පවතින දැඩි තරගකාරීත්වය හමුවේ, සමිතියේ පාරිභෝගික සහ ග්‍රාමීය බැංකු යන අංශ දෙකම විවිධ ආර්ථික, තාක්ෂණික, සමාජ-සංස්කෘතික සහ දේශපාලනික අභියෝගවලට මුහුණ දෙයි. විශේෂයෙන්ම සුපිරි වෙළඳසැල් ජාලා සහ පෞද්ගලික බැංකුවලින් එල්ල වන බලපෑම මෙහිදී කැපී පෙනේ. මෙම අභියෝග ජය ගැනීමට සමිතිය සාමාජික විශ්වාසය තහවුරු කිරීම සහ ක්‍රමවේදයන් සරල කරන ලද ණය පහසුකම් ලබා දීම වැනි උපාය මාර්ග භාවිත කරයි. 2022 වසරේදී ග්‍රාමීය බැංකු අංශය සාර්ථක වුවත්, පාරිභෝගික අංශය සැලකිය යුතු ලෙස පසුබෑමක පවතින බව මෙම අධ්‍යයනය පෙන්වා දෙයි.

**මූල පද:** සමුපකාර ව්‍යාපාරය, බාහිර පරිසරය, කළමනාකරණ උපාය මාර්ග, ග්‍රාමීය බැංකු, ආයතනික අරමුණු

[15] සමුපකාර සංවර්ධන නිලධාරී, දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | Diploma in Co-operative Development, B.Sc (Business Administration) (USJ), Master of Business Management (MBM )(UoR)

**ප්‍රවේශය**

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය ආරම්භ වූයේ ග්‍රාමීය ණය අර්බුදයට විසඳුමක් ලෙසය. කුඩා සමිති ඒකාබද්ධ වීමෙන් බිහි වූ සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය (MPCS), වර්තමානය වන විට පාරිභෝගික සහ ග්‍රාමීය බැංකු යන ප්‍රධාන අංශ දෙක ඔස්සේ සිය මෙහෙයුම් සිදු කරයි. කෙසේ වුවද, විවෘත ආර්ථිකයක් තුළ පවතින දැඩි තරඟකාරීත්වය හමුවේ, සිය ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී මෙම සමිතියට විවිධ බාහිර පාරිසරික අභියෝගවලට මුහුණ දීමට සිදු වී ඇත.

සාම්ප්‍රදායික සමුපකාර ව්‍යුහය සහ නවීන වෙළඳපල යථාර්ථය අතර පවතින මෙම ගැටුම, ආයතනයේ පැවැත්මට සහ සාර්ථකත්වයට සෘජුවම බලපායි. එබැවින්, මෙම අධ්‍යයනය මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය සිය ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී මුහුණ දෙන ප්‍රධාන බාහිර පාරිසරික ව්‍යාපාර අභියෝග විශ්ලේෂණය කිරීම කෙරෙහිය. තවද, එකී අභියෝග හමුවේ ආයතනයේ උපාය මාර්ගික ප්‍රතිචාරයන් විමර්ශනය කිරීම ද මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙම විශ්ලේෂණය, සමුපකාර අංශයේ අනාගත කළමනාකරණ තීරණ සඳහා ප්‍රතිපත්තිමය පදනමක් සපයනු ඇත.

**ශ්‍රී ලාංකේය සමාජ ව්‍යවසායන්ගේ ඉතිහාසය හා සංවිධානයේ ව්‍යාපාරික පසුබිම**

සමුපකාර ව්‍යාපාරය හඳුනාගත හැක්කේ ලොව පැරණිම සමාජ ව්‍යවසායන්ගෙන් එකක් වශයෙනි. ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරය ආරම්භ වන්නේ ග්‍රාමීය ණය අර්බුදයට විසඳුමක් වශයෙන් ඉංග්‍රීසි යටත්විජිත පාලකයන්ගේ ව්‍යාපෘතියක් වශයෙනි. මෙය ජර්මානු රැෆෙයිසන් ක්‍රමයේ ආකෘතිය ගත් අතර එම ආකෘතිය ගත් සමුපකාර ව්‍යාපාරයක් ශ්‍රී ලංකාවට පෙර ඉන්දියාවේ ස්ථාපිත කළ යටත්විජිත ප්‍රධානීන් එම ආඥා පනතට සමාන සමුපකාර ආඥා පනතකින් සමුපකාර ව්‍යාපාරයට අදාළ නෛතික පසුතලය ස්ථාපිත කිරීම 1911 අංක 7 දරන සමුපකාර සමිති ආඥා පනත ඔස්සේ සිදුවිය. පසු කාලීනව ආරම්භක ආකෘතියෙන්, එනම් ණය දෙන සමිති ආකෘතියෙන් වෙනස් සමුපකාර සමිති ශ්‍රී ලංකාවේ නිර්මාණය වීම දැකගත හැකි වන අතර දෙවන ලෝක යුධ සමයේදී අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමට ආරම්භ වුණු සමුපකාර කඩ සමිති මේ අතරින් කැපී පෙනෙයි. 1957දී මෙම කඩ සමිති හා වෙනත් කුඩා සමිති ඒකාබද්ධ කර විවිධ සේවා සමුපකාර සමිති දිවයින පුරා ආරම්භ කරන ලදී. සී.ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියද (ඉදිරියේදී සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතිය ලෙස හඳුන්වනු ඇත) මේ කඩ සමිති ඒකාබද්ධ කිරීම හරහා බිහිවන විවිධ සේවා සමුපකාර සමිතියකි.

සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතිය යම් ගැටලු පැවතියත් ශ්‍රී ලංකාවේ ප්‍රශස්ත කළමනාකරණයක පවතින සමුපකාර සමිතියකි. විවිධ සේවා සමුපකාර ශ්‍රී ලංකාව තුළ ආරම්භ වන්නේ මෙයට දශක ගණනාවකට පෙරයි. ඒ අනුව සමුපකාර කඩ සමිති ලෙස පැවති කුඩා සමිති හා වෙනත් සේවා සැපයූ කුඩා සමුපකාර සමිති ඒකාබද්ධ කර විවිධ සේවා සමුපකාර

සමිති ගොඩනැගීම සිදු කරන විට අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතිය ද කඩ සමිති ඒකාබද්ධ කිරීම හරහා බිහිවීම සිදුවිය. මේ අනුව එම එක් එක් කඩ සමිති සී.ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය ලෙස වන ඒකාබද්ධයෙන් පසු ප්‍රාදේශික ලෙස හැදින්වීම සිදු කරන අතර ප්‍රාදේශික වල සාමාජිකයින්ගේ ඡන්ද වලින් ප්‍රාදේශීකයට අදාළ කළමනාකරණ මණ්ඩලය වන ප්‍රාදේශික කාරක සභාව පත්වෙන අතර එම ප්‍රාදේශික කාරක සභාවෙන් නම්කරන නියෝජිතයන්ගෙන් සමිතියේ ප්‍රධාන මහ සභාව නිර්මාණය වෙයි.

සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතිය ප්‍රධාන ව්‍යාපාරික අංශ දෙකක් යටතේ සිය ව්‍යාපාරික මෙහෙයුම් සිදු කරයි.

1. පාරිභෝගික අංශය
2. ග්‍රාමීය බැංකු අංශය

සමිතියේ මූල්‍යමය හා කාර්යය මණ්ඩල පරිමාවෙන් ගත්විට පුළුල්ම අංශය ලෙස පවතින්නේ ග්‍රාමීය බැංකු අංශයයි. කෙසේ වෙතත් මෙම සමිති ආරම්භයේදී පුළුල් අංශය ලෙස පැවතුනේ පාරිභෝගික අංශයයි. එය එම කාලවකවානුවලදී පැවති සමාජ ආර්ථික සන්දර්භයේ පිළිබිඹුවක්ද විය. කෙසේ නමුත් 1977 විවෘත ආර්ථිකය සමඟ සමුපකාර ව්‍යාපාරය පාරිභෝගික වෙළදාම පිළිබඳව පැවති කතිපයාධිකාරී භූමිකාවෙන් ඉවත්වීමත් සමඟ පාරිභෝගික අංශය ක්‍රමයෙන් හැකිලෙමින් ඉදිරියට පැමිණි අතර, ග්‍රාමීය බැංකු අංශය ඒ වෙනුවට පුළුල් වෙමින් ඉදිරියට පැමිණියේය.

කෙසේ වෙතත් සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියේ පාරිභෝගික අංශය තවමත් විවිධත්වයකින් යුතු ව්‍යාපාරික ක්ෂේත්‍ර ගණනාවක නිරත වෙයි. මේ අනුව එදිනෙදා ජීවිතයට අදාළ සිල්ලර භාණ්ඩ වෙළදාම, ඉන්ධන හල් දෙකක් පවත්වාගෙන යාම, පිත්තල භාණ්ඩ හා රෙදිපිළි අලෙවි සැලක්, රථගාලක්, ප්‍රජා සහභාගිත්ව සංවෘත පොළක් ලෙස වන විවිධාංගීකරණිත පාරිභෝගික අංශයක් පවත්වාගෙන යයි. මේ අතරින් කුඩා වෙළදුන් හා කුඩා නිශ්පාදකයින් සඳහා සිය නිෂ්පාදන අලෙවිය සඳහා අවකාශයක් ලෙස ගෘහස්ථ පොළක් පවත්වාගෙන යාම සාමාජික හා සාමාජික නොවන ප්‍රජාව වෙත අතහිත දීමකි.

ලොව පුරා සමුපකාර ව්‍යාපාරය මේ වන විට ධාවනය වන්නේ ජාත්‍යන්තර සමුපකාර ව්‍යාපාරය විසින් 1955දී සම්මත කරගත් සමුපාර අනන්‍යතා ප්‍රකාශයේ හැඩතල අනුවය. 1995 සමුපකාර අනන්‍යතා ප්‍රකාශය මගින් සමුපකාර ප්‍රතිපත්ති හතක් (විවෘත ස්වේච්ඡා සාමාජිකත්වය, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය, සාමාජික ආර්ථික සහභාගිත්වය, ස්වයංපාලනය හා ස්වෛරීභාවය, අධ්‍යාපනය - පුහුණුව හා සංවර්ධනය, සමුපකාර අතර සහයෝගීතාවය, ප්‍රජාව පිළිබඳ සැලකිලිමත් වීම) හා ඒ හා තදාන්තර සාරධර්ම මාලාවක් ප්‍රකාශයට පත්කර ඇත (The International Cooperative Alliance, n.d.).

එසේම ජාත්‍යන්තර සමුපකාර සංධානය පහත සමුපකාර සාරධර්මද පිලිගෙන ඇත.

> ස්වෝපකාරය, ස්වයං වගකීම, ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්මතාවය, සාධාරණත්වය හා සාමූහිකත්වය යන සාරධර්ම මත සමුපකාරය පදනම් වේ. එසේම ඔවුන්ගේ පුරෝගාමීන්ගේ සම්ප්‍රදාය අනුව සමුපකාර සාමාජිකයෝ අවංකත්වය, විවෘතභාවය, සමාජ වගකීම සහ අනෙකා පිළිබඳව ගරුකිරීම යන ආචාර ධර්ම පිළිබඳවද විශ්වාස කරති. (ගලගමගේ, 2020).

සමුපකාර සමිතියක දැක්ම, මෙහෙවර, අරමුණු, ඉලක්ක, උපක්‍රම යනාදිය සංගෘහිත විය යුතු වන්නේ මෙම සමුපකාර අනන්‍යතාව පාදකවය. අම්බලන්ගොඩ විසේස සමිතියත් සිය සමිතිය හැඩගස්වාගෙන ඇත්තේ සමුපකාර අනන්‍යතාවය සුරකෙන පරිදි කටයුතු කිරිමට උත්සාහ දරමිනි.

**සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියේ බාහිර පරිසරය**

ව්‍යාපාරයක බාහිර පරිසරය යනු එහි අරමුණු කරා ළගාවීමට බලපානු ලබන ව්‍යාපාරයේ සිමාවට පිටින් පවතින පාරිසරික පරිශ්‍රයයි. සංවිධානයක බාහිර පරිසරය කොටස් දෙකකට බෙදා දක්වමින් සාමාන්‍යයෙන් හඳුනා ගනියි.

1. සාමාන්‍ය පරිසරය (General Environment)
2. කාර්ය පරිසරය (Task Environment)

> ආයතනික තීරණ ගැනීමේදී සැලකිල්ලට ගනු ලබන්නාවූ සංවිධානයක සීමාවෙන් බාහිරව පවතින භෞතික හා සමාජීය සාධක ලෙස පරිසරය අර්ථ දැක්වේ. මෙම පරිසරය ස්ථර දෙකකින් සමන්විත බවට සංකල්පගත කළ හැක. පළමු ස්ථරය ව්‍යාපාරික උපාය මාර්ග වලට සෘජුවම බලපාන කාර්ය පරිසරයයි. එයට සංවිධානයට සෘජු සම්බන්ධතා ඇති පාරිසරික අංග ඇතුළත් වේ. තරඟකරුවන්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින් සහ නියාමන ආයතන මෙහි මූලිකාංග ලෙස අර්ථ දක්වා ඇත. දෙවන ස්ථරය සාමාන්‍ය පරිසරය වන අතර ආයතනවලට වක්‍රව බලපාන අංශ වෙත එහිදී අවධානය යොමු වේ. සාමාන්‍ය පරිසරයට බොහෝ විට ආර්ථික, දේශපාලනික සහ සමාජීය යන අංශ ඇතුළත් වේ (Elenkov, 1997:187 උපුටා දක්වන්නේ Mtintsilana, 2007:4 වෙතිනි).

මේ අනුව සාමාන්‍ය පරිසරය නිර්මාණය වන්නේ මාන (Dimension) ගණනාවක එකතුවක් ලෙසින් බව පෙනෙයි. කළමනාකරණ සාහිත්‍යය තුළ මෙම මාන විවිධ ආකාරයට කාණ්ඩගත කර ඉදිරිපත් කරනු දැකගත හැකිය. පහතින් දැක්වෙන්නේ බහුලව සිදු කරනු ලබන බෙදීමකි.

- ආර්ථික මානය
- ස්වාභාවික පාරිසරික මානය

- තාක්ෂණික මානය
- සමාජ සංස්කෘතික මානය
- දේශපාලන-නෛතික මානය
- ජාත්‍යන්තර මානය

මොනෑෂ් සරසවියේ අලෙවිකරණ ශබ්දකෝෂය ද (*Marketing Dictionary*, n.d.) කාර්යය පරිසරය ලෙස හඳුනා ගන්නේ සංවිධානයක් සමග සෘජු සබඳතාවක් ඇති බාහිර පාරිසරික අංග ලෙසයි. යම් ව්‍යාපාරයක් හා සම්බන්ධ වෙනත් ඕනෑ ම ව්‍යාපාරයක්, පාරිභෝගිකයෙක්, තරඟකරුවෙක්, ද්‍රව්‍ය සැපයුම්කරුවෙක්, ශ්‍රම සැපයුම්කරුවෙක්, නියාමන ආයතනයක්, බලපෑම් කණ්ඩායමක් (Pressure Group) මේ සඳහා උදාහරණයි.

**සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියේ සාමාන්‍ය පාරිසරික අභියෝග**

සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියේ සාමාන්‍ය බාහිර පාරිසරික අභියෝග යම් ප්‍රමාණයක් පහත පරිදි හඳුනා ගත හැකිය.

***ආර්ථික මානීය අභියෝග***

සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතිය සාර්ව ආර්ථිකයේ වන චලනයන්ට අනුපාතික අභියෝගවලට මුහුණ දෙන ආකාරයක් නිරීක්ෂණය කළ හැකිය. උදාහරණ හැටියට මේ වන විට රට මුහුණ දී ඇති ආර්ථික අර්බුදය සෘජුවම බලපාන ව්‍යාපාරික ක්ෂේත්‍ර වල සමිතිය නිරත වෙයි. මූල්‍ය වෙළඳපොල උච්චාවචනය වීම සමුපකාර ග්‍රාමීය බැංකු කටයුතුවලට තදාන්තරව බලපා ඇත. එසේම පවතින සාර්ව සමාජ ආර්ථික පිළිවෙත ධනවාදී ආර්ථික ක්‍රමයයි. එයිනුත් ජාතික රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාව අනුගමනය කරන්නේ විවෘත ආර්ථික ප්‍රතිපත්තියයි. මේ නිසා සාර්ව ආර්ථික ආකෘතියෙන් එන පීඩනයන් සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියට ද පුළුල්ව දැනෙන බව පැහැදිලිය.

***ස්වාභාවික පාරිසරික මානීය අභියෝග***

මේ අතරින් ස්වාභාවික පාරිසරික මානයට අදාළ අභියෝග සමුපකාර ව්‍යාපාරය අරඹයා පවතින්නේ වෙනත් පුද්ගලික ආයතන හා සංවිධාන වලට වඩා ඉහළ තලයකය. මහජනතාවට ඉහළින් වගකීමට බැඳෙන සමාජ ව්‍යවසායක් වන හෙයින් සමුපකාර සමිතියකට සිදුවෙයි. එසේම 2030 තිරසාර සංවර්ධන අරමුණු සමඟද එකට ගමන් කිරීමට සමුපකාර ව්‍යාපාරයේ ආයතනයක් ලෙස සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමිතියට වගකීමක් ඇත. මේ අනුව ස්වාභාවික පරිසරය තිරසාරව භාවිතය හා පරිසරය රැකගැනීමේ අභියෝගයටද සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතිය මුහුණ දිය යුතුව ඇති බවට සිතිය හැකිය.

*තාක්ෂණික මානීය අභියෝග*

නූතන ව්‍යාපාරික පරිසරවලට අදාළ තාක්ෂණික ප්‍රපංචවල වෙනස්කම් නිතර සිදුවනු අත්දැකිය හැකිය. මෙම තාක්ෂණික වෙනස්කම් හමුවේ ඒවාට අනුගතව කටයුතු සිදුනොවුන හොත් ව්‍යාපාරික ක්ෂේත්‍රයෙන් ඉවත්ව යාමට සිදුවීමේ අභියෝගයට සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතිය ද මුහුණ දෙයි. මෙහිලා ග්‍රාමීය බැංකු පද්ධතිය විශේෂයෙන් කැපී පෙනෙයි. නූතන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වර්ධනය හමුවේ නිර්මාණය වී ඇති ගනුදෙනු සැකසුම් පද්ධති, කළමනාකරණ තොරතුරු පද්ධති වර්තමානයේදී කෘතිම බුද්ධිය දක්වාම විකාශනය වී ඇත. මේ අනුව සමහර තාක්ෂණික මානීය අභියෝග මේ වන විටත් පැමිණ ඇති අතර, තවත් බරපතල අභියෝග පැමිණීමට ද නියමිතව ඇත.

*සමාජ සංස්කෘතික මානීය අභියෝග*

වර්තමාන සමාජය සමුපකාර ව්‍යාපාරය සලකන්නේ "පැරණි" විලාසිතාවක් වශයෙනි. ඔවුන් සුපිරි වෙළඳසැල්, මෝල් සංකීර්ණ, කෙටි ආහාර වෙළඳ සැල්, ජාත්‍යන්තර අවන්හල් වෙත වැඩිපුර ජනකායක් ඇදෙන්නේ මේ අනුවය. ඒවායේ පවතින්නේ හුදෙක් භාණ්ඩ හා සේවාවන් පමණක් නොව වඩා විලාසිතාත්මක ජීවන ආකෘතියක් ගැන ඉගියකි. මේ නිසා "පැරණි" පන්නයේ ව්‍යවසාය ආකෘතියක් ලෙස තරුණ පරම්පරාව සංජානනය කරන සමුපකාර ආකෘතිය සමාජ සංස්කෘතික මානීය අභියෝගයකට මුහුණ දෙයි. සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතිය ද මෙම අභියෝගය දරයි.

*දේශපාලන-නෛතික මානීය අභියෝග*

සමුපකාර ව්‍යාපාරයේ ආයතනයක් ලෙස සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතිය සංස්ථාපනය වී ඇත්තේ සමුපකාර පනතට අනුවයි. මෙම පනතේ ශක්‍යතා මෙන්ම ගැටලු ද ඇත. දීර්ඝ කාලයක් සංශෝධනය නොවී පවතින පනතක් වන මෙම පනත තුළ සමුපකාර ව්‍යාපාරය නියාමනයට අදාළ ශක්‍ය දෑ මෙන්ම සමුපකාර සමිති වලට සිය වැඩකටයුතු කරගෙන යාමේදී අපහසුතා ඇති කරවන වගන්ති හා නීතිරීති ඇතුලත් වෙයි.

එසේම රටේ ක්‍රියාත්මක වන පක්ෂ දේශපාලනය නියෝජනය කරන කණ්ඩායම් සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියේ පරිපාලන බලය සඳහා අවධානයෙන් සිටියි. මේ නිසා මෙය දේශපාලනයෙන් වියුක්ත පූර්ණ සාමාජික ප්‍රජාතන්ත්‍රවාදී පාලන ආකෘතියක පවතින බවක් දැකගත නොහැකිය. හැකිතරම් ස්වාධීන සාමාජික පාලනයක පැවතිය යුතු බවට වන සමාජ ව්‍යවසායක් ප්‍රදේශයේ දේශපාලන බල කේන්ද්‍රයක් බවට පත්වීම ද අභියෝගයකි.

මේ අනුව වෙනත් පුද්ගලික ආයතන වලට නැති අභියෝගාත්මක බලපෑම් කණ්ඩායමක් සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියට ඇත. ඒ සමිතිය පිළිබඳ පක්ෂ දේශපාලනයේ ඇල්ම බැල්ම පැවතීමයි. මෙය සමහර අවස්ථාවල ශක්තියක් බවට හැගීයන නමුත් මෙම කණ්ඩායම් සමිතියේ බලය සඳහා සිදුකර ගෙනයන යන ගැටුම් සමිතියේ කටයුතු වලට

අභියෝග ගෙනෙන අවස්ථා ඇත. කෙසේ වෙතත් න්‍යායාත්මකව සලකන්නේ සමුපකාර ව්‍යාපාරය දේශපාලනයෙන් තොර විය යුතු බවයි. එය ව්‍යවහාරයේදී එලෙස ක්‍රියාත්මක නොවේ.

***ජාත්‍යන්තර මානීය අභියෝග***

සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතිය මෙහෙයවනු ලබන ව්‍යාපාරික අංශ ඍජුව ජාත්‍යන්තර මට්ටමෙන් සිදුවන කම්පනයන්ට සංවේදී වෙයි. මේ අනුව මූල්‍ය අංශය ජාත්‍යන්තර මූල්‍ය වෙළඳ පොලේ සීරුමාරුවීම් වලට සංවේදීය, ඉන්ධන අංශය ජාත්‍යන්තර වෙළඳපොළේ සිදුවන ඉන්ධන මිල උච්චාවචනයන්ට සංවේදීය. සිල්ලර භාණ්ඩ වෙළඳ අංශය හෙවත් පාරිභෝගික අංශය ද ඉදිරිපත් කරන භාණ්ඩ සංකලනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ජාත්‍යන්තර වෙළඳපොළ ඔස්සේ පැමිණෙන භාණ්ඩයි.

**සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියේ කාර්යය පාරිසරික අභියෝග**

කාර්යය පාරිසරික අභියෝග සාමාන්‍ය පාරිසරික අභියෝග වලට වඩා ක්ෂුද්‍ර වන නමුත් ඒවායේ බලපෑමේ ක්ෂණික බව හා පුළුල් බව සාපේක්ෂව ඉහළය. මේ අනුව හඳුනා ගතහැකි කාර්යය පාරිසරික අභියෝග පහතින් සාකච්ඡා කෙරෙයි.

***සාම්ප්‍රදායික බැංකු හා මූල්‍ය ආයතන***

සමුපකාර ග්‍රාමීය බැංකු බිහිකරන්නේ සම්ප්‍රදායික, සාමාන්‍ය ජනයාට දුරස්තර බැංකු කටයුතු සාමාන්‍ය ජනයාට ළඟාකිරීම සඳහාය. මීට පෙර යුගයේදී බැංකු ගිණුමක් විවෘත කර ගැනීම සාමාන්‍ය ජනයාට ඉතා අපහසු කටයුත්තක් විය. කේ. ජයතිලක සාහිත්‍යමය ආකෘතියෙන් විස්තර කරන්නේ එම තත්වයයි.

> මට බැංකු ගිණුමක් විවෘත කර ගැනීමට අවශ්‍යව තිබිණ. මහජන යුගයක් හෝ මහජන බැංකු යුගයක් නොවූ ඒ කාලයේ බැංකු ගිණුම සුළු ධනේෂ්වර ලක්ෂණයක් විය. බැංකු මෙන්ම බැංකු ගිණුම් ඇතිව සිටියෝද අල්ප වූහ. ඒ නිසා නව ගිණුමක් සඳහා අවශ්‍යව තිබූ රෙකමදාරුව කාගෙන් ලබා ගනිම් දැයි මම ලතවෙමින් සිටියෙමි (Jayatilaka, 2021, 109).

මේ අනුව බැංකු ගිණුමක් සාමාන්‍ය ජනයාට සමීපවන්නේ සමුපකාර ව්‍යාපාරයේ කොටස් මුදල් මගින් නිර්මාණය වී ඇති මහජන බැංකුව හා සමුපකාර ග්‍රාමීය බැංකුව හරහාය. කෙසේ වෙතත් වර්තමානය වන විට මෙම තත්වය අභියෝගයට ලක්වෙමින් පවතියි. සාමාන්‍ය ජනයාද සංස්කෘතීකරණය හරහා පුද්ගලික හා රාජ්‍ය බැංකු දෙසට ඇදෙමින් පැවතීම මේ අනුව දැකගත හැකිය. මෙය ණය හා තැන්පත් ක්ෂේත්‍රය මෙන්ම, උකස් කටයුතු සම්බන්ධයෙන්ද සිදුවෙමින් පවතියි. අම්බලන්ගොඩ නගරය ගතහොත් මේ වන විට කොළඹට පමණක් සීමාවූ බැංකු කිහිපයක් හැර අනෙක් සියළුම බැංකු හා මූල්‍ය ආයතන ස්ථාපිත නගරයකි. සමිතියේ බල

ප්‍රදේශය විහිදෙන බටපොල නගරයද, ගෝනපීනුවල නගරයද අනෙක් සුළු නාගරික ප්‍රදේශද යම් මට්ටමකින් බැංකු හා මූල්‍ය ආයතන ස්ථාපිතව ඇත. මේ නිසා සිය සාමාජික ප්‍රජා බැංකුව තුළ ස්ථාවරව රඳවා තබා ගැනීමේ අභියෝගයට සමිතිය මුහුණ දෙයි.

***ක්ෂුද්‍ර මූල්‍ය ආයතන***

සමුපකාර ග්‍රාමීය බැංකුව ප්‍රධාන වශයෙන් සිදු කරන්නේ ක්ෂුද්‍ර මූල්‍ය කටයුතුය. 2016 අංක 6 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනත සම්මත වීම ඔස්සේ ගොඩනැගෙන සුළු මූල්‍ය සමාගම් විසින් සමුපකාර ග්‍රාමීය බැංකුව අත්කරගෙන සිටින වෙළඳපොල කොටස අවප්‍රමාණ වීමේ අවදානමක මේ වන විට සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතිය පසුවෙයි. මෙම ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ප්‍රධාන වශයෙන් ඉලක්ක කරන්නේ කාන්තාවන්ය. ඔවුන්ට නිවසටම හෝ ගම් ප්‍රදේශයටම ගොස් ණය නිකුත් කිරීම මෙම ආයතන වල සම්ප්‍රදායයි. මෙයට මුහුණ දීමට සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියට සිදුවෙයි.

***සමාන කාර්යයන්හි යෙදෙන සමුපකාර ආයතන***

සකසුරුවම් හා ණය ගනුදෙණු සමුපකාර සමිති රැසක් ප්‍රදේශය පුරා විසිරී ඇත, එසේම ගාල්ල දිස්ත්‍රික් ප්‍රාග්ධන සමුපකාර සමිතිය ද ප්‍රදේශයේ ක්‍රියාත්මක වෙයි. මෙම ආයතන සියල්ල සමුපකාර පනත යටතේ ලියාපදිංචි අතර සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ සිදු කරන තැන්පත් බාර ගැනීම හා ණය නිකුත් කිරීම යන ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි. එසේම සමහර සණස සමිති රන් භාණ්ඩ උකස් කටයුතුද සිදු කරයි. මෙම සමිති ඉහළ මට්ටමින්ම විවිධ සේවා සමිතියට වඩා ප්‍රජාවට සම්බන්ධය. සමාන පසුබිමක් සහිත, තරගකාරී නොවිය යුතු යයි න්‍යායාත්මව සලකන ආයතන වුවත් එකිනෙක හා තරගකාරී බවක් මේවා අතර පවතින බව සත්‍ය තත්වය වීම මෙයට හේතුවයි.

***සුපිරි වෙළඳසැල් ජාලා***

සමුපකාර ව්‍යාපාරයේ පාරිභෝගික අංශයට නවීන පාරිභෝගික වෙළඳාම් සංකල්පය වන සුපිරි වෙළඳ සැල් ජාලා සෘජු අභියෝගයකි. එවා සාමාන්‍ය වශයෙන් ගත්විට අනෙකුත් පුද්ගලික වෙළෙඳ සැල් ජාලා වලටද අභියෝගයක් බව දනිමු. කුඩා පුද්ගලික වෙළෙඳ සැල් වලට වඩා අභියෝගාත්මක තත්ත්වයක් සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියට පවතින බව ලාභ අලාභ තත්ත්වය විශ්ලේෂණය ඔස්සේ දැකගත හැකිය.

***පුද්ගලික ඉන්ධන හල් විශාල වශයෙන් බිහිවීම***

පුද්ගලික ඉන්ධනහල් සඳහා බලපත්‍ර නිකුත් කිරීම ඉහළ යාම මත සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. හා බටපොළ නගරවල පවතින ඉන්ධනහල් සඳහා තරඟකරුවන් බිහිවී ඇත. මෙය ඉන්ධනහල් පිළිබඳ සමුපකාර සමිතියට ප්‍රදේශයේ පැවති කතිපයාධිකාරීත්වය අවසන් වීමකි. මෙය පාරිභෝගික අංශය කළමනාකරණය පිළිබඳ අභියෝගයකි.

*සැපයුම්කරුවන්*

සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියේ පාරිභෝගික අංශයට සැපයුම් සිදු කරන අලෙවි නියෝජිතයින් හා අනෙකුත් සැපයුම්කරුවන්ගේ කටයුතු කළමනාකරණය කර ගැනීම අභියෝගයකි. පුද්ගලික අංශය හා තරගකාරීව මිලදී ගැනීම් හා ඒ ඔස්සේ ලැබෙන කේවල් කිරීමේ බලයක් අත්පත් කර ගැනීම සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමිතියට ඇති අභියෝගයකි.

*ප්‍රචාරණය*

සමාන ව්‍යාපාරික කටයුතු කරන ආයතන විසින් භාවිත කරන ප්‍රචාරණ කටයුතු සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියට අභියෝගයකි. බොහෝ සමාන ව්‍යාපාරික කටයුතු කරන ආයතන සාමාජික මට්ටමින් මධ්‍යගතව වැඩ කරන ඒවාය. බැංකු හා මූල්‍ය ආයතන උදාහරණයට ගත්විට ඒවා ජාතික මට්ටමින් වැඩ කරන හා ජාතික මට්ටමින් ප්‍රචාරණ කටයුතු කරන ආයතනයි. මෙම ජාතික මාධ්‍යය යොදාගෙන සිදු කරන ප්‍රචාරණයන් හා ගැටීමට ප්‍රාදේශීය තලයේ වැඩකරන සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියට අභියෝගයකි.

**ආයතනික බාහිර පරිසරික අභියෝග ජයගැනීමේ කළමනාකරණ උපක්‍රම: සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය**

සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියේ පරමාර්ථ (Goals) සංගෘහිත වන්නේ එහි අතුරු ව්‍යවස්ථාවේය. ඒ අනුව අතුරු ව්‍යවස්ථාව සමිතියේ පරමාර්ථ සංගෘහිත කරන්නේ පහත ආකාරයටයි.

> සමිතියේ පරමාර්ථ වනාහි සමුපකාර ප්‍රතිපත්ති අනුව එහි සාමාජිකයන්ගේ ආර්ථික , සමාජ හා සංස්කෘතික අවශ්‍යතාවයන් සපුරාලීමත්, සාමාජිකයන් තුළ සකසුරුවම්කම හා අන්‍යෝන්‍යාධාරය සහ ආත්මාධාරය පිළිබඳ හැඟීම් හා ව්‍යවහාරය දියුණු කිරීමත් වන්නේ ය (සී.ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය, 1971).

මෙම අතුරු ව්‍යවස්ථාව ඔස්සේ දක්වා ඇති පරමාර්ථ සාධනය කර ගැනීම සඳහා ගොඩනගනු ලබන අරමුණු (Objectives) පිළිබඳව විස්තර ප්‍රකාශය වන්නේ වාර්ෂික සංවර්ධන සැලැස්ම හා අයවැය ඇස්තමේන්තුවයි. සමිතිය 2022 වසරේදී සිය සංවර්ධන සැලැස්මට සමාන්තර අයවැය ඇස්තමේන්තුවෙන් පුරෝකතනිත ලාභ ප්‍රමාණ හා සත්‍ය සංවර්ධන තත්ත්වය පහතින් දක්වා ඇත.

| | ප්‍රතිඵල | ඇස්මේන්තු | විචලනය |
|---|---|---|---|
| පාරිභෝගික අංශය | (4,525,459.00) | 18,600.00 | (4,506,859.00) |
| ග්‍රාමීය බැංකු අංශය | 145,808,730.00 | 3,230,450.00 | 142,578,280.00 |
| ඉන්ධන අංශය | 487,601.00 | 4,464,350.00 | 3,976,748.00 |
| අනිකුත් අංශ | 19,118,496.00 | 906,627.00 | 18,211,869.00 |
| අතිරික්තය | 147,058,456.00 | 39,325,707.00 | 107,732,749.00 |

**මූලාශ්‍රය:** (දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, 2022)

පාරිභෝගික අංශය සහ ඉන්ධන අංශය අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වී නොමැති අතර ග්‍රාමීය බැංකු අංශය අදාළ ඇස්තමේන්තු ඉක්මවා ගොස් ඇත. ඒ අනුව මුළු අතිරික්තය ද ඇස්තමේන්තු ගත ශේෂය තුන්ගුණයකින් ඉක්මවා ගොස් ඇත. කෙසේ නමුත් මෙම පුරෝකතන සමග නොසිතූ මට්ටමේ උච්චාවචන පුරෝකතන වල ගැටලුවක් පවතින බවද සංඥා කරයි.

කෙසේ වෙතත් මෙම ලාභඅලාභ තත්ත්වය ඇති වීමට සමිතියේ අභ්‍යන්තර පාරිසරික සාධක මෙන්ම බාහිර පාරිසරික සාධක ද බලපා ඇති බව පෙනී යයි. මෙම අධ්‍යයනයට පාදක කර ගන්නේ සමිතියේ අවසාන විගණිත මූල්‍ය ප්‍රකාශන ඇති 2022 වර්ෂ වන අතර, මේ අනුව පහතින් දැක්වෙන්නේ සමිතියේ බාහිර පාරිසරික අභියෝග ජය ගැනීමට කළමනාකරණය විසින් යොදා පැවති උපක්‍රමයි. එසේම එකී සමහර උපක්‍රම වල දුර්වලතා ද කෙටියෙන් සාකච්ඡාකර ඇත. අභ්‍යන්තර හා බාහිර අභියෝග ජය ගැනීමට අදාළ සාර්ථක උපක්‍රම ක්‍රියාත්මක නොකිරීම ඔස්සේ පාරිභෝගික අංශයේ පාඩු තත්ත්වය ජනනය වී ඇති බවද දැකගත හැකිය.

**ආර්ථික මානීය අභියෝග ජයගැනීමේ උපක්‍රම**

විවෘත ආර්ථික ක්‍රමය තුළ සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියේ ග්‍රාමීය බැංකු අංශය ශක්තිමත්ව ස්ථාවරව පැවතීම කැපී පෙනෙන සුළු තත්වයකි. වෙනත් විවිධ සේවා සමුපකාර සමිති වල ග්‍රාමීය බැංකු අංශ යම් යම් ගැටලු සහගත තත්ත්වයන්ට මුහුණ දීම මෑත යුගයේදී දැකගත හැකිය. සීමාසහිත දෙහිවල-ගල්කිස්ස විවිධ සේවා සමුපකාර සමිතියේ මෙන්ම සීමාසහිතමහරගම විවිධ සේවා සමුපකාර සමිතියේ ද ග්‍රාමීය බැංකු අංශ තැන්පත් ගෙවීමේ අර්බුදයන්ට ලක්වීම මේ වන විට වාර්තා වන ගැටලුවකි (අස්ලම් & එදිරිසිංහ, 2023; කුමාර, 2023). මෙය වෙනම කළමනාකරණ මණ්ඩල මගින් පාලනය වන ව්‍යාපාරයක් වුවත් සමුපකාර

ග්‍රාමීය බැංකු ලෙස එකම නමකින් ක්‍රියාත්මක වන ව්‍යාපාරයක් නිසා සමස්ත ග්‍රාමීය බැංකු ආකෘතියටම ගැටලුවක් බව පැහැදිලිය. මෙතරම් අභියෝග තිබියදීත් සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියේ බටපොළ ග්‍රාමීය බැංකු ශාඛාව ගතහොත් එම නගරයේ ඇති සමහර පුද්ගලික බැංකු වලටද අභියෝගාත්මකව ව්‍යාපාරික කටයුතු සිදු කරයි. මෙයට හේතුව වන්නේ සමිතියේ කළමනාකාරිත්වය විසින් සාමාජිකයින් වන ගනුදෙනුකරුවන් හරහා සාමාජික නොවන ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය දීර්ඝ කාලීනව ඇතිකර පවත්වාගෙන යමින් පැවතීමයි. කෘෂිකාර්මික ප්‍රදේශයක් වන බටපොල ප්‍රදේශය ගතහොත් සමුපකාර සමිති සාමාජිකයින්ට අවශ්‍ය කෘෂි කාර්මික ණය වල සිට සාමාන්‍ය කටයුතු සඳහා වන ණය දක්වා වන ණය මුදල් පහසු ඇප දෙකක් මත, දැඩි කොන්දේසි හා ලියකියවිලි රහිතව සාමාජිකයින්ට නිකුත් කිරීම උපක්‍රමයක් වශයෙන් වර්ධනය කර පැවතීමයි. එසේම සමහර අවස්ථාවල සමිතියට යම් මට්ටමකින් ආදායම හා ද්‍රවශීලතාව සම්බන්ධව පාඩු මට්ටමක පැවතියත් කල්පසු ණය කරුවන්ට ක්ෂණිකව නෛතික ක්‍රියාමාර්ග නොගෙන කල්පසු ණය හා පැහැර හැර ඇති ණය අයකර ගැනීමට හැකි නෛතික නොවන උත්සාහයන් රැසක් ගෙන බැරිම තැන පමණක් නෛතික ක්‍රියාමාර්ග ගැනීම මගින් දිස්වන සාමාජික හිතෛෂීභාවය ද මෙම තත්වයට හේතු වී ඇත.

තවත් කාරණයක් වන්නේ අති විශාල ස්ථිර තැන්පත් පොලී අනුපාත ගනුදෙනුකරුවන්ට ඉදිරිපත් කිරීම වෙනුවට සමිතියට දැරිය හැකි-එමෙන්ම තැන්පත්කරුට සාධාරණ පොලී අනුපාත ඉදිරිපත් කිරීම මගින් ග්‍රාමීය බැංකු වල තිරසර බව පවත්වා ගැනීමට කළමනාකරණය තීරණය කර ඇත. ශ්‍රී ලාංකේය ආර්ථික අර්බුදයට පෙර අනෙකුත් බැංකු වලට වඩා කුඩා පරිමාණයකින් ඉහළ, නමුත් අතිශය පරතරයක් නැති (1% - 2%ක් අතර) විභේදනයක් පවත්වාගෙන ගොස් ස්ථාවර තන්පත් ආකර්ෂණය කර ගැනීමේ උපක්‍රමයක් ක්‍රියාත්මක කළ සමිතිය මෑත ආර්ථික අර්බුදය තුළ ස්ථාවර තැන්පත් පොලිය විශාල ලෙස ඉහළ දමමින් ස්ථාවර තැන්පත් රඳවා ගැනීමේ පිළිවෙතක් අනුගමනය කළේ නැත. මේ වන විට කළමනාකරණය ගත් එම තීරණය තීක්ෂණ උපක්‍රමයක් බව පෙනෙන්නේ මේ වන විට ස්ථාවර තැන්පත් පොලිය පහළට ගමන් කර ඇති බැවිනි.

උකස් පොලී අනුපාතිකද අනෙක් මූල්‍ය ආයතන වලට වඩා අඩුවෙන් හා සාමාජිකයින්ට විශේෂ අඩුකිරීම් සහිතව පවත්වාගෙන ගොස් තිබීම තවත් උපක්‍රමික ප්‍රවේශයකි. එය සමිතියේ සංස්ථාපිත අරමුණු වන සමුපකාර සාරධර්ම හා ප්‍රතිපත්ති වෙත ගමන් කිරීමේ උත්සාහයකි. ඒ තුළ වෙනත් බැංකු හා මූල්‍ය ආයතන සමග තරගකාරීව උකස් කටයුතු වල යෙදීමට ග්‍රාමීය බැංකු පද්ධතියට හැකිවී ඇත.

**ස්වාභාවික පරිසරික මානීය අභියෝග ජයගැනීමේ උපක්‍රම**

සමිති කළමනාකරණය 2030 තිරසාර සංවර්ධන ඉලක්ක සමග එකට ගමන් කිරීමේ උපක්‍රම අනුගමනය කිරීමක් දක්නට නැත. එය සැලකිය යුතු අඩුපාඩුවකි. සාමාජික හා මහජන ආකර්ශන මෙවලමක් ලෙසද, සමුපකාර ප්‍රතිපත්ති හා සාරධර්ම මත පෙනී සිටින සංවිධානයක

පැවතිය යුතු අංගයක් ලෙසද මේ පිළිබඳව සැලිකිමත්වීම අවශ්‍ය වෙයි. නමුත් මෙම 2030 තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ දැඩි සංවේදීතාවකින් නොවුනද පරිසර සංරක්ෂණ හා දුගීබව දුරලීම ඉලක්ක කරගත් ස්වේච්ඡා වැඩසටහන් ගණනාවක් හා දරිද්‍රතාව අවම කිරීමට ස්වයං රැකියා හා සුළු පරිමාණ ව්‍යවසායකයන් සඳහා වන ග්‍රාමීය බැංකු ණය ක්‍රම ගණනාවක් සමිතිය විසින් ක්‍රියාත්මක කරයි. සමිතිය විසින් ක්‍රියාත්මක කරන ස්වයං රැකියා වෙළඳ පොල හෙවත් "පුංචි පොළ" නමින් ප්‍රදේශයේ ජනයා අතර ප්‍රකට සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය සිදු කරන ප්‍රජාව සවිබලගැන්වීමේ වැඩසටහනයි. (ගලගමගේ, 2021). ඒ තුළින් සාමාජික හා සාමාජික නොවන ප්‍රජාවගේ ජීවන බරට උරදීමට සමිතිය ප්‍රශස්ථ උත්සාහයක් ගෙන ඇත.

**තාක්ෂණික මානීය අභියෝග ජයගැනීමේ උපක්‍රම**

සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස සමිතියේ ඇති ශක්තිමත්ම අංශය වන්නේ සමුපකාර ග්‍රාමීය බැංකු අංශයයි. සමිතියේ ග්‍රාමීය බැංකු ශාඛා අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය හා අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ලෙස වන සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිති බලප්‍රදේශය ආවරණය කරමින් ශාඛා 10ක් ලෙස ක්‍රියාත්මක වෙයි. මෙය එක් ආයතනයක් සතු වැඩිම මූල්‍යායතන ශාඛා ගණනයි. මේ අනුව වැඩිම මූල්‍යායතන ශාඛා ප්‍රමාණයක්, නාගරික පරිශ්‍රයන්ගෙන් පිටත ප්‍රදේශයේ අර්ධ නාගරික පරිශ්‍රයන්හිද ස්ථාපිත කිරීම මත ප්‍රකට බැංකු හා මූල්‍යායතන මගින් කෙරෙන අභියෝගයන්ට යම් පිළිතුරක් සමිති කළමනාකාරිත්වය විසින් ලබාදී ඇත. එසේම සියලුම ශාඛා පරිගණ ගත කර ගනුදෙනු සැකසුම් පද්ධති (Transaction Processing System - TPS) මෘදුකාංගයක් ඔස්සේ වැඩකටයුතු සිදුකිරීම තුළින් නවීන බැංකුකරණ අත්දැකීමක් සිය සාමාජික ප්‍රජාවට හා ගනුදෙනුකාර ප්‍රජාවට සමුපකාර ග්‍රාමීය බැංකු විසින් ලබාදී ඇත.

කෙසේ නමුත් යම් මට්ටමක අඩුපාඩුවක් ලෙස දැකගත හැක්කේ ඒටීඑම් පද්ධතියක් (Automated Teller Machine) භාවිත නොවීම හා වීසා හා මාස්ටර් කාඩ් වැනි නූතන ගනුදෙනු ක්‍රම සහිත ගනුදෙනු කාඩ්පත් නිකුත් කිරීමක් සිදු නොවීමත්ය. මේ තුළ ග්‍රාමීය බැංකු ගිණුමක කටයුතු හා මුදල් ලබා ගැනීමේ පහසුකම් ප්‍රදේශයෙන් පිටතදී සිදුකිරීමේ හැකියාව මෙතක් ලබාදී නොතිබීමයි. මෙය උපක්‍රම පිළිබඳ අඩුපාඩුවකි.

**සමාජ සංස්කෘතික මානීය අභියෝග ජයගැනීමේ උපක්‍රම**

සමුපකාර ව්‍යාපාරයට තරුණ ප්‍රජාව ආකර්ෂණය වීමේ ප්‍රවනතාව අඩුවීම ප්‍රවර්තන තත්ත්වයයි. "පැරණි" ව්‍යාපාරික විලාසිතාවක් ලෙස සමුපකාර ව්‍යාපාරය ඔවුන් විසින් සැලකීම මෙයට එක් හේතුවකි. මේ තත්ත්වය සමිතියේ ඉදිරි තිරසාර පැවැත්මට අභියෝගයකි. මෙම තත්ත්වයට විසඳුමක් ලෙස දරු දැරියන් හා තරුණ තරුණියන් ආකර්ෂණය කර ගැනීම සඳහා සමිති කළමනාකරණය විසින් යොදා ඇති උපක්‍රම වන්නේ පාසැල් දරුවන්ට අධ්‍යාපන සම්මන්ත්‍රණ

නොමිලයේ පැවැත්වීම, ජාත්‍යන්තර සමුපකාර දින අධ්‍යාපන, කලා හා ක්‍රීඩා තරග පාසැල් ළමුන් හා සාමාජික තරුණ තරුණියන් වෙනුවෙන් සංවිධානය කිරීම ආදියයි.

**දේශපාලන-නෛතික මානීය අභියෝග ජයගැනීමේ උපක්‍රම**

සමුපකාරව්‍යාපාරය නිර්-දේශපාලනික විය යුතු බවට සමුපකාර ප්‍රතිපත්ති තුළ අන්තර්ගත වුවත් ව්‍යවහාරික ක්ෂේත්‍රයේදී මෙම නිර්-දේශපාලනික බව, නැතිනම් දේශපාලන මධ්‍යස්ථභාවය පවත්වාගෙන යාම අභියෝගයක් බවට පත්ව ඇත. සාමාන්‍යයෙන් සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වන බහුතරය මෙන්ම එම අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා පත්කරගනු ලබන මහ සභා නියෝජිතයන් බහුතරයද දේශපාලන පසුබිම් සහිතව ක්‍රියාත්මක වෙයි. න්‍යායික තලය කෙසේ වෙතත් ප්‍රායෝගික තලයේ තත්ත්වය මෙය වන නිසා සමිති කළමනාකරණයට සමිති පරිපාලනය වන අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ පවත්වාගෙන යන සම්බන්ධය උපක්‍රමශීලී බවකින් යුතුව පවත්වාගෙන යාමට සිදුව ඇත. කෙසේ නමුත් මෙම සියල්ල සිදුවන්නේ ප්‍රජාතාන්ත්‍රික ආකෘතියකට වන නිසා හුදෙක් අත්තනෝමතිකව හා දේශපාලනික න්‍යාය පත්‍ර මත පූර්ණව පදනම්ව ක්‍රියා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට අවස්ථාවක් හිමි වන්නේ නැත. මෙහිදී සමුපකාර පනත, රීති , සමිති අතුරු ව්‍යවස්ථාව හා කාරක නියෝගද, නියාමන ආයතනය වන සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛවලට අනුගතව ක්‍රියාත්මක වීමට උත්සාහ දැරීමට ක්‍රියා කිරීම සමිති කළමනාකරණයේ උපක්‍රමික ප්‍රවේශය වී ඇත. මේ නිසා බාහිර දේශපාලන බලවේග සමිතිය මත පූර්ණ ආධිපත්‍යට පත්වීම වැලකී ඇති අතර, වෙනත් දේශපාලන කණ්ඩායම් හා ස්වාධීන මතධාරීන්ද මහ සභාව නියෝජනය කිරීමත්, ගැටලු සහගත තැන් මහසභා නියෝජිතයන්ගේ ඍජු ප්‍රශ්ණ නැගීමට හා අධීක්ෂණයට ලක්වන නිසා මෙම සමතුලිතතාවය සැලකිය යුතු මට්ටමින් පවත්වාගෙන යාම සිදුවෙයි.

**ජාත්‍යන්තර මානීය අභියෝග ජයගැනීමේ උපක්‍රම**

සීමාසහිත අම්බලන්ගොඩ විසේ.ස. සමිතියේ ඉන්ධන අංශය ප්‍රධාන වශයෙන් තෙල් මිල උච්චාවචනය වීම මත පදනම්ව ඇත. තෙල් මිලෙහි උච්චාවචනයන් ක්ෂණික ලාභ පාඩු සමිතියට ඇතිවීමේ අවදානම දරයි. තෙල් මිලෙහි උච්චාවචන සම්බන්ධව නිරන්තර අවධානයෙන් සිටීම එම අංශය භාර කළමනාකරුවන්ගේ වගකීමක් බවට පත්කර ඇති අතර, විශේෂයෙන් තෙල්මිල අඩුවීමට ඉඩ ඇති අවස්ථාවලදී ඉන්ධන තොග පාලනයකින් යුතුව ඇණවුම් කිරීමට අදාළ සීරුමාරු කිරීම් මෙම අංශය විසින් සිදු කරයි. එය සිදු කරන්නේ ඉන්ධන සැපයුම අඛණ්ඩව පවත්වා ගනිමිනි. මෙය සාමාන්‍යයෙන් අභියෝගාත්මක කටයුත්තකි.

**සාම්ප්‍රදායික බැංකු හා මූල්‍ය ආයතන මගින් එන අභියෝග ජයගැනීමේ උපක්‍රම**

ග්‍රාමීය බැංකු පද්ධතිය මගින් පහළ පාන්තික ජනයා වෙත හා පහළ මධ්‍යම පන්තිය වෙත සැලකිය යුතු සේවාවක් ඉටු වෙමින් පවතියි. මෙම පහළ පාන්තික ජනයා හා පහළ මධ්‍යම පාන්තික පිරිස් වෙත සාම්ප්‍රදායික බැංකු හා මූල්‍ය ආයතන වැඩි සැලකිල්ලක් නොදැක්වීමේ වාසිය සමුපකාර ග්‍රාමීය බැංකු විසින් උපක්‍රමිකව භාවිත කරනු ලබයි. නමුත් මේ වන විට ක්ෂුද්‍ර

ණය ව්‍යාපෘති හරහා සම්ප්‍රදායික බැංකු හා මූල්‍යායතනද පහළ මධ්‍යම පන්තිය විනිවිදිමින් සිටින නිසා අම්බලන්ගොඩ සමුපකාර ග්‍රාමීය බැංකු පද්ධතිය අභියෝගයන්ට මුහුණ දෙමින් සිටියි. මෙම අභියෝග ජය ගැනීමට සමුපකාර සාමාජිකත්ව ප්‍රවර්ධන වැඩසටහන් හා සාමාජිකයින් දිරිගැන්වීමේ වැඩසටහන් මෙන්ම සාමාජිකයන්ට විශේෂ වරප්‍රසාද ලබා දීම හරහා සමුපකාර සමිතිය යනු සාමාජික අයිතිය හා සාමාජික ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ පවතින ආයතනයක්ය යන හැඟීම ලබාදෙමින් කටයුතු කිරීමට අදාළ වැඩසටහන් කළමනාකරණය විසින් ක්‍රියාත්මක කරනු දැකගත හැකිය. මෙම වැඩසටහන් වල පරිමාව ප්‍රමාණවත් නොවන බවක් දිස් වෙතත් ආරම්භක ලක්ෂයක් විදියට ඒවා වැදගත් වනු ඇත.

**ක්ෂුද්‍ර මූල්‍ය ආයතනික අභියෝග ජයගැනීමේ උපක්‍රම**

මෑතකදී බිහිව පැතිර යමින් පවතින ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ප්‍රධාන වශයෙන් සුළු මූල්‍ය කටයුතුවල නිරතවන පැරණිතම ආයතනයක් වන සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියේ සමුපකාර ග්‍රාමීය බැංකු පද්ධතියට ප්‍රබල අභියෝගයකි. මෙම සමාගම් ලොව පුරා ස්වේච්ඡා මානව ආයතන මගින් ක්‍රියාත්මක කර සාර්ථකත්වයට පත්ව ඇති කාන්තා කණ්ඩායම් ක්‍රම වැනි ක්‍රම පුද්ගලික ව්‍යාපාර කටයුතු වලට යොදා ගනිමින් තිබෙන හෙයින් මෙම අභියෝගය තවත් වර්ධනය වී ඇත.

මේ පිළිබඳව අවධානය යොමුකර ඇති සමිති කළමනාකරණය කාන්තා කණ්ඩායම් ක්‍රමද අත්හදා බැලෙමින් පවතියි. ප්‍රධානතම කාරණය වන්නේ සමිතිය නිකුත් කරන ණය වල පොලී ප්‍රතිශතය ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් වල පොලී ප්‍රතිශත වලට වඩා බෙහෙවින් අඩු වීමයි. එම උපක්‍රමික ප්‍රවේශය සමග ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් වට තරග කළ නොහැකිය.

**සමාන කාර්යයන්හි යෙදෙන සමුපකාර ආයතනික ජයගැනීමේ උපක්‍රම**

සමාන කාර්යයන් හි යෙදෙන සමුපකාර සමිති සීමාසහිත අම්බලන්ගොඩ සමුපකාර ග්‍රාමීය බැංකු පද්ධතියේ ගනුදෙනු කරුවන් බවට පත්කර ගැනීම ඔස්සේ මෙම සමිති මගින් එන වෙළඳපොල කොටස පිළිබඳ අභියෝගය සමනය කර ගැනීමට සමිතිය විසින් උත්සාහ ගෙන ඇත. සාමාන්‍යයෙන් සමුපකාර ව්‍යාපාරය තවත් සමුපකාර සමිතියක් සලකනු ලබන්නේ සහෝදර ආයතනයක් වශයෙනි. “සමුපකාර අතර සහයෝගීතාව” යන සමුපකාර ප්‍රතිපත්තිය මත පිහිටා එම ආයතන සමඟ ඒකාබද්ධ හා සාමූහික සම්බන්ධතාවන්ට ගමන් කිරීම සමිති කළමනාකරණයේ උපක්‍රමික ප්‍රවේශයයි. එම සමිති සිය තැන්පත්කරුවන් බවට පත්කර ගැනීම යනු සැලකිය යුතු විශාල මුදල් ප්‍රවාහයක් සමිතියට ඇතුලත් කර ගැනීමකි. මේ අනුව ප්‍රදේශයේ ඇති සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති සියල්ලම පාහේ සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිති ග්‍රාමීය බැංකු පද්ධතියේ ගිණුම් හිමියන්ය.

**සුපිරි වෙළඳසැල් ජාලා අභියෝග ජයගැනීමේ උපක්‍රම**

සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමිතියේ පාරිභෝගික අංශයේ කටයුතු අලාභදායී බව ඉහත වගුව මගින් පැහැදිලි වෙයි. මෙය වසර ගණනාවක සිට දිගින් දිගටම ගලාඑන තත්ත්වයයි. 1977 ආරම්භවන නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය හා බද්ධ වූ නවලිබරල් ධනවාදය විසින් අම්බලන්ගොඩ නගරයටද සුපිරි වෙළඳසැල් හා ඒ හා සමාන පාරිභෝජන රටාවන් සහිත ආයතන පද්ධතියක් ගලාවිත් ඇත. මේ තුළ මධ්‍යම පන්තිය සම්පූර්ණයෙන්ම පාහේ සමුපකාර ව්‍යාපාරය සමග ගනුදෙනු කිරීමෙන් ඈත් වී ඇත. සමුපකාර ව්‍යාපාර හරහා දිළිඳු සහනාධාර බෙදීම් කටයුතු කිරීමද මේ සඳහා බලපා ඇත. මේ වන විට සහනාධාර ලබා දීමේ කටයුතු සාමාන්‍යයෙන් සිදුනොවෙතත් සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතිය පමණක් නොව ශ්‍රී ලංකාවේ විවිධ සේවා සමුපකාර සමිති විශාල ප්‍රමාණයක සිල්ලර වෙළඳ අංශය අර්බුදයක පවතියි. මෙම අංශය ලාභදායීව පවත්වාගෙන යන්නේ සමිති කුඩා ප්‍රමාණයක් පමණි. සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතියේ සිල්ලර වෙළඳ අංශයේද මෙම තත්ත්වය දැකගත හැකිය. සිල්ලර වෙළඳ සැල් අංශයේ ඉලක්ක ජය ගැනීම සඳහා ප්‍රමාණවත් කළමනාකරණ උපක්‍රම යොදා ඇති බවක් දැකගත නොහැකිය. මෑත කාලයේ තොග මිලට සහල් ඇතුළු පාරිභෝගික ද්‍රව්‍ය අලෙවි කිරීමේ උපක්‍රමික ප්‍රවේශයක් අනුගමනය කරන ලද අතර, ඒ තුළ වෙළඳාමෙහි යම් වර්ධනයක් සිදුව ඇතත් එය ප්‍රමාණවත් වර්ධනයක් නොවේ.

**පුද්ගලික ඉන්ධන හල් විශාල වශයෙන් බිහිවීමේ අභියෝගය ජයගැනීමේ උපක්‍රම**

මෙම ගැටලුව ජයගැනීම සඳහා ඉන්ධන සඳහා තැන්පත් මුදලක් තැබීමේ පදනම මත පෞද්ගලික ආයතන වලට ඉන්ධන නිකුත් කිරීමේ ක්‍රමවේදයක් හා රාජ්‍ය ආයතන වලට ඉන්ධන ණය පදනමට නිකුත් කිරීමේ උපක්‍රමික ප්‍රවේශයක් අනුගමනය කිරීම සිදුවෙයි. ණය පදනම මත ඉන්ධන නිකුත් කිරීම වෙනත් ඉන්ධනහල් විසින් නොකෙරෙන නිසා පුද්ගලික ඉන්ධන හල් සමඟ තරකාරීව මෙහෙයම් පවත්වාගෙන යාමේ හැකියාව ඇත.

**සැපයුම්කරුවන්ගේ ගැටලු ජයගැනීමේ උපක්‍රම**

මෙම අභියෝගයද නිසි ලෙස කළමනාකරණය කර නැති බවක් දැකගත හැකිය. බොහෝ සැපයුම්කරුවන් සැපයුම් සමඟ නොමිලයේ ලබාදෙන සැපයුම් ප්‍රමාණයන් වාර්තා නොවීම නිරීක්ෂණය කළ හැකිය. එසේම සැපයුම්කරුවන් සමඟ නිසිලෙස කේවල් කිරීමක ආයතනය නිරත නොවන බවද දැකගත හැකිය. පුද්ගලික වෙළඳුන් සැලකිය යුතු භාණ්ඩ ප්‍රමාණයක් මිල අඩුකොට වෙළඳපොලට ඉදිරිපත් කරන්නේ මෙම නොමිලයේ ලබාදෙන භාණ්ඩ හා වට්ටම් යනාදිය යොදා ගනිමිනි.

මේ සඳහා එක් විසඳුමක් ලෙස වැඩි කේවල් කිරීමේ බලයක් සමුපකාර සමිති වලට ලබා ගැනීමට දකුණු පළාතේ සමුපකාර සමිති වල ද්විතියික සමිතියක් ලෙස දකුණු පළාත් කෘෂි නිෂ්පාදන අලෙවි හා පාරිභෝගික සමුපකාර සමිති සංගමය ගොඩ නගන ලද නමුත් සමිතිවල ක්‍රියාකාරී සහභාගිත්වය මද වීම මත එය දියුණුවට පත්වූයේ නැත.

*ප්‍රචාරණ අභියෝග ජයගැනීමේ උපක්‍රම*

වර්තමාන බැංකු හා පාරිභෝගික වෙළඳ ආයතන ජාතික මට්ටමේ ප්‍රචාරණයන් ගෙනයයි. රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත් පත් පමණක් නොව සමාජ මාධ්‍යය දැන්වීම් ලෙස වන පුළුල් ප්‍රචාරයක මෙම ආයතන නිරත වෙයි. සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස. සමිතිය ක්‍රියාත්මක වන්නේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශ දෙකක් ආවරණය කරමිනි. මේ නිසා සමහර කාර්යයන් සඳහා ජාතික මට්ටමේ ප්‍රචාරණයන් වැදගත් නැත. එවැනි ප්‍රචාරණයන්ට යාම මුදල් නාස්ති කිරීමක්ද වෙයි. ඒ වෙනුවට ප්‍රාදේශීය මට්ටමේ ප්‍රචාරණ වැඩ පිළිවෙළක් මෙම පුද්ගලික අංශයේ ප්‍රචාරණ වැඩසටහන් වලට උපක්‍රමික පිළිතුරක් ලෙස සමිති කළමනාකරණය විසින් දියත් කරනු දැකගත හැකිය. ඒවා සිදුවන්නේ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති, සාමාජික සුබසාධන ව්‍යාපෘති, පාසැල් දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති ආදී ප්‍රවේශයන්ගෙනි. මෙම උපක්‍රමික ප්‍රවේශය විශාල වශයෙන් වියදම් දරන වෙළඳ දැන්වීම් ප්‍රවේශයට වඩා ඵලදායීය.

**නිගමන**

මෙම නිබන්ධයේ පළමු කොටසින් අධ්‍යයනයට ලක්වන ආයතනයේ පසුබිම පිළිබඳව කෙටි ඇස්බැල්මක් යොදා ඇති අතර, දෙවන කොටසින් න්‍යායික තලයක පිහිටමින් සීමාසහිත අම්බලන්ගොඩ වි.සේ.ස.  සමිතියේ බාහිර පරිසරය විමසුමට ලක්කර ඇත්තේ පවතින අභියෝගද හඳුනා ගනිමිනි. තෙවන පරිච්ඡේදයෙන් එම අභියෝග ජය ගැනීමට යොදා ඇති කළමනාකරණ උපක්‍රම සාකච්ඡා කර ඇත. මෙම පරිච්ඡේදයෙන් මේ අනුව මෙම අධ්‍යයනයෙන් පැමිණිය හැකි නිගමන සටහන් කරන්නෙමු.

- පාරිභෝගික අංශය අසාර්ථක වීමට අදාළ සංකීර්ණ හේතු ගවේශනයට පර්යේෂණාත්මක මැදිහත් වීමක් අවශ්‍ය වෙයි.
- ග්‍රාමීය බැංකු අංශය සිය සාර්ථකත්වය අත්කරගෙන ඇත්තේ කළමනාකාරිත්වය විසින් සැලකිය යුතු මට්ටමේ උපක්‍රම නිර්මාණය කර පවත්වාගෙන යාම සිදුකළ නිසා බව පෙනී යයි. කෙසේ නමුත් සමිතිය ග්‍රාමීය බංකු අංශයේ ඉලක්ක පිළිබඳව සිදුකර ඇති පුරෝකතනවල පුළුල් වෙනස්කම් ඇතිවීම පෙන්නුම් කරන්නේ යොදාගත් පුරෝකතන ශිල්ප ක්‍රම එතරම් සාර්ථක වී නැති බවයි. මේ නිසා වඩා නිවැරදි පුරෝකතන ලැබෙන ශිල්ප ක්‍රම භාවිතය වැදගත්ය.
- ධරණීය සංවර්ධන ඉලක්ක, සමුපකාර අනන්‍යතාව පිළිබඳ බර තැබීම්, සමුපකාර ප්‍රතිපත්ති හා සාරධර්ම භාවිතය හා ඒවා ආයතනික ප්‍රතිරූපය නැංවීමේ උපකරණ ලෙස භාවිතය  ප්‍රමාණවත් නැති බවද පෙනී යයි.

**සමුද්දේශ**


සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය. (1971, 06 26). *අතුරු ව්‍යවස්ථාව.*

දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. (2023). *සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය: විගණන වාර්තාව - 2020.* දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.

අස්ලම්, F., & එදිරිසිංහ, D. W. (2023, June 16). ග්‍රාමීය බැංකුව කෝටි 200ක තැන්පතු අතුරුදන් | අරුණ. *Aruna.lk.* https://www.aruna.lk/articles/KT1iDRPAHL0OFVH0tDUi

ගලගමගේ, P. (2020, May 21). *සමුපකාර ව්‍යාපාරයේ ආරම්භය හා වර්ධනය පිළිබඳ සංක්ෂිප්ත සටහනක්.* දක්ෂිණ සමුපකාර අන්තර්ජාල බිහිදොර. Retrieved October 20, 2023, from https://dakshinacoop.wordpress.com/2020/05/21/%e0%b7%83%e0%b6%b8%e0%b7%94%e0%b6%b4%e0%b6%9a%e0%b7%8f%e0%b6%bb-%e0%b7%80%e0%b7%8a%e2%80%8d%e0%b6%ba%e0%b7%8f%e0%b6%b4%e0%b7%8f%e0%b6%bb%e0%b6%ba%e0%b7%9a-%e0%b6%86%e0%b6%bb%e0%b6%b8%e0%b7%8a%e0%b6%b7/

ගලගමගේ, P. (2021, April 30). *(PDF) ආන්තික ප්‍රජා කණ්ඩායම් සවිබල ගැන්වීමට සමුපකාර ක්‍රමයට පවතින ශක්‍යතා පිළිබඳ අධ්‍යයනයක්: අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියේ ස්වයංරැකියා වෙළෙඳ මධ්‍යස්ථානය ("පුංචි පොළ ...* ResearchGate. Retrieved October 19, 2023, from https://www.researchgate.net/publication/351229860_3462_3505_3530_3501_3538_3482_95_3508_3530_8205_3515_3490_3535_95_3482_3499_3530_3497_3535_3514_3512_3530_95_3523_3520_3538_3510_3517_95_3484_3536_3505_3530_3520_3539_3512_3495_95_3523_3512_3540_3508

කුමාර, P. (2023, September 4). මහරගම සමුපේ ග්‍රාමීය බැංකු 11ක තැන්පත් කරුවන් 33,000කගේ කෝටි 105ක් පිල්ලි. *දිනමිණ.* https://www.dinamina.lk/2023/09/04/breaking-news/19342/%E0%B6%B8%E0%B7%84%E0%B6%BB%E0%B6%9C%E0%B6%B8-%E0%B7%83%E0%B6%B8%E0%B7%94%E0%B6%B4%E0%B7%9A-%E0%B6%9C%E0%B7%8A%E0%B6%BB%E0%B7%8F%E0%B6%B8%E0%B7%93%E0%B6%BA-%E0%B6%B6%E0%B7%90%E0%B6%82/

The International Cooperative Alliance. (n.d.). *Cooperative identity, values & principles | ICA.* International Cooperative Alliance. Retrieved October 20, 2023, from https://www.ica.coop/en/cooperatives/cooperative-identity

Jayatilaka, K. (2021). *නොනිමි සිත්තම සහ තවත් කෙටිකතා.* ප්‍රදීප ප්‍රකාශකයෝ.

*Marketing dictionary*. (n.d.). Monash University. Retrieved October 18, 2023, from https://www.monash.edu/business/marketing/marketing-dictionary/t/task-environment

Mtintsilana, T. (2007). *ENVIRONMENTAL CONSTRAINTS AFFECTING FARMERS IN THE GREAT-KEI REGION* [Research Project Submitted in Partial Fulfillment of the Requirements of the Master of Business Administration (MBA) Degree, School of Business, University of Nairobi]. https://core.ac.uk/download/pdf/145052901.pdf

නව පිවිසුම
ව්‍යවහාරික ශාස්ත්‍රීය සංග්‍රහය
ISSN 2961-5003 (Print) | ISSN 3121-3472 (e-ISSN)
3 වෙළුම, ii වන නිකුතුව - 2025 ජූලි-දෙසැම්බර්
පත්‍රිකා අංක 08

---

# සහයෝගිතා අර්ථ ක්‍රමය

---

ආර්.කේ.ආර්.එන්. මධුෂානි[16]
nilankamadushani28@gmail.com

---




| | |
|---|---|
| **ග්‍රන්ථය** | : සහයෝගීතා අර්ථ ක්‍රමය |
| **ප්‍රකාශණය** | : ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය |
| **කෘතිය සම්පාදක** | : උපාලි හේරත් |
| **මුද්‍රණ වර්ෂය** | : 2024 ජුනි |

[16] සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
Msc in Mgt (UOP), Bsc in Mgt (EUSL), DDM (SLIM), NDSM (SLIM), DSBM (SLIM)

නව ලිබරල් රාජ්‍යයක් බවට පරිවර්තනය වීමේදී රටක් ලෙස මුහුණ දී ඇති අර්බුද වලට විකල්පයන් සෙවීමේදි සහයෝගිතා ආර්ථිකය සහ සමුපකාර ව්‍යාපාර පිළිබඳ අදහස හා වැඩපිළිවෙලක අවශ්‍යතාවය වෙන කවරදාටත් වඩා දැනී ඇත. අධික ගෙවුම් ශේෂය, වැඩිවන අයවැය හිඟය, ජාත්‍යන්තර ණය උගුල, ආදායම් විෂමතාව ඉහළ යාම, උද්ධමන අනුපාතය ඉහල යාම, ආහාර හා පෝෂණය පිළිබඳ ගැටලු, වෙළඳපොල අධිකාරීත්වයන් බිහිවීම, ශ්‍රමය ඉතා අඩු මුදලකට සූරාකෑම ඇතුලු දුෂ්කරතා රාශියක් සාමාන්‍ය ජනතාවට මුහුණ දීමට සිදුව ඇත. එමෙන්ම විවිධ කප්පාදු පියවර නිසා මූල්‍ය අර්බුදයන් වල ඍජු වින්දිතයන් බවට කම්කරු පන්තියේ ජනතාව පත්ව ඇත. පාරිසරික අර්බුදය භයානකය. පොදු සම්පත් (ස්වාභාවික සම්පත් - ඉඩම්, ජලය, ඛනිජ ලවණ, ජෛව විවිධත්වය උදුරා ගැනීම) සහ රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම විකල්පයන් ලෙස ඇති එකම පියවරයන් බවට ඉදිරිපත් කොට ඇත. එමෙන්ම තිරසාර නොවන සම්පත් භාවිතය, ධනේශ්වර ආර්ථික ක්‍රියාකාරිත්වය, පුද්ගල අත්පත් කරගැනීම් වලට ප්‍රමුඛ වන දේශපාලන හා ආර්ථික තීරණයන් තේරුම් ගැනීමට හැකි වන පිරිසක් බවට අප පත්විය යුතුය. දේශපාලන මෙන්ම ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය සහිත සමාජ හා අර්ථ ක්‍රමයක් පිළිබඳ බලාපොරොත්තු ඇති කර ගත යුතුව ඇත.

**සහයෝගීතා ආර්ථිකය පිළිබඳ අදහස**

සහයෝගිතා ආර්ථික ව්‍යාපාරය (SEM- Solidarity Economy Movement) යනු ධනේශ්වර ආර්ථිකයේ සහ සමාජයේ අර්බුදය විසඳීමට උත්සාහ කරන සමාජ පරිවර්තන ව්‍යාපාරයකි. බිම් මට්ටමේ ව්‍යාපාරයක් ලෙස SEM සමාජ පරිවර්තනය සඳහා පදනම ලෙස සහයෝගීතා සබඳතා ගොඩනැගීමට උත්සාහ කරයි. එය බිම් මට්ටමේ සංවිධාන සහ ක්‍රියාකාරීත්වය මත පදනම් වේ. "සහයෝගීතාවය මත පදනම් වූ ආර්ථිකය ප්‍රධාන වශයෙන් සමුපකාර, අන්‍යෝන්‍ය සහ ලාභ නොලබන සමාජ ව්‍යවසායන්ගෙන් සමන්විත වූවක් ලෙස අපි තේරුම් ගනිමු. සහයෝගීතා ආර්ථිකයක් තුළ ජනතාවගේ අවශ්‍යතා මත පදනම්ව සහ ශක්තිමත් ප්‍රාදේශීය සහ ප්‍රජාව සමඟ සාමූහිකව සහ ප්‍රජාතන්ත්‍රවාදීව කළමනාකරණය කරනු ලබන, ජනතාව පදනම් කරගත් ව්‍යවසායන් ලෙස මූලයන් ගොඩනගන, නව විකල්ප ආර්ථික ආකෘතීන් විසින් වර්ධනය කරන ලද බොහෝ සංකල්පීය අදහස් සහිත ශක්තිමත් සම්බන්ධයක් අපට හමුවනු ඇත. එවිට සමානාත්මතාවය, සාධාරණත්වය මෙන්ම දිගුකාලීන දැක්මක් සහ ප්‍රජාව කෙරෙහි දැඩි සැලකිල්ලක් දක්වන ජනතාවගේ බලය සහිත ශක්තිමත් පදනමක් ගොඩනැගිය හැකි වනු ඇත

**සහයෝගීතා අර්ථ ක්‍රමය**

ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කොට ඇති සහයෝගීතා අර්ථ ක්‍රමය ඉහත කෘතිය සිංහල භාෂාවෙන් සහයෝගීතා අර්ථ ක්‍රම හා සමුපකාරය පිළිබඳ මුලික අදහස ගොඩනැගීම සඳහා පල වී ඇති මුල්ම කෘතියයි. ඉතා සරල තේරුම් ගැනීමක් උදෙසාත්, මෙහි ඇති ගැඹුරු දාර්ශනික පදනමට මෙන්ම දේශපාලනික අවශ්‍යතාවයට හානියක් නොවීමටත්, මෙය පරිශීලනය කරන සමූකාර නායකයින්ට, ක්‍රියාකාරීන්ට මෙන්ම විද්‍යාර්ථයින්ට පහසුවෙන් විෂය කරුණු තේරුම් කර දීමට උත්සහා කර ඇත. පරිච්ඡේද 08 ක් හරහා මුලික සිද්ධාන්තමය

කරුණු ඔස්සේ සහයෝගීතා අර්ථ ක්‍රමය හා සමුපකාර ක්‍රියාකාරිත්වය අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාවය පෙන්වා දී ඇත. සහයෝගීතා ආර්ථික ව්‍යාපාරයේ මූලික වටිනාකම් සහ මූලධර්ම මත සමාජ සහයෝගීතාවයක් සහ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයක් කරා පරිවර්තනය කිරීම තේරුම් ගැනීමට මෙම කෘතිය තුලින් හැකිය. පහත සඳහන් සමාජ ප්‍රතිලාභයන් ඇති කර ගැනීමට බලාපොරොත්තු ඇති කර ගැනීම සඳහා ඉතාලිය, ස්පාඤ්ඤය, යුගොස්ලාවියාව, ඉක්වදෝරය වැනි රටවල භාවිතාවන් මෙන්ම 1949 සිට 1969 දක්වා ලංකාවේ පාලුගම ඒකාබද්ධ සමුපකාර ව්‍යාපාරයේ අත්දැකීම් එකතු කොට ඇත.

1. ජීවිතය පවත්වා ගැනීම සඳහා සාමූහික ස්වයං සංවිධානය වීම
2. ආර්ථික සහ සමාජ ව්‍යවසායන්හි ප්‍රජාතන්ත්‍රවාදී සම්බන්ධීකරණය
3. ස්වයං කළමනාකරණ ව්‍යවසාය ගොඩනැගීම
4. කම්කරු සහ සාමූහික අයිතිය ආරක්ෂා කිරීම
5. සහභාගීත්ව සිවිල් සහ සමාජ පාලන ක්‍රියා
6. ඉදිරිය සඳහා අවශ්‍ය අධ්‍යාපනය සහ ඉගෙනීම
7. මානව අවශ්‍යතා සහ පරිසරය කේන්ද්‍ර කරගත් සමාජ පරිවර්තනය
8. රාජ්‍ය නියාමනයේ අනුග්‍රාහක, ආකල්ප හා මගපෙන්වීම්

ජනතාවට ගැඹුරු ලෙසම නිර්මාණශීලි හා ආර්ථික ගැටලුවලට තමන්ගේම විසඳුමක් සකස් කර ගැනීමේ හැකියාව ඇති බවත්, මෙම විසඳුම් විවිධ ස්ථානවල හා සමාජ සන්දර්භවල විවිධ වන බවත්, හරයාත්මක ලෙස විශ්වාස කරන සහයෝගීතා අර්ථ ක්‍රම සංකල්පය යනු පවතින හා පැන නගින විකල්පයන් ඉස්මතු කරගෙන අන්‍යෝන්‍ය සහායෙන් සම්බන්ධ කිරීමට හැකියාව ඇති ප්‍රවේශ ක්‍රමයකි. මෙහි කේන්ද්‍රිය අදහස සරලයː විකල්පයන් සෑම තැනකම ඇත. අපගේ කාර්යය වන්නේ ඒවා හඳුනාගෙන, වෙනත් අර්ථ ක්‍රමයක් සඳහා ගැලපෙන ශක්තිමත් සමාජ ව්‍යාපාරයක් ඇති කිරීමට අන්තර්ග්‍රහණය කිරීමය. එනිසා මෙම සංකල්පය ආර්ථික සංවිධානයක ආදර්ශයකට වඩා ආර්ථික සංවිධානයක් ගොඩනැගීමේ ක්‍රියාවලියක් ලෙස සැලකිය හැක.

මේ අනුව උපාළි හේරත් විසින් රචිත මෙම කෘතිය සමුපකාර ව්‍යාපාරය පිළිබඳ සම්ප්‍රදායික දැක්මට නූතන සමාජීය චලන මුසුකරමින් සමුපකාර ව්‍යාපාරයේ කාර්යය භාරය නව මානයකින් හඳුනා ගැනීමට උත්සාහ කිරීමක් බව පැහැදිලිය.